# 5. ආර්ථික හා සමාජ පොදු කාර්ය පිරිවැය

## 5.1 සමස්ත නිරීක්ෂණ

දියුණු යටිතල පහසුකම් පද්ධතියක් නොමැතිවීම, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රසාරණය සීමා කිරීමටත්, දේශීය භාණ්ඩවල විදේශීය තරඟකාරිත්වයට බාධා පැමිණවීමටත් හේතු වී ඇති බව පෙන්වා දී ඇත. 1983 සිට උතුරු-නැගෙනහිර ප්‍රදේශවල හමුදා ගැටුම් උත්සන්නවීම නිසා සිදුවූ සම්පත් සීමාකම් හේතුකොටගෙන, ප්‍රධාන ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම බොහෝදුරට අඩු කෙරිණි. යටිතල පහසුකම් සංවර්ධනයෙහි රාජ්‍ය ආයෝජන ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් 1985 දී සියයට 13 සිට 1997 දී සියයට 5 ක් පමණ දක්වා අඩුවූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් යටිතල පහසුකම් පදනමෙහි ප්‍රමාණාත්මක සහ ගුණාත්මකභාවය තියුණු ලෙස පිරිහිණි. රාජ්‍ය ආයෝජන තවදුරටත් අඩුවුවහොත් ඉදිරි වර්ෂ කිහිපය තුළදී සියයට 5 කට වැඩි ආර්ථික වර්ධන වේගයක් ළඟාකර ගැනීම සඳහා සමස්ත ආයෝජන අනුපාතිකය ප්‍රමාණවත් පරිදි වර්ධනය නොවන හෙයින්, අනාගත ආර්ථික වර්ධන අපේක්ෂාවන් කෙරෙහි එය අහිතකර ලෙස බලපෑ හැකිය. කෙසේවෙතත්, මෙම ප්‍රවනතාවයෙහි යම් වෙනසක් 1998 දී දක්නට ලැබුණි. රාජ්‍ය ආදයමෙහි අඩුවීමක් සහ ආරක්ෂක වියදම්වල වැඩිවීමක් සිදුව තිබියදීත්, රජයේ ප්‍රාග්ධන වියදම් 1998 අයවැය වාර්තාවේ සැලසුම්කොට තිබූ පරිදිම පවත්වා ගැනීමට රජය විසින් උත්සාහ ගන්නා ලදී. මේ අනුව, 1997 වර්ෂය සමග සැසඳීමේදී, 1998 වර්ෂයේ රාජ්‍ය ආයෝජන සැලකියයුතු වැඩිවීමක් සනිටුහන් කරමින්, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 5.9 දක්වා වර්ධනය විය. 1999 දී, රාජ්‍ය ආයෝජන ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 7.5 ක් දක්වා තවදුරටත් වැඩි කිරීමට සැලසුම්කර ඇත. කෙසේ වෙතත්, දනට පවත්නා යටිතල පහසුකම්වල නොදියුණු ස්වභාවයත්, අනාගත ආර්ථික අවශ්‍යතාත් සැලකිල්ලට ගත්විට යටිතල පහසුකම්වල වර්තමාන ආයෝජන ප්‍රමාණය, අවශ්‍ය කරන ආයෝජන ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පවතී. එහෙයින්, පැහැදිලි මධ්‍යකාලීන ප්‍රතිපත්ති රාමුවක් සහ මනාව නිර්මාණය කරන ලද නියාමන ක්‍රමයක් තුළ ආර්ථික යටිතල පහසුකම් සැපයීමෙහිලා පෞද්ගලික අංශයේ සහභාගිත්වය තවදුරටත් දිරිගැන්විය යුතුව ඇත.

1998 වර්ෂයේදී රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයම ප්‍රධාන යටිතල පහසුකම්වල සැලකියයුතු ආයෝජනයක් සිදුකරන ලදී. ජාත්‍යන්තර ආර්ථික වාතාවරණය අයහපත් තත්ත්වයක තිබියදීත්, විදුලිබලය, විදුලිසංදේශ සහ වරාය යන අංශවල පෞද්ගලික අංශයේ සහභාගිත්වය, 1998 වර්ෂයේදී තවදුරටත් වර්ධනය විය. ඒසියා පවර් (පෞද්ගලික) සමාගම විසින් රුපියල් දශ ලක්ෂ 62 ක පිරිවැයකින් මෙ.වො.51 ක තාප විදුලි බලාගාරයක් ඉදි කිරිමත් සමඟ තාපබල උත්පාදන ධාරිතාවය ඉහළ ගියේය. මීට අමතරව, වර්ෂය තුළදී, මෙ.වො.160 ක ධාරිතාවයෙන් යුත් ඒකාබද්ධ චක්‍රීය තාප විදුලි බලාගාරයක් ඉදිකිරීම සහ මෙ.වො.60 ක ධාරිතාවයෙන් යුත් බත්තල් මත තාප බලාගාරයක් ඉදිකිරීම හා සම්බන්ධ සාකච්ඡා අවසන් කරන ලදී. මෙම ව්‍යාපෘති දෙක පිළිවෙලින් ඉදිකිරීම, හිමිකම තබාගැනීම, ක්‍රියාත්මක කිරීම හා පැවරීම (BOOT) සහ ඉදිකිරීම, හිමිකම තබා ගැනීම හා ක්‍රියාත්මක කිරීම (BOO) යන පදනම යටතේ ඉදිකිරීමට නියමිතය. එමෙන්ම, යාපනය අර්ධද්වීපයේ විදුලිබල සැපයුම නැවත ස්ථාපිත කිරීමේ අරමුණින් (BOO) යන පදනම යටතේ කුල් එයාර් වෙන්චර්ස් පුද්ගලික සමාගම විසින් මෙ.වො.10 ක තාපවිදුලි බලාගාරයක් කන්කසන්තුරෙහි පිහිටුවන ලදී. මීට අමතරව, කුඩා විදුලි බලාගාර ගණනාවක් ඉදිකිරීම හා සම්බන්ධ පෞද්ගලික අංශයේ යෝජනා කිහිපයක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් වර්ෂය තුළදී ඇගයීමට ලක් කරන ලදී. එයාර් ලංකා සමාගමේ කොටස්වලින් සියයට 40 ක් සහ එහි කළමනාකරණය එමිරේට්ස් ගුවන් සමාගමට පැවරීමෙන් පසු එයාර් ලංකා සමාගමේ ක්‍රියාකාරිත්වය සැලකියයුතු පරිදි වැඩිදියුණු වී ඇත. එළිසබෙත් රැජින පාලම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 240 ක පිරිවැයකින් ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම (BOT) යන පදනම යටතේ සංවර්ධනය කිරීම සඳහා වූ මූලික ගිවිසුමක් ශ්‍රී ලංකා රජය සහ සවුත් ඒසියා ගේට්වේ ටර්මිනල් (පුද්ගලික) සමාගම අතර අත්සන් කෙරිණි. පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඉහළයාමත්, ජපානයේ එන්.ටී.ටී.සමාගම යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ (ශ්‍රී ලං.ටෙ.) කළමනාකරණය ප්‍රතිසංවිධානය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලං.ටෙ. හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු වීමත් නිසා, විදුලි සංදේශ අංශය තවදුරටත් වර්ධනය විය.

**5.1 සංඛ්‍යා සටහන**

**යටිතල ව්‍යුහ සඳහා වූ රාජ්‍ය ආයෝජන**

| | ආර්ථික සේවා | | සමාජ සේවා | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| වර්ෂය | රු.ද.ල. | ද.දේ.නි.% | රු.ද.ල. | ද.දේ.නි.% | රු.ද.ල. | ද.දේ.නි.% |
| 1985 | 18,950 | 11.7 | 1,826 | 1.1 | 20,776 | 12.8 |
| 1990 | 18,798 | 5.8 | 3,019 | 0.9 | 21,817 | 6.7 |
| 1991 | 26,022 | 7.0 | 2,964 | 0.8 | 28,986 | 7.8 |
| 1992 | 20,444 | 4.8 | 6,137 | 1.4 | 26,581 | 6.2 |
| 1993 | 29,600 | 5.9 | 6,075 | 1.2 | 35,675 | 7.1 |
| 1994 | 29,304 | 5.1 | 7,677 | 1.3 | 36,981 | 6.4 |
| 1995 | 36,106 | 5.4 | 9,854 | 1.5 | 45,960 | 6.9 |
| 1996 | 31,409 | 4.1 | 10,322 | 1.3 | 41,731 | 5.4 |
| 1997 | 32,481 | 3.6 | 11,552 | 1.3 | 44,033 | 4.9 |
| 1998 (අ) | 44,677 | 4.4 | 15,258 | 1.5 | 60,205 | 5.9 |

(අ) තාවකාලික

*මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව*

1998 දී විදුලිබලය, විදුලි සංදේශ, මහාමාර්ග සහ වරාය යන අංශවල රාජ්‍ය ආයෝජන පෙර වර්ෂය සමග සැසඳීමේදී සැලකියයුතු පරිදි ප්‍රසාරණය විය. විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදහැරීම හා සම්බන්ධ ආයෝජන සියයට 58 කින් පමණ තියුණු ලෙස වර්ධනය විය. නව තාප බලාගාර පිහිටුවීමත් සමග තාප විදුලිබල උත්පාදන ධාරිතාවය සියයට 4 කින් වර්ධනය වූ අතර, ඒ අනුව ජල විදුලිබලය මත ඇති රැඳියාව සියයට 69 දක්වා

අඩුවිය. විදුලි සංදේශ අංශය එහි ඉල්ලුම් වර්ධනය අභිබවා සීග්‍රයෙන් වර්ධනය වූ අතර, වර්ෂ 2002 වනවිට පොරොත්තු ලේඛණයේ සිටින සියලුම දුරකථන ඉල්ලුම්කරුවන්ට දුරකථන සැපයීමට හැකිවනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. විදුලි සංදේශ අංශයේ රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජන 1998 දී රුපියල් දශ ලක්ෂ 16,162 ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, රැහැන් රහිත සහ ජංගම දුරකථනද ඇතුලත්ව, එක් දුරකථනයක් සඳහා සිටින පුද්ගලයන් සංඛ්‍යාව 1997 දී 41 සිට 1998 දී 27 දක්වා අඩුවිය. ජාතික මහාමාර්ග පද්ධතිය නඩත්තු කිරීමේ ප්‍රයත්නය තවදුරටත් ශක්තිමත් කරමින් 1998 දී ඒ සඳහා රුපියල් දශ ලක්ෂ 5,783 ක් ආයෝජනය කරන ලදී. මෙය පසුගිය වර්ෂයට වඩා සියයට 3 ක වර්ධනයකි. මාතර-කොළඹ අධිවේගී මාර්ගය, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය සහ කොළඹ ප්‍රධාන මහා මාර්ග සම්බන්ධ කරමින් ඉදිකිරීමට නියමිත කොළඹ-පිටත වට මාවත වැනි මහා පරිමාණයේ මහා මාර්ග ව්‍යාපෘතිවල ආරම්භක වැඩකටයුතු 1998 දී අරඹන ලදී. කෙසේ වෙතත්, පලාත් සහ ප්‍රාදේශීය මංමාවත් නඩත්තු කිරීම තවමත් ප්‍රමාණවත් නොවන මට්ටමක පවතී. මගී ප්‍රවාහන අංශයේ ක්‍රියාත්මක ධාරිතාවය වැඩිදියුණු කිරීමට කටයුතු කර තිබුණද, එම අංශයේ වාණිජමය පැවැත්ම තහවුරු කිරීමට අවධානය යොමුකර නොමැති බැවින්, මගී ප්‍රවාහන අංශයේ ප්‍රතිසංවිධාන වලින් අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබී යාමට ඉඩ ඇත. දකුණු ආසියාතු කලාපයේ කේන්ද්‍රීය වරායක් වන කොළඹ වරායේ ඉදිරි ක්‍රියාකාරිත්වයට, මෙම කලාපයේ ඉදිවන නව වරායවලින් තර්ජනයක් එල්ලවී ඇත. කොළඹ වරායේ ධාරිතාවය පුළුල් කිරීමේ සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරගැනීමේ හදිසි අවශ්‍යතාවය මෙයින් මනාව තහවුරු කරනු ලබයි. වාණිජ සහ වෙළෙඳ අංශවල ප්‍රසාරණය වන අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා තැපැල් සේවයේ සීග්‍ර සංවර්ධනයක් ඇතිකිරීමේ අවශ්‍යතාවය මනාව අවබෝධකොටගෙන ඇති අතර, තැපැල් දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීමේ නීති කෙටුම්පත් 1998 වර්ෂයේදී සම්පාදනය කරන ලදී.

සාමාජීය අංශයේ ළඟා කරගෙන ඇති ජයග්‍රහණයන් තිරසාර ලෙස පවත්වාගෙන යාම සඳහා වර්ෂය තුළදී සෞඛ්‍ය සහ අධ්‍යාපන අංශවල අපේක්ෂා සහගත ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය මනාව අවබෝධ කරගෙන ඇති අතර, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරන 1998 දී ආරම්භ කෙරිණි. සෞඛ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ යටතේ, සෞඛ්‍ය සේවා ව්‍යාප්ත කිරීමේ මනා සැලසුමක් සහිතව, සමාජයේ මතුවන නව සෞඛ්‍ය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය අංශයේ ප්‍රමුඛතාවයන් නැවත පෙළගැස්වීමක් කරන ලදී. සෞඛ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ 1998 වර්ෂයේදී ආරම්භ කෙරිණි. මෙම ප්‍රතිසංස්කරණවල සාර්ථකභාවය සඳහා ප්‍රමාණවත් පරිදි සම්පත් වෙන්කිරීමත්, කාලපමාවකින් තොරව නියමිත පරිදි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමත් වැදගත් වන බව සඳහන් කළ යුතුව ඇත. මීට අමතරව, කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරගැනීම සඳහාත්, රාජ්‍ය අයවැය මත ඇති රැඳියාව අඩුකර ගැනීම සඳහාත් මෙම අංශ දෙකෙහිම පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඵලදායී ලෙස ධෛර්යමත් කළ යුතුය. මේ අතර, නිවාස සහ නාගරික සංවර්ධනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිවාස පහසුකම් සැපයීමෙහිලා, පෞද්ගලික අංශය සහභාගි වීමේ ඇති වැදගත්කම අවධාරණය කොට ඇති අතර ඒ සඳහා ප්‍රමාණවත් පරිදි මූල්‍යමය පහසුකම් සහ ඉඩම් සැපයීම සඳහා යෝග්‍ය උපක්‍රම ක්‍රියාත්මක කළයුතු බවද නිර්දේශ කර ඇත. පසුගිය වර්ෂයේදී ද අවධාරණය කළ පරිදි, රජයේ සුබසාධන වැඩසටහන්වල ප්‍රතිලාභ වඩාත් සුදුසු පුද්ගලයන්ට ලැබෙන පරිදි නැවත යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණක් වී ඇත.

## 5.2 සෞඛ්‍ය

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය දර්ශක, සංවර්ධිත රටවල සෞඛ්‍ය දර්ශක සමග සැසඳෙන අතර, ඊට විශේෂයෙන් සෞඛ්‍ය අංශයේ සහ පොදු වශයෙන් අනෙකුත් සුබසාධන කටයුතුවල රජයේ දැවැන්ත ආයෝජනයන් ප්‍රධාන වශයෙන් හේතුවී ඇත. නිදහසෙන් පසු බලයට පත් වූ රජයන් විසින් සෞඛ්‍ය කටයුතු සඳහා ඉහළ මට්ටමක ආයෝජනයක් පවත්වා ගෙන යනු ලැබූ අතර, එය ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 1-2 අතර ප්‍රමාණයක් විය. මෙය ග්‍රාමීය ප්‍රදේශවල පවා සෞඛ්‍ය පහසුකම් වර්ධනය වීමට හේතුවී ඇත. දුගී බව තුරන් කිරීම සඳහා රජය නොකඩවා මැදිහත්වීමේ වැඩපිළිවෙලද, ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කිරීමට දායක වී ඇත. එසේ වුවත්, සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි මෙම ජයග්‍රහනයන් තිරසාර ලෙස පවත්වාගෙන යාම සඳහා, ජීවන රටාව වෙනස්වීම්, ප්‍රජා විද්‍යාත්මක වෙනස්වීම්, දූෂිත පාරිසරික තත්ත්වයන් නිසා මතුවන්නා වූ සෞඛ්‍ය උපද්‍රව සහ වත්මන් සෞඛ්‍ය පහසුකම් බෙද හැරීමේ ක්‍රමයන්හි ඇති දුර්වලතා යනාදිය මගින් තර්ජනයක් එල්ල වී ඇත. දනට පවත්නා හමුදමය මෙහෙයුම් නිසා විශාල පුද්ගලයින් සංඛ්‍යාවක් අනතුරට පත් වීමද මෙම තත්ත්වය තවදුරටත් අයහපත් වීමට හේතු වී ඇත. මානසික රෝග, හදිසි අනතුරු, වස පානය කිරීම සහ සියදිවි හානිකර ගැනීම්වලද සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබේ. මේ අතර, ඉදිරි දශක දෙක තුළදී වයස්ගත වූවන් හා සම්බන්ධ සෞඛ්‍ය ගැටළු ඉතා ප්‍රබල සෞඛ්‍ය ප්‍රශ්න බවට පත්වනු ඇත. විවිධ ජනගහන පුරෝකථනවලට අනුව, වයස අවුරුදු 60 ඉක්මවූ පුද්ගලයන් සංඛ්‍යාව මුළු ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් 1995 දී සියයට 9.1 සිට 2030 වනවිට සියයට 21.5 දක්වා ක්‍රමයෙන් වැඩිවනු ඇත. වයස්ගතවූවන්ගේ මෙම වැඩිවීම විශේෂයෙන්ම, හෘදරෝග, ස්නායු ආබාධ, පිළිකා සහ රක්තවාත රෝග සහ වයස්ගතවූවන් අතර බහුල වෙනත් කායික සහ මානසික රෝග හා සම්බන්ධ සෞඛ්‍ය සේවා සඳහා ඉල්ලුම වැඩිවනු ඇත. මේ අනුව, සෞඛ්‍ය සේවා ව්‍යාප්ත කිරීම සඳහා යෝග්‍ය උපක්‍රමද සහිතව, සෞඛ්‍ය අංශයේ ප්‍රමුඛතා ප්‍රතිසැලසුම් කිරීම හදිසි අවශ්‍යතාවයක්ව පවතී. රජය මෙම අවශ්‍යතාවය මනාව අවබෝධකොටගෙන ඇති අතර, 1997 දී සෞඛ්‍ය අංශය සඳහා පත්කරනු ලැබූ ජනාධිපති කාර්යසාධක බලකාය විසින්, සෞඛ්‍ය අංශයේ

පවත්නා ගැටළු විසඳීම සම්බන්ධයෙන් විශේෂිත නිර්දේශ ඉදිරිපත් කර ඇත.

ජනාධිපති කාර්යසාධක බලකාය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය සඳහා සෞඛ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් 1998 ජනවාරි මාසයේදී පිහිටුවන ලදී. සෞඛ්‍ය ප්‍රතිපත්තියේ මුඛ්‍ය පරමාර්ථය වන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සහ ජීවිත අපේක්ෂාව ඉහළ නැංවීම මත පදනම්ව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වහා අවධානය යොමුවිය යුතු අංශ වශයෙන්, සෞඛ්‍ය සේවා සැපයීමේ විෂමතාවයන්, වයස්ගතවූවන්ගේ සහ ආබාධිතයින්ගේ ගැටළු, බෝ නොවන රෝග වර්ධනයවීම, හදිසි අනතුරු, සියදිවි හානිකර ගැනීම් සහ මත්ද්‍රව්‍ය භාවිතය යන සෞඛ්‍ය ගැටළු රජය විසින් හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන්, ජනාධිපති කාර්යසාධක බලකාය විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශවලින් වහාම ක්‍රියාත්මක කිරීම සඳහා මූලික අංශ 5 ක් තෝරාගෙන ඇත. සෑම දිස්ත්‍රික්කයකම අඩුම වශයෙන් එක් රෝහලක් සංවර්ධනය කිරීම, විශේෂ අවශ්‍යතා සඳහා (වයස්ගත වූවන්, ආබාධිතයන්, මානසික සෞඛ්‍ය, වැවිලි අංශයේ සෞඛ්‍ය ආදිය) සෞඛ්‍ය සේවා පුළුල් කිරීම, පාසැල් සෞඛ්‍ය වැඩසටහන් නැවත නඟා සිටුවීම අවධාරණය කරමින් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය අංශයේ සංවිධාන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම, සම්පත් සංචලනය හා රාජ්‍ය සහ පෞද්ගලික අංශය අතර සම්පත් බෙදාහැරීම, විකල්ප මූල්‍යකරණ ක්‍රියාමාර්ග හා මානව සම්පත් සංවර්ධන ඇතුලත්ව කළමනාකරණය වැඩිදියුණු කිරීම ඊට ඇතුලත්වේ.

1998 දී සෞඛ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ඒකකය මගින් මහජනයාගේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් ඉටුකිරීම සඳහා මූලික පියවර කීපයක් ගන්නා ලදී. දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම, වයස්ගත පුද්ගලයින්, ආබාධිත පුද්ගලයින් සහ යුද්ධය නිසා පීඩාවට පත්වූවන් සඳහා ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම, මානසික රෝහල ශික්ෂණ රෝහලක් ලෙස වැඩිදියුණු කිරීම, මානසික සෞඛ්‍ය පහසුකම් විමධ්‍යගත කිරීම මේ අතර කැපී පෙනේ. අවම වශයෙන් එක් දිස්ත්‍රික්කයකට අංග සම්පූර්ණ එක් රෝහලක් හෝ පිහිටුවීමේ වැඩපිළිවෙල යටතේ පොළොන්නරුව රෝහල වැඩිදියුණු කිරීම දැනටමත් ආරම්භ කර ඇත. දන්ත වෛද්‍ය සේවාව ශක්තිමත් කිරීම සඳහා විවිධ ප්‍රදේශවල දන්ත සායන 40 ක් පමණ ආරම්භ කරන ලදී. එමෙන්ම ජනාධිපති කාර්යසාධක බලකායේ නිර්දේශවලට අනුව, වතු රෝහල් 50 ක් රජයේ පාලනය යටතට ගැනීම සඳහා හඳුනාගෙන ඇති අතර ඉන් 2 ක් දැනටමත් රජයේ පාලනය යටතට ගෙන ඇත. ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වේච්ඡා සේවකයින් 15,000 ක් පුහුණු කිරීමේ වැඩපිළිවෙලක්ද ආරම්භ කර ඇත. සෞඛ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා, පුළුල් නිර්දේශ පැහැදිලිව නිර්වචනය කරන ලද අනු-කොටස්වලට විභේදනය කළයුතු අතර, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් පුද්ගලයන්ට, කමිටුවලට හෝ ආයතනවලට ඒ සඳහා නිශ්චිත කාලසීමාවන්ද සහිතව කාර්යයන් පැවරිය යුතුය. විශේෂයෙන්ම කෙටිකාලයේදී විසඳුම් සැපයිය හැකි ගැටළු, දිගුකාලීන විසඳුම් අවශ්‍ය කෙරෙන ගැටළුවලින් වෙන්කර ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එක් එක් කාර්යයන් සඳහා වියදම් ඇස්තමේන්තු සහ අරමුදල් සැපයෙන මූලාශ්‍ර හඳුනා ගැනීමද වැදගත් වනු ඇත.

1998 දී පේරාදෙණියේ නව දන්ත වෛද්‍ය ශික්ෂණ රෝහලක් ආරම්භ කිරීම සහ වතු රෝහල් 2 ක් රජයට පවරා ගැනීමත් සමග රජයේ බටහිර වෛද්‍ය රෝහල් ගණන 550 දක්වා වර්ධනය විය. ජනගහනයෙන් 1,000 කට ඇති රෝහල් ඇඳන් ගණන 1997 දී 2.8 සිට 1998 දී 2.9 දක්වා ඉහළ ගොස් ඇත. මීට අමතරව, 1998 අවසානය වනවිට මධ්‍යම බෙහෙත් ශාලා 389 ක් විය. 1998 වර්ෂය අවසානයට සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි සේවා නියුක්තිය 69,369 ක්වූ අතර, ඉන් 5,104 දෙනෙකු බඳවා ගනු ලැබ ඇත්තේ 1998 වර්ෂය තුළදීය. සහකාර වෛද්‍ය නිලධාරීන්, ආධුනික වෛද්‍යවරු ඇතුළුව රාජ්‍ය අංශයේ වෛද්‍යවරුන්ගේ මුළු සංඛ්‍යාව 1998 වර්ෂය අවසන් වන විට 6,981 ක් විය. මේ අනුව ජනගහනයෙන් 10,000 කට සිටින වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 1997 දී 3.4 සිට 1998 දී 3.7 දක්වා වර්ධනය වී ඇත. මේ අතර සාත්තු සේවක සංඛ්‍යාව නිරපේක්ෂ වශයෙන් වර්ධනය වී පැවැතියද, පුද්ගලයින් 10,000 කට සිටින සාත්තු සේවකයින් සංඛ්‍යාව 1997 දී 7.8 සිට 1998 දී 7.7 දක්වා අඩුවිය. සාත්තු සේවක පිරිස ප්‍රමාණවත් නොවීම රෝහල්වල මනා සේවා තත්ත්වයක් පවත්වාගෙන යාම සඳහා වසර ගණනාවක් මුළුල්ලේම අහිතකර ලෙස බලපෑ සාධකයක් විය. පෞද්ගලික අංශයෙහි සෞඛ්‍ය සේවාවටද, සාත්තු සේවක හිඟය දැඩි ලෙස බලපා ඇත. මෙම තත්ත්වයට මුහුණදීම සඳහා රජය විසින් පුද්ගලයින් 1,553 ක් සාත්තු සේවකයින් වශයෙන් පුහුණු කිරීම සඳහා 1998 දී බඳවා ගන්නා ලදී. මේ අතරතුර, 1997 දී ශ්‍රී ජයවර්ධනපුර රෝහලට අනුබද්ධව සාත්තු සේවකයින් පුහුණු කිරීමේ පාසැලක්ද ආරම්භ කරන ලදී. රජයේ හා පෞද්ගලික රෝහල්වල පුහුණු අනුපූරක වෛද්‍ය නිලධාරි හිඟයද රෝහල් වල මනා සෞඛ්‍ය සේවාවක් පවත්වා ගැනීමට බාධාවක් වී ඇත. 1998 වර්ෂය තුළදී රජයේ රෝහල් සඳහා අනුපූරක වෛද්‍ය නිලධාරීන් බඳවා ගෙන ඇත්තේ 42 ක් පමණි. එසේ වුවද, වසර තුළදී පුද්ගලයින් 1,100 ක් පමණ පුහුණු කිරීම් සඳහා බඳවා ගන්නා ලදී. විශේෂයෙන්ම සාත්තු සේවකයින්, අනුපූරක වෛද්‍ය නිලධාරීන්, තාක්ෂණ නිලධාරීන් සඳහා ඇති ඉල්ලුම ඉහළ යන හෙයින් සෞඛ්‍ය සේවකයින් පුහුණු කිරීමේ දිගුකාලීන සැලැස්මක් සම්පාදනය කිරීම අවශ්‍යව ඇත.

ප්‍රාථමික සෞඛ්‍ය සේවා කටයුතු, විශේෂයෙන්ම ඉතා දුෂ්කර ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීමේ ප්‍රයත්නය වර්ෂය පුරාම අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. "සුව උදන" සෞඛ්‍ය සේවා වැඩසටහන වර්ෂය තුළදී ප්‍රදේශ 10 ක පැවැත් වූ අතර එම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වූයේ අවම සෞඛ්‍ය පහසුකම් ඇති ප්‍රදේශවල රෝග නිවාරණය හා රෝග සුව කිරීමේ වැඩ මුළු පැවැත්වීමය. පෝලියෝ රෝගය මුලිනුපුටා දැමීමේ ජාතික රෝග නිවාරණ දිනය

සාර්ථක ලෙස සිවුවන වරටත් පවත්වන ලදී. එන්නත් ලබාදීම මගින් වළක්වාගත හැකි රෝග හයක් සඳහා එන්නත් ළදරුවන්ගෙන් සියයට 90 කට පමණ ලබාදීම මගින් ශ්‍රී ලංකාව මේ සම්බන්ධ ජාත්‍යන්තර ඉලක්ක කරා ළඟා වී ඇත. මේ අතර ඩෙංගු උණ රෝගය වර්ධනය වීමක් පෙන්නුම් කළේය. 1998 වර්ෂය තුළදී නිශ්චිත වශයෙන් හඳුනාගන්නා ලද ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 227 ක් වූ අතර, 1997 දී එම රෝගීන් සංඛ්‍යාව 193 ක් විය. ඩෙංගු මර්ධන හා ආරක්ෂණ සතිය ලෙස 1998 ජූනි මස 22-29 දක්වා වූ සතිය ප්‍රකාශ කරන ලදී. 1997 දී පැතිරුණු කොළරා රෝගය 1998 දීද දක්නට ලැබුණි. 1998 දී කොළරා රෝගය ආරම්භ වූයේ පුත්තලම් දිස්ත්‍රික්කයෙන් වූ අතර බොහෝ කොළරා රෝගීන් වාර්තා වූයේ පුත්තලම, කුරුණෑගල, මොණරාගල සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වලිනි. කොළරාව පැතිර යෑමේ ප්‍රධාන සාධක වූයේ පිරිසිදු පානීය ජලය හිඟවීම, වැසිකිළි පහසුකම් නොමැතිවීම, පෞද්ගලික සෞඛ්‍ය තත්ත්වය පහත් මට්ටමක පැවතීම ආදිය වේ. 1998 දී ජැපනීස් එන්සපලයිටීස් රෝග ව්‍යාප්තියෙහි සැලකිය යුතු වෙනසක දක්නට නොවීය. කෙසේ වුවද වයස අවුරුදු 1-10 දක්වා දරුවන්ට එන්නත් ලබාදීම මගින් රෝග මර්ධනය කිරීමේ කටයුතු වසර පුරාම නොකඩවා සිදු කෙරුණි. මැලේරියා මර්ධන කටයුතු අඛණ්ඩව සිදු කෙරුණද, රෝග ව්‍යාප්තිය තවදුරටත් ඉහළ මට්ටමක පවතී. කෙසේ වුවද, 1998 දී වාර්තා වූ මැලේරියා රෝගීන් සංඛ්‍යාව 211,691 දක්වා ආන්තික වශයෙන් අඩුවිය.

1998 දී සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වූ රජයේ වියදම

**5.2 සංඛ්‍යා සටහන**
**රජයේ සෞඛ්‍ය සේවය**

| ශීර්ෂය | 1996 | 1997 | 1998(අ) |
|---|---|---|---|
| 1. ආරෝග්‍යශාලා (බටහිර වෛද්‍ය සේවය) | 540 | 547 | 550 |
| 2. ඇඳන් සංඛ්‍යාව | 52,613 | 52,635 | 53,737 |
| 3. මධ්‍යම බෙහෙත් ශාලා සංඛ්‍යාව | 377 | 371 | 389 |
| 4. මුළු වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 4,391 | 4,956 | 5,611 |
| 5. මුළු සහකාර වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 1,464 | 1,380 | 1,370 |
| 6. මුළු ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 14,808 | 15,078 | 15,359 |
| 7. මුළු හෙද සේවක සංඛ්‍යාව | 13,846 | 14,399 | 14,463 |
| 8. මුළු උපස්ථායක සංඛ්‍යාව | 5,758 | 6,650 | 6,717 |
| 9. අභ්‍යන්තර රෝගීන් සංඛ්‍යාව ('000) | 3,339 | 3,453 | ලැ.නො. |
| 10. බාහිර රෝගීන් සංඛ්‍යාව ('000) | 35,348 | 39,503 | ලැ.නො. |
| 11. මුළු සෞඛ්‍ය වියදම (රු.දශලක්ෂ) | 11,913 | 12,135 | 14,419 |
| i ජංගම වියදම (රු.දශලක්ෂ) | 9,260 | 9,581 | 10,089 |
| ii ප්‍රාග්ධන වියදම (රු.දශලක්ෂ) | 2,653 | 2,554 | 4,330 |

(අ) තාවකාලික

මූලයන් : සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් දශලක්ෂ 14,419 ක් විය. එය පසුගිය වසරට වඩා සියයට 18 වර්ධනයක් පෙන්නුම් කරයි. ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් සෞඛ්‍ය වියදම 1997 දී සියයට 1.3 සිට 1998 දී සියයට 1.4 දක්වා වැඩිවිය. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රජයේ ප්‍රාග්ධන වියදම් රුපියල් දශ ලක්ෂ 4,330 දක්වා සියයට 70 කින් පමන වැඩිවිය. ශ්‍රී ජයවර්ධනපුර රෝහලට අනුබද්ධව රුපියල් දශ ලක්ෂ 723 ක පිරිවැයකින් ඉදිකරනු ලබන සාත්තු සේවකයන් පුහුණු කිරීමේ ආයතනයෙහි වැඩකටයුතු 1998 වර්ෂයේදීද අඛණ්ඩව සිදුවිය. මෙහි ඉදිකිරීම් කටයුතු 1999 වර්ෂයේ මැද භාගය වනවිට නිම කිරීමට නියමිතව ඇත. එමෙන්ම සාත්තු සේවක පුහුණුව සඳහා සිසුන් 100 ක කණ්ඩායමක්ද එම වසරේදීම ඇතුලත් කරගැනීමට බලාපොරොත්තු වේ. චීන ආධාර යටතේ, ළමා ආරෝග්‍ය ශාලාව සඳහා ඇඳන් 390 ක් සහිත මහල් 10 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිවෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කර ඇති වියදම රුපියල් දශ ලක්ෂ 320 ක් වන අතර, ගොඩනැගීමේ කටයුතු 1999 අගෝස්තු මාසය වනවිට නිම කිරීමට නියමිතය. කොරියන් මුදල් ආධාර යටතේ රුපියල් දශ ලක්ෂ 225 ක පිරිවැයකින් ගම්පහ සහ මීගමුව මූලික රෝහල්වල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පියවර ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ 1998 දී රුපියල් 300 ක වටිනාකමින් යුත් වෛද්‍ය උපකරණ ප්‍රාදේශීය රෝහල්වලට ලබාදීමටද කටයුතු කර ඇත. ප්‍රංශ රජය විසින් රුපියල් දශ ලක්ෂ 170 ක සහනදායී ණය මුදලක් මහනුවර ශික්ෂණ රෝහලෙහි හෘද රෝගී ඒකකය වැඩිදියුණු කිරීම සඳහා ලබාදී ඇත. ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ මූල්‍ය ආධාර සහිතව 1997 දී ආරම්භ කරන ලද සෞඛ්‍ය සේවා ව්‍යාපෘතියෙහි වැඩකටයුතු අඛණ්ඩව සිදු කෙරිණි. මෙම ව්‍යාපෘතිය යටතේ විශාල මුදල් ප්‍රමාණයක් වෙන්කර ඇත්තේ මැලේරියා රෝගය මුළුනුපුටා දැමීම (රුපියල් දශ ලක්ෂ 252), ඒඩ්ස් මර්ධනය (රුපියල් දශ ලක්ෂ 603), පෝෂණ කටයුතු (රුපියල් දශ ලක්ෂ 200), බෝ නොවන රෝග නිවාරණය (රුපියල් දශ ලක්ෂ 31) සහ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු (රුපියල් දශ ලක්ෂ 174) වෙනුවෙනි. මෙම ව්‍යාපෘතිය සඳහා වන මුළු වියදම රුපියල් දශ ලක්ෂ 1,490 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයා ඇති සෞඛ්‍ය සහ ජනගහන ව්‍යාපෘතිය යටතේ උතුරු මැද, වයඹ සහ මධ්‍යම පළාත්වල සහ කළුතර දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවා සැපයීමේ කටයුතු වැඩිදියුණු කිරීම් නිමවෙමින් පවතී. සෞඛ්‍ය අංශයේ විදේශ ආධාර ලබාගෙන ඇති බොහෝ ව්‍යාපෘති සෞඛ්‍ය අංශයේ යෝජිත ප්‍රතිසංස්කරණ යටතේ හඳුනාගෙන ඇති කාර්යයන් වේ. එමනිසා, විදේශ සම්පත් නියමිත පරිදි හා කාර්යක්ෂමව උපයෝජනය කරගැනීම සෞඛ්‍ය ප්‍රතිසංස්කරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

## පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා කටයුතු

පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා ප්‍රධාන වශයෙන් පෞද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ පෞද්ගලික වෛද්‍ය සේවා යන අංශ වලින් සමන්විත වේ. අඛණ්ඩව වර්ධනය වන ඉල්ලුම සපුරාලීමට සහ ගුණාත්මක භාවයෙන් උසස්


සෞඛ්‍ය සේවා මහජනතාවට කඩිනමින් ලබා දීමට ඇති හැකියාව වර්ධනය කිරීමේ මාර්ගයක් වශයෙන් පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවාව, රජයේ නිදහස් සෞඛ්‍ය සේවාවට සමාන්තරව දියුණු කිරීමේ වැදගත්කම රජය අවබෝධ කරගෙන ඇත. මේ අනුව, වෛද්‍ය උපකරණ ආනයනය තීරු බද්දෙන් නිදහස් කිරීම, ආයෝජන ආදායම් සඳහා බදු සහන ලබාදීම සහ ඉදිකිරීම් සඳහා ඉඩම් ලබාදීම වැනි බොහෝ දිරිගැන්වීම් ලබා දෙමින්, රජය විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි පෞද්ගලික ආයෝජන ධෛර්‍යමත් කරනු ලැබිණි. එමෙන්ම, ආයෝජන මණ්ඩලයේ අනුමතිය ලද සියළුම පෞද්ගලික රෝහල් ව්‍යාපෘතිවලට, ආයෝජන මණ්ඩල සහන හිමිවේ. තවද, සෞඛ්‍ය සේවා සැපයීමේදී රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සමග ඒකාබද්ධ වීමේ ඇති වැදගත්කමද යෝජිත සෞඛ්‍ය ප්‍රතිසංස්කරණවල අවධාරණය කොට ඇත. මේ අතර ඉන්දියාවේ ඇපලෝ රෝහල් සමාගමේ හිමිකරුවන් වන ඉන්දියානු රෝහල් සංස්ථාව විසින් රුපියල් දශ ලක්ෂ 2,000 ක වියදමින් නවීන රෝහලක් ශ්‍රී ලංකාවේ ඉදි කිරීමට තීරණය කර තිබීම, 1998 වර්ෂය තුළදී මෙම ක්ෂේත්‍රයෙහි දක්නට ලැබුණු වැදගත් සිදුවීමකි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූලාශ්‍රවලට අනුව ශ්‍රී ලංකාව තුළ දනට ඇඳන් 2,500 ක පමණ ධාරිතාවයෙන් යුත් පෞද්ගලික රෝහල් 120 ක් පමණ ක්‍රියාත්මක වේ. පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා වල ව්‍යාප්තිය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ තක්සේරු කිරීමේදී මුහුණදීමට සිදුවී ඇති ප්‍රධාන ගැටළුවක් වන්නේ ඒ පිළිබඳ තොරතුරු හිඟකමයි. 1998 දීද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෞද්ගලික රෝහල්වල ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා තෝරා ගත් පෞද්ගලික රෝහල් 70 ක් ආවරණය වන පරිදි තැපැල් මාර්ගික සමීක්ෂණයක් පවත්වන ලදී. කොළඹ නගරයේ පිහිටි ප්‍රධාන රෝහල්ද ඇතුළුව, රෝහල් 36 ක් ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දක්වා තිබුණි. 1998 වර්ෂයේදී මෙම රෝහල්වල ඇඳන් සංඛ්‍යාව, 1,600 දක්වා ඉතා සුළු වැඩිවීමක් පෙන්නුම් කළේය. 1998 දී, නේවාසික හා බාහිර රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් 72,616 ක් සහ 1,202,922 ක් දක්වා පිළිවෙලින් සියයට 4 කින් සහ සියයට 20 කින් වැඩිවී තිබුණි. 1998 වර්ෂය අවසාන වනවිට මෙම රෝහල්වල ස්ථිර වෛද්‍යවරු සංඛ්‍යාව 136 ක් විය. 1998 දී මෙම රෝහල්වල සාත්තු සේවක සංඛ්‍යාව 970 දක්වා සියයට 4 කින් වැඩිවූ අතර අනුපූරක වෛද්‍ය සේවාවල නියුක්තව සිටි සේවක සංඛ්‍යාව 345 ක් දක්වා සියයට 5 කින් වැඩිවී තිබුණි. සෑම පෞද්ගලික රෝහලකම පාහේ විශේෂඥ වෛද්‍ය සේවා පහසුකම් සැපයේ.

සමීක්ෂණයට භාජනය වූ බොහෝ පෞද්ගලික රෝහල් වාර්තා කර ඇති පරිදි, තවදුරටත් සිය රෝහල් සේවා ව්‍යාප්ත කිරීමට ඇති ප්‍රධාන බාධකය වී ඇත්තේ ගොඩනැගිලි ඉදිකිරීමට සුදුසු ඉඩම් හිඟකමය. ආයෝජන මණ්ඩල පහසුකම් ලබන ප්‍රධාන රෝහල් සිය ආයෝජන සඳහා සහන ලබන බැවින්, කුඩා පෞද්ගලික රෝහල්වලට විශාල රෝහල් සමග තරඟකාරී ලෙස සෞඛ්‍ය සේවා සැපයීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුව ඇත. එමෙන්ම, විශේෂයෙන්ම සේවා යෝජකයා මගින් වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කරනු ලබන රෝගීන්, නවීන පහසුකම් සහිත කොළඹ පිහිටි ප්‍රධාන පෙළේ රෝහල්වලට ඇතුලත් වීමට කැමැත්තක් දක්වනු ලබන බැවින්, අනෙකුත් ප්‍රදේශවල පිහිටා ඇති කුඩා රෝහල්වලට අවාසිදායක තත්ත්වයක් උදවී ඇත. කෙසේ වුවද, සියළුම පෞද්ගලික රෝහල්, පුහුණු සාත්තු සේවකයින්ගේ සහ තාක්ෂණ නිලධාරීන්ගේ ඌණතාවයකින් පීඩා විඳියි. පෞද්ගලික සෞඛ්‍ය සේවා සඳහා සෞඛ්‍ය නිලධාරීන්ගේ පුහුණු කිරීමේ අවශ්‍යතාවය රජය පිළිගෙන තිබුණද, එවැනි වැඩපිළිවෙලක් සඳහා මෙතෙක් විධිමත් සැලැස්මක් ඉදිරිපත් වී නොමැත. සෞඛ්‍ය අමාත්‍යාංශයට හෝ වෙනත් ආයතනයකට හෝ පෞද්ගලික සෞඛ්‍ය ආයතන පිළිබඳව සහ ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය නීතිමය බලතල පවරා දී නොමැත. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් මෑතකදී එම අමාත්‍යාංශය යටතේ පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා කටයුතු විමර්ශණය පිණිස වෙනම ඒකකයක් පිහිටුවන ලදී. එහෙත් මෙම ඒකකයෙහි කටයුතු සඳහා අවශ්‍ය නීතිමය බලතල මෙතෙක් පවරා නොමැති නිසා එහි කටයුතු බොහෝ සෙයින් සීමා වී ඇත. පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතන අධීක්ෂණය කිරීම, විධිමත් කිරීම සහ නියාමනය සඳහා යෝජිත පනත් කෙටුම්පත තවමත් සකස් කෙරෙමින් පවතී. කෙසේ වුවද, සෞඛ්‍ය සේවා පහසුකම් සපයන ආයතන සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වන තත්ත්වයක් යටතේ, ජනතාවට ගුණාත්මක බවින් උසස් සෞඛ්‍ය සේවයක් සාධාරණ මිලක් යටතේ සැපයීම සඳහා පෞද්ගලික සෞඛ්‍ය ආයතන නියාමනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ අධිකාරියක් පිහිටුවීම දැඩි අවශ්‍යතාවයක් බවට පත්වී ඇත.

5.1 රූප සටහන

**සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම**



## 5.3 අධ්‍යාපනය

සීඝ්‍රයෙන් ඉදිරියට ඇදෙන තරඟකාරී ලෝක ආර්ථික පරිසරය තුළ පවතින අභියෝගයන්ට සාර්ථකව මුහුණදීම සඳහා අධ්‍යාපනයේ නොකඩවා සිදුවන ගුණාත්මක වර්ධනය පූර්ව අවශ්‍යතාවයකි. වර්තමාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් මෙම අභියෝගයට මුහුණදීම සඳහා වූ මූලික පියවර ලෙස සලකනු ලැබේ. විශේෂයෙන්ම, මෙම ප්‍රතිසංස්කරණ අධ්‍යාපන සුදුසුකම් හා ශ්‍රම වෙළෙඳපොළ තුළ පවතින රැකියා අවස්ථාවන් අතර ඇති නොගැලපීම අවම කරලීම ඉලක්ක කරගත් ඒවාය. මෙම තත්ත්වයට විසඳුමක් සඳහා කලින් කලට විවිධ ප්‍රතිසංස්කරණයන් හඳුන්වා දෙනු ලැබුවද, එම ප්‍රයත්නයන් තුළ පැවැති කඩින්කඩ සිදු කිරීමේ ස්වභාවය හේතුවෙන් අපේක්ෂිත අභිමතාර්ථයන් වෙත ළඟාවීමට අපොහොසත් විය. අධ්‍යාපන පද්ධතියේ සියලුම අංශයන් ආවරණය වන පරිද්දෙන් වඩා පෘථුල ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ඉතා ඉක්මන් අවශ්‍යතාවයක් ලෙස එළිදැක්වී තිබේ. ඒ අනුව මෙම අභියෝගයට මුහුණදීම සඳහා සාමාන්‍ය අධ්‍යාපනය, විශ්ව විද්‍යාල අධ්‍යාපනය, කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව යන අංශ තුළ ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙමින් පවතී.

### සාමාන්‍ය අධ්‍යාපනය

1998 වර්ෂයේදී නව පාසැල් 15 ක් පිහිටුවනු ලැබූ අතර මුළු රජයේ පාසැල් සංඛ්‍යාව 10,373 ක් හා ශිෂ්‍ය සංඛ්‍යාව 4,143,442 ක් විය. සාමාන්‍ය වශයෙන් කිලෝමීටර් 6.3 කට එක් විදුහලක් පැවති අතර එක් විදුහලකට ශිෂ්‍යයන් 399 දෙනෙකු විය. මුළු ගුරුවරුන් සංඛ්‍යාව 188,200 ක් වූ අතර ගුරු-ශිෂ්‍ය අනුපාතය 22 ක් විය. මෙම ගුරුවරුන් අතුරින් සියයට 26 ක් උපාධිධාරීන් වූ අතර සෙසු ගුරුවරුන් ප්‍රධාන වශයෙන් පුහුණු ගුරුවරුන්, සහතික ලත් ගුරුවරුන් හා අ.පො.ස (සා.පෙ.) හා අ.පො.ස.(උ.පෙ.) සුදුසුකම් සහිත සහතික නොලත් ගුරුවරුන් විය.

1998 වර්ෂයේදී, අදාළ යටිතල පහසුකම් සඳහා වූ වියදම් ද ඇතුළුව අධ්‍යාපනය සඳහා වූ රජයේ මුළු වියදම රුපියල් දශලක්ෂ 26,694 ක් විය. මෙය පසුගිය වර්ෂය හා සසඳන විට සියයට 19 ක ඉහළයාමකි. දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) ප්‍රතිශතයක් වශයෙන් අධ්‍යාපන අංශය සඳහා වූ මුළු වියදම සියයට 2.5 සිට සියයට 2.6 දක්වා වැඩිවිය. යෝජිත ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රායෝගික අධ්‍යාපනය සඳහා නව උපකරණ, පුහුණු ගුරුවරුන්ගේ ජාලයක් හා පුස්තකාල පහසුකම් යනාදිය අවශ්‍යවන නිසා අනාගතයේදී අධ්‍යාපන අංශය සඳහා වන සම්පත් අවශ්‍යතාවය තවත් විශාල වනු ඇත.

අදාළ වර්ෂය තුළදී, විදේශ අරමුදල් ලබන යෝජනාක්‍රම කිහිපයක් අධ්‍යාපන අංශය තුළ ක්‍රියාත්මක විය. මේ අතරට (අ) ජාත්‍යන්තර සංවර්ධන ආයතනයේ (ජා.සං.ආ.) ආධාර ලබන ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 83.4 ක වියදමින් ක්‍රියාත්මක වන දෙවන සාමාන්‍ය අධ්‍යාපන යෝජනා ක්‍රමය (ආ) ආසියානු සංවර්ධන බැංකුවේ (ආ.සං.බැ.) අරමුදල් මත ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 40.7 ක වියදමින් නව පන්ති කාමර ඉදිකිරීම, විද්‍යාගාර හා පාසැල් තුළ පවතින ඉඩකඩ වර්ධනය කිරීම සහ පරිගණක මධ්‍යස්ථාන පිහිටුවීම ආදියද ඇතුලත්ව ක්‍රියාත්මක වන ද්විතීය අධ්‍යාපන සංවර්ධන යෝජනා ක්‍රමය (ඇ) ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය නගා සිටුවීම, ප්‍රාථමික අධ්‍යාපනය සඳහා සහභාගිත්වය ඉහළ නැංවීම හා පාසැල් හැරයාම පහත දැමීම අරමුණුකරගෙන ක්‍රියාත්මක වන රුපියල් දශ ලක්ෂ 404 ක ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (සීඩා) මගින් අරමුදල් සපයන ප්‍රාථමික පාසැල් සංවර්ධන යෝජනා ක්‍රමය (ඈ) මුළු වතු පාසැල් සංඛ්‍යාව වන 833 න් පාසැල් 484 ක ගුණාත්මක වර්ධනය ඉහළ නැංවීමට ප්‍රමුඛත්වය දෙමින් සංවර්ධනය කිරීමට ඉලක්ක කරගත් සීඩා ආයතනය මගින් ආධාර කරනු ලබන වතු පාසැල් සංවර්ධන යෝජනා ක්‍රමය (ඉ) ජා.සං.ආ.යේ ආධාර ලබන ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 79 ක් වැය වන ගුරු අධ්‍යාපන හා ගුරු විස්ථාපන ව්‍යාපෘතිය (ඊ) එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තුවේ ආධාර ලබන ප්‍රාථමික ගණිත ව්‍යාපෘතිය හා ප්‍රාථමික අධ්‍යාපන සැළසුම් ව්‍යාපෘතිය ඇතුලත් වේ.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ (ප්‍රා.ලේ.කො.) මට්ටමින් පාසැල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 1998 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. ජනප්‍රිය පාසැල් සඳහා වර්ධනය වන ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රා.ලේ.කො. මට්ටමින් අඩුම වශයෙන් තෝරාගත් පාසැල් දෙකක්වත් සංවර්ධනය කිරීම, මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම තෝරාගන්නා ලද පාසැල් වලට පන්ති කාමර, විද්‍යාගාර, තාක්ෂණික ඒකක, පුස්තකාල ආදිය මෙන්ම ජලය, විදුලිය හා ක්‍රීඩා පිටි ආදී අනෙකුත් යටිතල පහසුකම් ද සැපයේ. මෙම ව්‍යාපෘතිය සඳහා වන ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් දශ ලක්ෂ 2,100 කි. දැනටමත් මෙහි පළමු අදියර යටතේ පාසැල් සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කර තිබේ. 1997 වර්ෂයේ පැවති 249 ක්වූ ජාතික පාසැල් සංඛ්‍යාව හා සසඳන විට 1998 වර්ෂය අවසානයේදී දිවයිනේ සියලුම පලාත්වල ක්‍රියාත්මක වන ජාතික පාසැල් සංඛ්‍යාව 270 ක් විය. වසර 2000 වනවිට වර්ෂයකට සිසුන් 150,000 කට පුහුණුව ලබාගත හැකි පරිගණක මධ්‍යස්ථාන 150 ක් පිහිටුවීමට සැලසුම් කර ඇත. මෙම එක් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ඇස්තමේන්තුගත වියදම රුපියල් දශ ලක්ෂ 3 ක් වන අතර වර්ෂයකට සිසුන් 60,000 කට පමණ පරිගණක පුහුණුව ලබාදිය හැකි ධාරිතාවයකින් යුත් මධ්‍යස්ථාන 72 ක් 1998 වර්ෂය වනවිට පිහිටුවා තිබේ.

ගුරු පුහුණුව ලබාදීම වර්ධනය කිරීමේ අරමුණින් වැඩපිළිවෙල කිහිපයක් 1998 වර්ෂයේදී හඳුන්වා දෙනු ලැබීය. ඒ අනුව 1977 අංක 32 දරණ ජාතික ගුරු අධ්‍යාපන පනත යටතේ, 1998 වර්ෂයේදී ගුරු අධ්‍යාපන සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පිහිටුවනු ලැබීය. වර්තමානයේ පවතින ගුරු අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව වූ 11 අනාගතයේදී 14 දක්වා වැඩි

කිරීමටද අපේක්ෂා කරයි. නව පාඨමාලා හඳුන්වාදීම හා ඇතුලත් කරගනු ලබන ගුරු ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීම මෙම උත්සාහයේ ප්‍රධාන අරමුණු අතර වේ. කෙසේ වුවද, ගුරු විද්‍යාල මගින් පවත්වනු ලබන පාඨමාලාවලට ඇතුලත් වන සංඛ්‍යාවේ අඩුවක් පවතින බව පෙනේ. මීට හේතුව ජාතික අධ්‍යාපන ආයතනය මගින් දුරස්ථ පුහුණු පාඨමාලා පවත්වාගෙන යනු ලැබීමයි. ගුරුවරුන්, විදුහල්පතිවරුන්, ගුරු අධ්‍යාපනඥයින්, අධ්‍යාපන පරිපාලකයින් හා ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් වෙත අධ්‍යාපනයේ වැදගත් අංශයන් පිළිබඳව විදේශ පුහුණුවක් ලබාදීමේ වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක කෙරිණි.

1998 වර්ෂය තුළදී නොමිලයේ නිල ඇඳුම් සැපයීම, නොමිලයේ පොත් සැපයීම හා පාසැල් වාර ප්‍රවේශපත්‍ර ලබාදීම සඳහා රජය මගින් රුපියල් දශ ලක්ෂ 1,989 ක මුදලක් වියදම් කරනු ලැබීය. පාසැල් සහ අධ්‍යාපන ආයතනවල පුස්තකාල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන සේවා අංශය යටතේ පාසැල් පුස්තකාල සේවා ඒකකය නමින් නව ඒකකයක් පිහිටුවනු ලැබීය.

සම්පත් සීමිත භාවය අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා ප්‍රධාන බාධකයක් ලෙස සැලකුවද, සමහර අවස්ථාවලදී පවත්නා සම්පත් පවා සැලසුම් කළ පරිදි යොදගෙන නොමැති බව පෙනී ගොස් ඇත. දනට ක්‍රියාත්මකව පවතින ජා.සං.ආ. යේ ආධාර ලබන දෙවන සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය හා ගුරු අධ්‍යාපන සහ ගුරු විස්ථාපන ව්‍යාපෘතිය යන ව්‍යාපෘති දෙකෙහි අරමුදල් යොද ගැනීමේ අනුපාතය සතුටුදයක මට්ටමක නොපවතී. ඒ අනුව, පවත්නා ව්‍යාපෘති සම්පූර්ණ කරලීම සඳහා වන උත්සාහයන් වේගවත් කළයුතු අතරම එම ව්‍යාපෘති යටතේ ලැබී ඇති සම්පත් ඵලදයී ලෙස යොද ගැනීමටද වගබලාගත යුතුය.

නිල වශයෙන් අනුමත කළ/සහතික කළ පෞද්ගලික පාසැල්, ජාත්‍යන්තර පාසැල්, පෞද්ගලික ඉගැන්වීමේ ආයතන හා පෞද්ගලික පෙර පාසැල් රාශියක් රජයේ නොවන අධ්‍යාපන ආයතන ලෙස ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. නිල වශයෙන් අනුමත කළ සහතික කළ පෞද්ගලික පාසැල් සංඛ්‍යාව 1997 පැවති 75 සිට 1998 දී 79 දක්වා වැඩිවිය. 1998 දී මෙම පාසැල්වල ශිෂ්‍ය සංඛ්‍යාව 91,536 ක් පමණ විය. මෙම පෞද්ගලික පාසැල් සාමාන්‍යයෙන් රජයේ පාසැල් සඳහා වූ නිර්දේශ අනුගමනය කරන අතර රජය මගින් පවත්වනු ලබන විභාග සඳහා ශිෂ්‍යයන් පුහුණු කරයි. ජාත්‍යන්තර පාසැල් ප්‍රධාන වශයෙන් වෙනස් ආකාරයේ විදේශ විභාග සඳහා සිය ශිෂ්‍යයන් පුහුණු කිරීමෙහි යෙදී සිටියි. 1997 අවසානයේදී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වී තිබූ ජාත්‍යන්තර පාසැල් සංඛ්‍යාව 34 ක් විය. ජාතික අධ්‍යාපන කොමිසමෙහි නිර්දේශ මත අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වඩා පෘථුල අධ්‍යාපන පනතක් පිළියෙල කරමින් සිටින අතර අවශ්‍ය තත්ත්වයන් හා ගුණාත්මක භාවය පවත්වාගෙන යාම සහතික කිරීම් වස් ජාත්‍යන්තර පාසැල් පාලනය කිරීම සඳහා වන නීතිරීති එහි ඇතුලත් වනු ඇත. පසුගිය කාලය තුළදී පෙර පාසැල් අධ්‍යාපනය ද සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති බැවින් පෙර පාසැල් අධ්‍යාපනය විධිමත් කිරීමේ ක්‍රමයක අවශ්‍යතාවයද පෙනේ. පෙර පාසැල් ගුරුවරුන් පුහුණු කිරීමේ පහසුකම් විවෘත කිරීම හා අවශ්‍ය සුදුසුකම් නියම කිරීම මෙයට ඇතුලත් විය යුතුය. නාගරික ප්‍රදේශවල මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවලදද මෙම පහසුකම් සංවර්ධනය කළ යුතුය.

## උසස් අධ්‍යාපනය

1998 වර්ෂයේදී විශ්ව විද්‍යාල 12 ක්, පශ්චාත් උපාධි ආයතන 6 ක් හා අනෙකුත් ආයතන 5 ක් එනම් සෞන්දර්‍ය්‍ය අධ්‍යාපන ආයතනය, පරිගණක තාක්ෂණ ආයතනය, දේශීය වෛද්‍ය ආයතනය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය හා සේවක අධ්‍යාපන ආයතනය, උසස් අධ්‍යාපන ආයතන ලෙස ක්‍රියාත්මක වෙමින් පැවතිණ. 1998 වර්ෂයේදී විශ්ව විද්‍යාල සිසුන් සංඛ්‍යාව 38,192 ක් විය. විශ්ව විද්‍යාල සඳහා ඇතුලත් වූ නවක සිසුන් සංඛ්‍යාව සියයට 14 කින් වැඩිවී 10,450 ක් විය. මෙය විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරාලූ 70,379 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 15 ක් පමණක් වූ අතර අ.පො.ස.(උ.පෙ.) විභාගය සඳහා පෙනී සිටි සිසුන්ගෙන් සියයට 7 ක් පමණ විය. පූර්ණකාලීන හා අර්ධකාලීන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 6,500 ක් පමණ විය. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය (ශ්‍රී ලං.වි.වි.) මගින් දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ පාඨමාලා හැදරීම සඳහා ශිෂ්‍යයන් 19,500 දෙනෙකු පමණ ලියාපදිංචි වී සිටියහ. කැළණිය, පේරාදෙණිය, ශ්‍රී ජයවර්ධනපුර, රුහුණු හා නැගෙනහිර යන විශ්ව විද්‍යාලයන්හි බාහිර උපාධි සඳහා ලියාපදිංචි වී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 91,000 ක් පමණ විය. 1998 වර්ෂය තුළදී විශ්ව විද්‍යාල කිහිපයක් විසින් නව පාඨමාලා කිහිපයක් හඳුන්වා දෙනු ලැබීය. ශ්‍රී ලං.වි.වි. ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ප්‍රථම උපාධි පාඨමාලාවක්ද, කැළණිය විශ්ව විද්‍යාලය ගණිතය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවක් ද හඳුන්වා දෙන ලදී. ඖෂධවේදය පිළිබඳ උපාධි පාඨමාලාවක් කොළඹ විශ්ව විද්‍යාලය විසින් ආරම්භ කළ අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කමිටුව විසින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳව අන්තර් විශ්ව විද්‍යාල කමිටුවක් පිහිටුවනු ලැබීය.

1998 දී අධ්‍යාපන ආයතනවල නවක වධය හා වෙනත් අන්දමේ හිංසාකාරී ක්‍රියා තහනම් කිරීමේ 1998 අංක 20 දරණ පනත හඳුන්වා දෙන ලදී. 1987-89 කාලය තුළ පැවති දේශපාලන නොසන්සුන්තාවය හේතුවෙන් දිගු කාලයක් විශ්ව විද්‍යාල වසා තැබීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් හිඟ හිටි අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කිරීමෙහි කටයුතු සිදුකරමින් පැවතිනි. එම කටයුතු අවසන් වූ පසුව විශ්වවිද්‍යාලවලට සිය සාමාන්‍ය අධ්‍යාපන කාලසටහන් අනුගමනය කිරීමට අවස්ථාව සැලසෙනු ඇත. තාවකාලික පදනම යටතේ කාර්ය මණ්ඩල යොදවා ගැනීමට හා අතිකුත් පහසුකම් ලබාගැනීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් අවශ්‍ය අතිරේක සම්පත් අඛණ්ඩව සැපයීම හේතුවෙන් මෙම තත්ත්වය ළඟාකරගත හැකිවිය. අලුතින් විශ්ව විද්‍යාල පිහිටුවීමද මෙම තත්ත්වය පහසු කිරීමට උපකාර විය.

**5.3 සංඛ්‍යා සටහන**

**සාමාන්‍ය සහ විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය**

| ශීර්ෂය | 1996 | 1997 | 1998(අ) |
|---|---|---|---|
| **සාමාන්‍ය අධ්‍යාපනය** | | | |
| 1. මුළු පාසල් සංඛ්‍යාව | 10,936 | 10,983 | 11,007 |
| 1.1 රජයේ මුළු පාසල් සංඛ්‍යාව | 10,312 | 10,358 | 10,373 |
| ජාතික පාසල් සංඛ්‍යාව | 238 | 249 | 270 |
| 1.2 වෙනත් පාසල් | 624 | 625 | 634 |
| පෞද්ගලික | 79 | 75 | 79 |
| පිරිවෙන් | 545 | 550 | 555 |
| 2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 4,265,076 | 4,260,989 | 4,286,894 |
| 2.1 රජයේ පාසල් | 4,132,749 | 4,124,125 | 4,143,442 |
| 2.2 වෙනත් පාසල් | 132,327 | 136,881 | 143,452 |
| පෞද්ගලික | 86,707 | 85,890 | 91,536 |
| පිරිවෙන් | 45,620 | 50,991 | 51,916 |
| 3. අළුතෙන් ඇතුළත් කර ගැනීම් | 322,686 | 353,639 (අ) | 353,047 |
| 4. මුළු ගුරුවරු සංඛ්‍යාව | 193,720 | 187,539 | 196,476 |
| 4.1 රජයේ ගුරුවරු | 185,842 | 179,589 | 188,200 |
| 4.2 වෙනත් | 7,878 | 7,950 | 8,276 |
| 5. ශිෂ්‍ය/ගුරු අනුපාතය | 22 | 23 | 22 |
| 6. අධ්‍යාපනය සඳහා වූ මුළු වියදම (රු.දශලක්ෂ (ආ) | 20,402 | 22,329 | 26,694 |
| 6.1 වර්තන | 16,018 | 17,737 | 20,582 |
| 6.2 ප්‍රාග්ධන | 4,384 | 4,592 | 6,112 |
| **විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය** | | | |
| 1. විශ්ව විද්‍යාල සංඛ්‍යාව | 12 | 12 | 12 |
| 2. ශිෂ්‍ය සංඛ්‍යාව (ඇ) | 32,800 | 34,139 | 38,192 |
| 3. කථිකාචාර්යවරුන් සංඛ්‍යාව (ඈ) | 2,808 | 2,927 | 3,050 |
| 4. උපාධි ලත් සංඛ්‍යාව | 5,216 | 6,738 | ලැ.නො. |
| 4.1 කලා සහ සෞන්දර්ය අධ්‍යයනය | 1,999 | 2,513 | ලැ.නො. |
| 4.2 වාණිජ සහ කළමනාකරණ අධ්‍යයනය | 999 | 1,219 | ලැ.නො. |
| 4.3 නීතිය | 160 | 182 | ලැ.නො. |
| 4.4 විද්‍යා | 844 | 882 | ලැ.නො. |
| 4.5 ඉංජිනේරු විද්‍යාව | 403 | 496 | ලැ.නො. |
| 4.6 කෘෂිකාර්මික | 505 | 1,022 | ලැ.නො. |
| 4.7 දන්ත ශල්‍ය | 58 | 56 | ලැ.නො. |
| 4.8 කෘෂිකාර්මික | 165 | 201 | ලැ.නො. |
| 4.9 පශු වෛද්‍ය විද්‍යාව | 27 | 36 | ලැ.නො. |
| 4.10 ගෘහ නිර්මාණ ශිල්පය | 23 | 58 | ලැ.නො. |
| 4.11 ප්‍රමාණ සමීක්ෂණ | 33 | 72 | ලැ.නො. |
| 5. ප්‍රථම උපාධිය සඳහා නව ඇතුල්වීම් (සංඛ්‍යාව) | 8,663 | 9,787 | 10,450 |

(අ) තාවකාලික
(ආ) සාමාන්‍ය සහ උසස් අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම
(ඇ) විවෘත විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව ඇතුලත් නැත.
(ඈ) වසර ආරම්භයේ දී

මූලයන් : අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම
ශ්‍රී ලංකා මහ බැංකුව

උසස් අධ්‍යාපනය සම්බන්ධ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට ද පියවර ගනු ලැබීය. නේවාසික පහසුකම් සංවර්ධනය අඛණ්ඩව සිදුකිරීම හා විශ්ව විද්‍යාල ඉඩ පහසුකම් පුළුල් කිරීම මීට අයත් විය. වසර 2000 වනවිට මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 75 කට නේවාසික පහසුකම් සපයාදීමේ ඉලක්කයක් පවතියි. මහපොළ ශිෂ්‍යත්ව ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 1997 දී 19,900 සිට 1998 දී 23,500 දක්වා වැඩිවිය. මීට අමතරව, සුදුසු ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍යාධාරද ලබාදෙන ලදී. මේවා යටතේ ලබාදෙන ආධාර ප්‍රමාණය රු. 1,150 සිට රු. 1,300 දක්වා වෙනස්වන අතර වර්ෂයකට මාස 10 ක කාලයක් වන පරිදි මෙම ආධාර ලබාදෙයි.

විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙහිද වෙනස්කම් සිදු කළයුතු බව ජාතික අධ්‍යාපන කොමිසන් සභා වාර්තාවෙන් අවධාරණය කර ඇත. 1997 මාර්තු මස පත් කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ පවතින දුර්වලතාවයන් මගහැරවීම සඳහා යෝජනා නිර්දේශ කර ඇත. විශ්ව විද්‍යාල අධ්‍යාපනය පුළුල් කිරීම, පාඨමාලා ප්‍රතිසංස්කරණය, ගුණාත්මක වර්ධනය සහතික කිරීම, කාර්ය මණ්ඩල සංවර්ධනය, වෘත්තීය මාර්ගෝපදේශනය, උපදේශනය හා මූල්‍ය යනාදී වැදගත් අංශ මෙම යෝජනාවලට ඇතුලත් වේ. මෙම නිර්දේශ ක්‍රියාවට නැංවීම 1998 වර්ෂයේදී ආරම්භ විය.

මෙම ප්‍රතිසංස්කරණ යටතේ, විශ්ව විද්‍යාලවල ප්‍රාදේශීය විසිරීම ඉහළ නැංවීම සඳහා වයඹ හා ඌව පලාත්වල නව විශ්ව විද්‍යාල දෙකක් පිහිටුවීම මගින් මුළු විශ්ව විද්‍යාල සංඛ්‍යාව 14 දක්වා වැඩි කෙරේ. වයඹ විශ්ව විද්‍යාලය පිහිටුවීම සඳහා මේ වනවිටත් අවශ්‍ය පියවර ගෙන තිබේ. මේ හේතුවෙන්, විශ්ව විද්‍යාලවලට ඇතුලත් කරගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 2000/2001 අධ්‍යයන වර්ෂයේදී 15,000 දක්වා ක්‍රමයෙන් වැඩිකරනු ඇත. විශ්ව විද්‍යාල පාඨමාලා ඒකක ක්‍රමයට පරිවර්තනය කිරීමටද කටයුතු යොද ඇත. ඒ අනුව, වර්ෂය අවසානයේදී පැවැත්වෙන ලිඛිත විභාගවලට අමතරව පැවරුම්, ප්‍රායෝගික අභ්‍යාස, ව්‍යාපෘති, වැඩමුළු ආදියද ඇතුලත් වනු ඇත. තවද, අලුතින් බඳවා ගන්නා විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන් ආචාර්ය මණ්ඩල පුහුණු ඒකක තුළදී ඉගැන්වීම් ක්‍රම පිළිබඳව පාඨමාලාවක් හැදෑරිය යුතුය. මෙවැනි ඒකක තුනක් කොළඹ, පේරාදෙණිය හා කැලණිය විශ්ව විද්‍යාලවල දනටමත් පිහිටුවා තිබේ. අනිකුත් විශ්ව විද්‍යාලද මෙවැනි ආචාර්ය මණ්ඩල පුහුණු ඒකක පිහිටුවීමට බලාපොරොත්තු වේ. මීට අමතරව, විශ්ව විද්‍යාල පහක එනම් ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ, කැළණිය, යාපනය හා පේරාදෙණිය යන විශ්ව විද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශක සේවා ඒකක (වෘ.මා.සේ.ඒ.) පිහිටුවා තිබේ. උපාධිධාරීන්ගේ වෘත්තීය සුදුසුකම් දියුණු කිරීම සඳහා සහාය දීමත්, රැකියා ලබාගැනීමට උපකාර කිරීමත් මෙම වෘ.මා.සේ.ඒ. වල ප්‍රධාන පරමාර්ථ වේ.

## කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව

ශ්‍රම වෙළෙඳපොළෙහි ඇතිවූ මෑතකාලීන සංවර්ධනය පිළිබඳව සලකා බලනවිට කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව ඉතා වැදගත් අංශයක් බවට පත්වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ක්ෂේත්‍රයෙහි ජනිතවන ඉල්ලුමට අනුකූලව කාර්මික හා වෘත්තීය පුහුණුව ලබාදීමේ සම්ප්‍රදායික ක්‍රම ප්‍රතිව්‍යුහගත කිරීමේ හා ප්‍රසාරණය කිරීමේ ඉතා වැදගත් අවශ්‍යතාවයක් පවතී. විශ්ව විද්‍යාල අධ්‍යාපන අවස්ථාවන් ඉතා සීමාසහිත හා දැඩි තරඟකාරී බවින් යුක්ත වන නිසා මෙම අංශය මගින් පාසැල් හැරයන්නන් සඳහා මෙන්ම සාමාන්‍ය ද්විතීය අධ්‍යාපනය නිසි පරිදි සම්පූර්ණ කළ අයටද විකල්ප සංවර්ධන මාර්ග සැපයිය හැකිය. එමෙන්ම අඩු නිපුණතා සහිත දනට රැකියාවල නියුතු පුද්ගලයින්ගේ නිපුණතා ඉහළ නංවා ගැනීමට උපකාර කිරීමටත් ඒ තුළින් ඔවුන්ගේ රැකියා වර්ධනය කරගැනීමට හා ස්වයං රැකියා ඇරඹීමටත් අවස්ථාව ඇතිකරගත හැකිය. කාර්මික අධ්‍යාපනයේ ඇති වැදගත්කම ජා.අ.කොමිසම මගින් ද හඳුනාගෙන ඇති අතර ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් මෙම අංශය නගා සිටුවීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත.

මෙම අංශයෙහි ප්‍රධානතම පුහුණුව ලබාදෙන්නෙකු වශයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව (කා.අ.පු.දෙ.) කාර්මික ආයතන 36 ක් ඔස්සේ සිය සේවය සැලසීය. මේවායෙහි මුළු කාර්ය මණ්ඩලය 1,562 ක් වූ අතර එය 623 ක්වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් (කථිකාචාර්යවරුන්/උපදේශකවරුන්) හා 939 ක් වූ පරිපාලන කාර්ය මණ්ඩලයකින් සමන්විත විය. 1998 වර්ෂය අවසාන වනවිට කා.අ.පු.දෙ. යටතේ වූ විවිධ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 14,981 කි. ව්‍යාපාර අධ්‍යයන හා කාර්මික ශිල්පී පාඨමාලා විශාල සිසුන් සංඛ්‍යාවකගේ (සියයට 71 ක් පමණ) ආකර්ශනයට බඳුන් විය. වෙළඳාම පිළිබඳ පාඨමාලා, අනෙකුත් ඩිප්ලෝමා පාඨමාලා සහ කෙටිකාලීන පාඨමාලා ද ශිෂ්‍යයන් විසින් හදරන ලදී. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යයන ආයතනයද ඉංජිනේරු, ගණකාධිකරණ, වාණිජ හා කෘෂිකර්මය ආශ්‍රිත පාඨමාලා පවත්වනු ලැබීය. මෙම ආයතනය 1998 වර්ෂයේදී සිසුන් 2206 දෙනෙක් බඳවා ගන්නා ලදී. වෘත්තීය පුහුණු අධිකාරියද පාඨමාලා 92 සඳහා ශිෂ්‍යයන් 18,316 දෙනෙක් බඳවා ගනු ලැබීය. මීට අමතරව, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියෙහිද ස්ථානුරූපී වෘත්තීන් ඇතුළු පාඨමාලා 180 ක් පමණ සඳහා සිසුහු 22,626 දෙනෙකු ලියාපදිංචි වී සිටියහ.

මෙම අංශයෙහි වර්තමාන වෙනස්කම්වලට අනුකූල වන පරිදි පාඨමාලා නැවත සකස් කිරීම ඔස්සේ මෙම ක්ෂේත්‍රය තුළ ලබාදෙන පුහුණුවෙහි ගුණාත්මක භාවය වර්ධනය කිරීම අවශ්‍ය වේ. මෙම අන්තය කරා ළඟාවීම සඳහා විශාල සිසුන් ප්‍රමාණයකට පාඨමාලා හැදෑරීමට ඉඩ සැලසෙන පරිදි නව පහසුකම් සහිතව පවත්නා පහසුකම් වර්ධනය කළ යුතුය. හෝටල් හා සංචාරක කර්මාන්තය, රෙදිපිළි හා ඇඟළුම්, ඉදිකිරීම්, මැණික් හා ස්වර්ණාභරණ, තොරතුරු තාක්ෂණය, පරිගණක පුහුණුව හා මුද්‍රණ ශිල්පය වැනි අංශයන්හි නව පාඨමාලා හඳුන්වා දිය යුතුය. මෙම අංශයේ පුහුණුව ලැබූවන්ට දේශීය වශයෙන් හා විදේශ රටවලින් විශාල ඉල්ලුමක් පැවතීම මීට හේතුවයි. ග්‍රාමීය ප්‍රදේශවල සිටින ශිෂ්‍යයන්ටද පුහුණුව තුළින් ප්‍රතිලාභ ලබාගැනීමට ඉඩ සැලසෙන පරිදි කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව එම ප්‍රදේශවලටද ව්‍යාප්ත කරලීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

දනට ක්‍රියාත්මක වෙමින් පවත්නා අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් දැඩි අපේක්ෂාසහගත බවින් යුක්තය. ඒවායෙහි සාර්ථකභාවය දනගත හැකිවන්නේ වසර කිහිපයකට පසුවය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දිගින් දිගටම පවත්නා දුර්වලතාවය වන්නේ රාජ්‍ය අංශයේ ප්‍රධානත්වයෙන් මිදීම සඳහා කිසිදු උත්සාහයක් ගෙන නොතිබීමයි. දියුණු රටවල පවා අධ්‍යාපනය සැලසීමේදී රාජ්‍ය අංශයේ සහභාගිත්වය දකිය හැකි වුවද එම රටවල පෞද්ගලික අංශයද ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. විශ්ව විද්‍යාල හා කාර්මික අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයේ සම්පත් යොමුකරවීම මෙන්ම මෙම සේවා සැපයීම සඳහා පෞද්ගලික අංශයේ සෘජු සහභාගිත්වයද ඵලදායක අයුරින් . උනන්දු කළ යුතුය. පිළිගත් විදේශ අධ්‍යාපන ආයතන/කාර්මික විද්‍යාල සමග විධිමත් සබඳතා ඇතිකර ගැනීම මෙන්ම ආචාර්ය මණ්ඩල හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් ද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ශක්තිමත් කිරීමට උපකාර වනු ඇත. වෘත්තීය මාර්ගෝපදේශක සේවා ඒකක හඳුන්වාදීමේ අදහස සතුටුදයක වර්ධනයකි. පෞද්ගලික අංශය හා විශ්ව විද්‍යාල/කාර්මික විද්‍යාල කළමනාකරණය හා ආචාර්ය මණ්ඩලය අතර නිරන්තර සංවාදයන් ඔස්සේ

මෙම යෝජනා ක්‍රමය තව තවත් ප්‍රවර්ධනය කළ යුතු අතර එය ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතා හඳුනා ගැනීමටත්, ශිෂ්‍යයන් එම අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා සූදනම් කිරීමටත් උපකාරී වේ.

අනාගතයේදී අලුතින් ශ්‍රම බලකායට එකතුවන බොහොමයක් පුද්ගලයන්ට රැකියා අවස්ථා ලබාදීමට රාජ්‍ය අංශය අපොහොසත් වන බව දෙමව්පියන් මෙන්ම ශිෂ්‍යයන්ද පැහැදිලිව වටහාගත යුතුය. විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ සම්පත් සීමා සහිතය. එමනිසා පෞද්ගලික අංශයේ පුළුල් සහභාගිත්වය යටතේ ආර්ථික වර්ධනය ඉහළ නැංවීමේ අරමුණු ඇති සංවර්ධන ක්‍රමෝපායේදී රාජ්‍ය අංශයේ සාපේක්ෂ ප්‍රමාණය අඩුවනු ඇත. අනාගත අභියෝගවලට මුහුණ දියහැකි වන පරිදි අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කළහැකි වන්නේ අදළ සියලු අංශවල එනම් රජය, ගුරුවරුන්, කළමනාකරුවන්, ශිෂ්‍යයන්, දෙමව්පියන් හා පෞද්ගලික අංශයේ ඒකාබද්ධ සාමූහික උත්සාහයක් තුළින් පමණි.

## 5.4 පණිවුඩ හුවමාරු සේවා

### තැපැල් සේවය

ජාත්‍යන්තර තැපැල් සංගමයේ සහ ලෝක බැංකුවේ සහයෝගය ඇතිව තැපැල් දෙපාර්තමේන්තුව සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් 1998 දී සකස් කෙරිණි. මේ සඳහා නීති කෙටුම්පත් දැනටමත් සකස්කර ඇත. ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ, තැපැල් දෙපාර්තමේන්තුව වාණිජ සංවිධානයක් ලෙස වඩාත් ස්වාධීනත්වයෙන් යුක්තව ක්‍රියාත්මකවීමට ඉඩකඩ සලසාදීමට අපේක්ෂිත අතර "ශ්‍රී ලංකා තැපැල් සංස්ථාව" යන නමින් එය සංස්ථාවක් බවට පරිවර්තනය කිරීමටද අපේක්ෂිතය. නව තැපැල් සංස්ථාව මගින් සාමාන්‍ය තැපැල් සේවා මෙන්ම අතිරේක පාරිභෝගික සේවාවන්ද ඵලදායී ලෙස ඉටු කිරීමට අපේක්ෂා කෙරේ. වෙළෙඳ සහ වාණිජ අංශයේ සීග්‍ර සංවර්ධනයක් සඳහා කාර්යක්ෂම සහ විශ්වසනීය තැපැල් සේවාවක් පැවතීම අත්‍යවශ්‍යය.

1998 වර්ෂය තුළදී තැපැල් කාර්යාල පද්ධතිය 4,313 සිට 4,362 දක්වා ප්‍රසාරණය වූ අතර ඊට ප්‍රධාන වශයෙන් පෞද්ගලික නියෝජිත තැපැල් කාර්යාල සහ ග්‍රාමීය නියෝජිත තැපැල් කාර්යාල සංඛ්‍යාව වැඩිවීම හේතුවිය. තැපැල් සේවා වඩාත් ග්‍රාමීය ප්‍රදේශ කරා ව්‍යාප්ත කිරීමේ අරමුණින් සමූපකාර ණය දෙන සහ සකසුරුවම් සමිතිවල සහයෝගය ඇතිව ග්‍රාමීය නියෝජිත තැපැල් කාර්යාල 1996 දී හඳුන්වා දෙනු ලැබීය. ඉතා දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශ තැපැල් සේවාවට සම්බන්ධ කරමින්, මේ දක්වා ග්‍රාමීය නියෝජිත තැපැල් කාර්යාල සංඛ්‍යාව 76 ක් දක්වා ව්‍යාප්ත වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, සාමාන්‍යයෙන් තැපැල් කාර්යාලයකින් සේවය සැලසෙන ප්‍රදේශය වර්ග කි.මී.15 ක් දක්වා අඩුවිය. එමෙන්ම, 1998 වර්ෂය අවසන් වනවිට තැපැල් කාර්යාලයකින් සේවය සැලසෙන ජනගහනය 4,304 දක්වා සුළු වශයෙන් අඩුවිය.

යාපනය අර්ධද්වීපයේ තැපැල් සේවා නැවත ස්ථාපිත කිරීමත් සමග දේශීය තැපැල් සේවා සැලකිය යුතු පරිදි ප්‍රසාරණය විය. 1998 වර්ෂය අවසන් වනවිට, ප්‍රධාන තැපැල් කාර්යාල 30 ක්ද, උප තැපැල් කාර්යාල 131 ක්ද, යාපනය ප්‍රදේශයේ ක්‍රියාත්මකව තිබිණි. මේ අතර, මහනුවර සහ ගාල්ල නගරවල, විදේශ තැපැල් පාර්සල් කාර්යාල දෙකක් විවෘත කරමින්, විදේශ තැපැල් පාර්සල් බෙදහැරීම විමධ්‍යගත කරන ලදී. එමෙන්ම මධ්‍යම තැපැල් හුවමාරුව මගින් මෙහෙයවන ලද තැපැල් බෙදහැරීමේ සේවා බොරැල්ල, කොටහේන, කොම්පඤ්ඤවීදිය සහ වැල්ලවත්ත යන තැපැල් කාර්යාලවලට විමධ්‍යගත කරන ලදී.

තැපැල් දෙපාර්තමේන්තුව විසින් බෙදහරින ලද මුළු තැපැල් භාණ්ඩ සංඛ්‍යාව 1998 වර්ෂය තුළදී සියයට 3 කින් පමණ අඩුවූ අතර, ඊට ප්‍රධාන වශයෙන් තැපැල් දෙපාර්තමේන්තුවේ මාස දෙකක පමණ කාලපරිච්ඡේදයක් තුළ පැවැති සේවක ආරවුල් හේතුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එක් පුද්ගලයෙකු වෙනුවෙන් ලැබෙන සාමාන්‍ය ලිපි සංඛ්‍යාව 1997 දී 24 සිට 1998 දී 23 දක්වා අඩුවිය. එමෙන්ම විදේශ ලිපි සහ පාර්සල් බෙදහැරීමද 1998 දී දශ ලක්ෂ 65 පමණ දක්වා සියයට 4 කින් පමණ අඩුවිය. විද්‍යුත් තැපැල (E-Mail), අන්තර් ජාලය (Internet), ෆැක්ස් පහසුකම්, ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් වැනි නවීන සන්නිවේදන සේවා ප්‍රසාරණය වීමත් සමග, විශේෂයෙන්ම ජාත්‍යන්තර පණිවුඩ හුවමාරුවලදී, සම්ප්‍රදායික තැපැල් සේවා භාවිතය අඩුවෙමින් පවතී. පෞද්ගලික අංශයේ කඩිනමින් ලිපි ලේඛණ බෙදාහැරීමේ සේවාවන්ද (courier services) විශේෂයෙන්ම වාණිජ සහ මූල්‍ය ආයතන අතර ජනප්‍රිය වෙමින් පවතී.

1998 දී තැපැල් දෙපාර්තමේන්තුව සිය අතිරේක සේවාවන් තවදුරටත් වැඩිදියුණු කිරීමේ සහ පුළුල් කිරීමේ නිරත විය. 1998 වර්ෂය අවසන් වනවිට තැපැල් ෆැක්ස් සේවාව, තැපැල් කාර්යාල 177 ක් දක්වා ව්‍යාප්ත කරන ලදී. මෙම පහසුකම නිසා තැපැල් කාර්යාල ඉතිරිකිරීමේ ව්‍යාපාරයේ ගණුදෙනු කඩිනමින් ඉටු කිරීමට හැකිවී ඇත. 1998 වර්ෂය අවසන් වනවිට තොග තැපැල් පහසුකම් සපයා ඇති ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව 60 ක් දක්වා වැඩි කර තිබුණි. ෆැක්ස්-මුදල් ඇණවුම් සේවාව තැපැල් කාර්යාල 98 ක් දක්වා ව්‍යාප්ත කර ඇත. ජාත්‍යන්තර අධිවේගී තැපැල් සේවාව මගින් වර්ෂය තුළදී විදේශ තැපැල් භාණ්ඩ 77,575 ක් හසුරුවනු ලැබූ අතර එය සියයට 27 ක වර්ධනයක් පිළිබිඹු කරයි. කෙසේ වෙතත්, 1998 වර්ෂය තුලදී දේශීය අධිවේග තැපැල් සේවාවෙහි සැලකියයුතු ප්‍රගතියක් දක්නට නොලැබුණි. තැපැල් කාර්යාල සංකේත අංක සෑම ප්‍රධාන හා උප තැපැල් කාර්යාලයකටම හඳුන්වා දී ඇත. තැපැල් කාර්යාල මගින් විද්‍යුත් තැපැල් සහ අන්තර්ජාල පහසුකම් ලබාදීමට තැපැල් දෙපාර්තමේන්තුව විසින් පියවර ගනිමින් සිටී. ආරම්භයේදී ප්‍රධාන නගරවල පිහිටි තැපැල් කාර්යාලවලට විද්‍යුත් තැපැල් සහ අන්තර්ජාල පහසුකම් ලබාදීමට අපේක්ෂිතය. රාජ්‍ය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සඳහා සපයා ඇති නිදහස් තැපැල් සේවා විධිමත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, නිදහස් තැපැල් භාණ්ඩ සංඛ්‍යාව සැලකියයුතු පරිදි අඩුවී ඇති අතර, ඒ හා සම්බන්ධ ගිණුම් තැබීමේ කටයුතුද වැඩිදියුණු වී ඇත. තෝරාගත් තැපැල් කාර්යාල 54 ක කවුන්ටරවල කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා යෝජනා ඉදිරිපත්ව ඇත. සමහර ප්‍රදේශවල පිහිටි වතුවල ග්‍රාමීය නියෝජිත තැපැල් කාර්යාල පිහිටුවීමටද තැපැල් දෙපාර්තමේන්තුව සැලසුම්කොට ඇති අතර, ඒ සඳහා දැනටමත් වතු 62 ක් හඳුනාගෙන ඇත.

**5.4 සංඛ්‍යා සටහන**
**තැපැල් හා විදුලි සංදේශ සේවාවේ වර්ධනය**

| ශීර්ෂය | 1996 | 1997 | 1998(අ) | ප්‍රතිශත වෙනස 1997 | ප්‍රතිශත වෙනස 1998 (අ) |
|---|---|---|---|---|---|
| 1. තැපැල් සේවය | | | | | |
| තැපැල් බෙදීම් කොට්ඨාශ ගණන | 6,729 | 6,729 | 6,729 | 0.0 | 0.0 |
| තැපැල් කාර්යාල සංඛ්‍යාව | 4,252 | 4,313 | 4,362 | 1.4 | 1.1 |
| රාජ්‍ය අංශය | 4,032 | 4,034 | 4,036 | 0.0 | 0.0 |
| පෞද්ගලික අංශය | 203 | 216 | 250 | 6.4 | 15.7 |
| ග්‍රාමීය ඒජන්සි තැපැල් කාර්යාල | 17 | 63 | 76 | 270.6 | 20.6 |
| තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ප්‍රදේශය (ව.කිමී) | 15.5 | 15.3 | 15.0 | -1.3 | -2.0 |
| තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ජන සංඛ්‍යාව | 4,339 | 4,326 | 4,304 | -0.3 | -0.5 |
| එක් පදිංචිකරුවෙකුට ලැබුණු ලිපි සංඛ්‍යාව | 27 | 24 | 23 | -11.1 | -4.2 |
| 2. විදුලි සංදේශ සේවය | | | | | |
| 2.1 සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | | | | | |
| දුරකථන සංඛ්‍යාව | 254,500 | 315,241 | 455,598 | 23.9 | 44.5 |
| අළුතින් දෙනු ලැබූ දුරකථන සංඛ්‍යාව | 50,170 | 72,457 | 143,075 | 44.4 | 97.5 |
| පොරොත්තු ලේඛනයේ සිටින සංඛ්‍යාව | 270,800 | 284,876 | 224,441 | 5.2 | -21.2 |
| දුරකථන සඳහා ප්‍රකාශිත ඉල්ලුම (සංඛ්‍යාව) | 525,300 | 600,117 | 680,039 | 14.2 | 13.3 |
| දුරකථන ඝණත්වය (පුද්ගලයින් 100 කට දුරකථන සංඛ්‍යාව) | 1.39 | 1.69 | 2.43 | 21.6 | 43.8 |
| 2.2 අනෙකුත් පෞද්ගලික අංශය | | | | | |
| සෙලියුලර් දුරකථන | | | | | |
| සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව | 4 | 4 | 4 | 0.0 | 0.0 |
| ග්‍රාහක සංඛ්‍යාව | 71,028 | 114,888 | 174,202 | 61.8 | 51.6 |
| මුළු සමුච්චිත ආයෝජනය (රු.දශලක්ෂ) | 5,307 | 6,870 | 8,842 | 29.5 | 28.7 |
| පොදු දුරකථන කුටි | | | | | |
| සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව | 4 | 4 | 5 | 0.0 | 25.0 |
| දුරකථන කුටි සංඛ්‍යාව | 2,152 | 2,571 | 4,610 | 19.5 | 79.3 |
| මුළු සමුච්චිත ආයෝජනය (රු.දශලක්ෂ) | 610 | 718 | 1,090 | 17.7 | 51.8 |
| රේඩියෝ පේජින් සේවා | | | | | |
| සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව | 5 | 5 | 5 | 0.0 | 0.0 |
| ග්‍රාහක සංඛ්‍යාව | 10,721 | 10,829 | 10,511 | 1.0 | -2.9 |
| මුළු සමුච්චිත ආයෝජනය (රු.දශලක්ෂ) | 221 | 222 | 222 | 0.5 | 0.0 |
| දත්ත සංනිවේදන සේවා | | | | | |
| සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව | 7 | 8 | 8 | 14.3 | 0.0 |
| ග්‍රාහක සංඛ්‍යාව | 355 | 11,745 | 19,019 | 3,208.5 | 61.9 |
| මුළු සමුච්චිත ආයෝජනය (රු.දශලක්ෂ) | 574 | 665 | 768 | 15.9 | 15.5 |
| රැහැන් රහිත දුරකථන | | | | | |
| සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව | 2 | 2 | 2 | 0.0 | 0.0 |
| ග්‍රාහක සංඛ්‍යාව | 527 | 26,381 | 67,931 | 4,905.9 | 157.5 |
| මුළු සමුච්චිත ආයෝජනය (රු.දශලක්ෂ) | 1,743 | 6,796 | 9,291 | 289.9 | 36.7 |

(අ) තාවකාලික

මූලයන් : තැපැල් දෙපාර්තමේන්තුව.
සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂම

වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුකොටගෙන මාස 2 කට ආසන්න කාලයක් තිස්සේ තැපැල් කටයුතු අඩාල වුවද වර්ෂය අවසානයේදී තැපැල් ගාස්තු වැඩිකිරීම සහ වෙනත් ආදයම් වැඩිවීම නිසා, 1998 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ මුළු ආදයම රුපියල් දශ ලක්ෂ 1,617 දක්වා සියයට 15 කින් පමණ වැඩිවිය. කෙසේ වෙතත්, සාමාන්‍ය වර්ෂයකදී වුවද, තැපැල් දෙපාර්තමේන්තුවේ ආදයම එහි මෙහෙයුම් පිරිවැය ආවරණය කරගැනීමට ප්‍රමාණවත් නොවේ. ප්‍රධාන වශයෙන් වැටුප් සහ වේතනවලින් සමන්විත තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් පිරිවැය, 1998 දී සියයට 12 කින් වැඩිවිය. තැපැල් දෙපාර්තමේන්තුව විසින් සේවකයන් 23,458 කින් යුත් විශාල ශ්‍රම හමුදවක් නඩත්තු


කරනු ලබයි. තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අලාභයෙන් කොටසක් පියවා ගැනීමේ අරමුණින්, 1999 අය-වැය මගින් තැපැල් ගාස්තු වැඩි කරන ලදී. මේ අනුව, සාමාන්‍ය ලිපියක් සඳහා වන තැපැල් ගාස්තුව රුපියල් 3.50 දක්වා රුපියල් 1.00 කින් වැඩිකරන ලදී. 1998 දී තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් පිරිවැය රුපියල් දශ ලක්ෂ 2,175 දක්වා සියයට 12 කින් වැඩිවූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අලාභය රුපියල් දශ ලක්ෂ 558 ක් විය. 1998 දී තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන පිරිවැය රුපියල් දශ ලක්ෂ 228 ක් විය.

## විදුලි සංදේශ සේවා

විදුලි සංදේශ සේවය ආර්ථිකයේ ඉතා වේගයෙන් වර්ධනය වන අංශයක් බවට පත්වී ඇත. 1991 දී විදුලි සංදේශ සේවය පෞද්ගලික අංශය සඳහා විවෘත කිරීමත්, ඉන්පසු 1997 දී ශ්‍රී ලංකා ටෙලිකොම් (ශ්‍රී ලං.ටෙ.) ආයතනයේ කොටස් ප්‍රාග්ධනයෙන් කොටසක් ජපානයේ එන්.ටී.ටී. ආයතනයට පැවරීමත්, විදුලි සංදේශ සේවයේ ප්‍රවර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත. මෑත කාලයේදී සාමාන්‍ය දුරකථන, විදුලි පණිවුඩ, කේබල් පණිවුඩ වැනි සම්ප්‍රදායික විදුලි සංදේශන ක්‍රම වෙනුවට විද්‍යුත් තැපැල, අන්තර්ජාලය, දුරකථන - වීඩියෝ සාකච්ඡා, රැහැන් රහිත සහ ජංගම දුරකථන වැනි අති නවීන විදුලි සංදේශන ක්‍රම ආදේශ කෙරෙමින් පවතී. මෙම නව සන්නිවේදන පහසුකම් නාගරික නොවන ප්‍රදේශ කරාද ව්‍යාප්ත වෙමින් පවතී. කෙසේ වෙතත්, ශ්‍රී ලං.ටෙ. සමාගමේ මුළු ග්‍රාහක සංඛ්‍යාවෙන් සියයට 53 ක් පමණ තවමත් සිටිනු ලබන්නේ කොළඹ නාගරික ප්‍රදේශයේය.

ශ්‍රී ලං.ටෙ. සමාගමේ කළමනාකරණය එන්.ටී.ටී. සමාගම යටතේ ප්‍රතිසංවිධානය කිරීමෙන් පසු, ශ්‍රී ලං.ටෙ. සමාගමේ සමස්ත ක්‍රියාකාරිත්වයෙහි සැලකියයුතු ප්‍රගතියක් දක්නට ලැබිණි. 1998 වර්ෂයේදී සෘජු දුරකථන සංඛ්‍යාව 455,598 දක්වා සියයට 45 කින් (නව දුරකථන 143,075) වැඩිවිය. 1998 දී ශ්‍රී ලං.ටෙ. සමාගමේ දුරකථන ජාලයෙහි ධාරිතාවයද සැලකියයුතු පරිදි වැඩිවිය. දුරකථන හුවමාරු යතුරු ධාරිතාවය 543,897 දක්වා සියයට 25 කින් වර්ධනය වූ අතර, ප්‍රධාන සංදම යුගල සංඛ්‍යාව 623,036 දක්වා සියයට 23 කින් වැඩිවිය. ප්‍රාදේශීය වශයෙන් වැඩි දුරකථන සංඛ්‍යාවක් සැපයීමට 1998 දී ශ්‍රී ලං.ටෙ. සමාගමට හැකිවිය. 1998 දී සපයන ලද නව දුරකථන සංඛ්‍යාවෙන් සියයට 62 ක් හෙවත් දුරකථන 86,964 ක් ප්‍රාදේශීය වශයෙන් සපයන ලදී. මේ අනුව, එක් සෘජු දුරකථනයකට සිටින පුද්ගලයන් සංඛ්‍යාව 1997 දී 59 සිට 1998 දී 41 දක්වා අඩුවිය. නව දුරකථන සැපයුමෙහි සීඝ්‍ර වැඩිවීමක් දක්නට ලැබුණද, දුරකථන සඳහා පොරොත්තු ලේඛණයෙහි සිටින සංඛ්‍යාව තවදුරටත් 224,441 ක් වැනි ඉහළ මට්ටමක පවතී. කෙසේ වුවද, දුරකථන සම්බන්ධතාවයක් ලබාගැනීම සඳහා පොරොත්තු ලේඛණයේ සිටින සාමාන්‍ය කාලය 1990 මුල් කාලයේදී වර්ෂ 10 ක පමණ සිට 1998 අවසානය වනවිට, දුරකථන හුවමාරු ප්‍රදේශය සහ දුරකථන යතුරු ලබාගැනීමට ඇති හැකියාව අනුව, මාස 3-12 දක්වා අඩුවී ඇත. පෞද්ගලික රැහැන් රහිත දුරකථන සැපයුම්-කරුවන් විසින් සිය සේවා සම්බන්ධතාවය සති කීපයක් තුළදී ලබාදෙන අතර, ඒ සඳහා බොහෝ විට පොරොත්තු ලේඛණයක් නොමැත. මුළු ජාත්‍යන්තර සෘජු දුරකථන හුවමාරු යතුරු සංඛ්‍යාවද 2,158 දක්වා සියයට 26 කින් වැඩිවිය. ජාත්‍යන්තර විදුලි සංදේශ ධාරිතාවය ප්‍රසාරණය වීමත් සමගම සෘජු ජාත්‍යන්තර දුරකථන පහසුකම් සඳහා පැවැති සීමාවන් බොහෝදුරට ලිහිල් කරන ලදී.

5.2 රූප සටහන
**තෝරාගත් රටවල් කිහිපයක දුරකථන ඝනත්වය - 1998**




1998 වර්ෂයේදී ශ්‍රී ලං.ටෙ. සමාගම විසින් විදුලි සංදේශ අංශයේ කරන ලද ආයෝජනය රුපියල් දශ ලක්ෂ 11,177 ක් විය. 1998 වර්ෂය අවසන් වනවිට දෙවන විදුලි සංදේශ ව්‍යාපෘතිය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 200 ක පමණ පිරිවැයකින් සාර්ථකව නිම කරන ලදී. මෙම ව්‍යාපෘතියෙහි එ.ජ.ඩොලර් දශ ලක්ෂ 120 ක් පමණ වූ විදේශීය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් සැපයුන අතර ඉතිරිය ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදල (වි.ආ.ස.අ.) ඒටීඇන්ඩ්ටී (AT&T) සමාගම, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් සපයන ලදී. දනට ශ්‍රී ලං.ටෙ. සමාගම "විදුලි සංදේශ සංවර්ධන වැඩසටහන 1996-2000 "යන ව්‍යාපෘතිය රුපියල් දශ ලක්ෂ 11,000 ක පමණ පිරිවැයකින් ක්‍රියාත්මක කරමින් සිටින අතර, ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ජපානයේ වි.ආ.ස.අ., ප්‍රංශ සංධානය, සීඩා ආයතනය, කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල යන ආයතන මගින් සපයනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ, මහනුවර, මාතලේ, හැටන් සහ කළුතර යන ප්‍රදේශවල පිහිටි දුරකථන හුවමාරු මධ්‍යස්ථානවල ධාරිතාවය ප්‍රාථමික සංදම යුගල 61,000 කින් වැඩි කිරීම, ගම්පහ ද්විතීයික හුවමාරු මධ්‍යස්ථානයෙහි

ප්‍රාථමික සංදම යුගල ධාරිතාවය 28,500 කින් වැඩිකිරීම, මධ්‍යම කොළඹ දුරකථන හුවමාරු මධ්‍යස්ථානයෙහි ග්‍රාහක මාර්ග 30,000 ක් සහ ප්‍රධාන මාර්ග 12,000 ක් සැපයීම සහ කොළඹ නාගරික ප්‍රදේශයේ යතුරු ධාරිතාවය අතිරේක මාර්ග 36,000 කින් පුළුල් කිරීම ඇතුළත්ය. මීට අමතරව, කොළඹ නාගරික ප්‍රදේශයේ දුරකථන යතුරු ධාරිතාවය අදියර දෙකකින් මාර්ග 144,000 කින් පුළුල් කිරීම සහ ෆයිබර් ඔප්ටික් සංදම සම්ප්‍රේෂණ ක්‍රමයක් ජපානයේ ඒ.ආ.ස.අ. සහයෝගය ඇතිව පිහිටුවීමට ශ්‍රී ලං.ටෙ. සමාගම කටයුතු කරමින් සිටී. එමෙන්ම අඛණ්ඩව ඉහළ යන ඉල්ලුමට මුහුණදීම සඳහා දනට පවත්නා දුරකථන හුවමාරු මධ්‍යස්ථානවල දුරකථන මාර්ග ධාරිතාවය 100,000 කින් පමණ වැඩි කිරීමේ වැඩසටහනක්ද ශ්‍රී ලං.ටෙ. සමාගම විසින් ක්‍රියාත්මක කරමින් සිටී.

ශ්‍රී ලං.ටෙ. සමාගම යටතේ පාලනය වන ශ්‍රී ලංකා විදුලි සංදේශ සේවා සමාගම විසින් සුළු නගර සහ ග්‍රාමීය ප්‍රදේශ ආවරණය කරමින් ප්‍රධාන සංදම යුගල 250,000 ක් සහ දුරකථන හුවමාරු මාර්ග 200,000 ක් පිහිටුවීමේ අරමුණින් සැලසුම් කරන ලද 150K විදුලි සංදේශ සංවර්ධන ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය 1996 දී ආරම්භ කරන ලද අතර, 1998 අවසන් වනවිට, ප්‍රධාන සංදම යුගල 193,000 ක්ද, දුරකථන හුවමාරු මාර්ග 149,200 ක්ද රටේ දුරකථන පද්ධතියට එක්කර තිබුණි. 1998 දී, දුරකථන මාර්ග 68,096 ක ධාරිතාවයෙන් යුත් දුරකථන හුවමාරු මධ්‍යස්ථාන 40 ක් ආරම්භ කරන ලදී. විදුලි සංදේශ පද්ධතියේ හුවමාරු මධ්‍යස්ථානවල ධාරිතාවය සහ ප්‍රාථමික සංදම යුගල ධාරිතාවය වැඩිකිරීමට අමතරව, විදුලි සංදේශ පද්ධතියේ සම්ප්‍රේෂණ ධාරිතාවයද පුළුල් කරන ලදී. 150K ව්‍යාපෘතිය යටතේ, දිස්ත්‍රික්ක 15 ක ප්‍රාදේශීය දුරකථන සම්ප්‍රේෂණ සඳහා ඩිජිටල් තාක්ෂණික පද්ධති 58 ක් සහ ඔප්ටිකල් ෆයිබර් පද්ධති 50 ක් පිහිටුවන ලදී.

1998 වර්ෂය තුළදී, ශ්‍රී ලං.ටෙ.සමාගම විසින් නව සේවා කීපයක් හඳුන්වාදෙන ලදී. පරිගණක ජාලයන් අතර කඩිනමින් දත්ත හුවමාරු කිරීම සඳහා ෆ්‍රේම් රිලේ (Frame Relay) පහසුකම සහ පැකට් ස්විචිං (Packet Switching) තාක්ෂණය හඳුන්වා දෙන ලදී. සාමාන්‍ය දුරකථනයක් යොද ගනිමින් එක්වර කථාකිරීම, ෆැක්ස් පණිවුඩ යැවීම/ලබාගැනීම දත්ත සහ රූප රාමු යැවීම/ලබාගැනීම කළහැකි ISDN පහසුකම් 1998 දී හඳුන්වාදෙන ලදී. මෙම සේවාව මගින් දත්ත සහ රූපරාමු අධිවේගයෙන් යැවීම/ලබාගැනීම, රූප රාමු සහිතව සාකච්ඡා පැවැත්වීම, ඇමතුම් ලැබෙන දුරකථනය හඳුනාගැනීම වැනි පහසුකම්ද සලසයි. පොදු දුරකථන කුටි පිහිටුවීම, අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් සේවා ලබාදීම සහ පැකට් ස්විචිං සේවා සැපයීමෙහි ශ්‍රී ලං.ටෙ. සමාගම තවදුරටත් ක්‍රියාකාරීව සහභාගි වේ. 1998 වර්ෂය අවසන් වනවිට ශ්‍රී ලං.ටෙ. සමාගම පොදු දුරකථන කුටි 1,587 ක් පිහිටුවා තිබිණි. අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් පහසුකම් සඳහා ග්‍රාහකයන් 8,560 ක්ද, පැකට් ස්විචිං පහසුකම් සඳහා ග්‍රාහකයන් 12 ක්ද ශ්‍රී ලං.ටෙ. සමාගමෙහි ලියාපදිංචිව සිටියහ. ග්‍රාහක අවශ්‍යතාවය මත, 1998 අවසන් වනවිට ශ්‍රී ලං.ටෙ. සමාගම විසින් දේශීය දුරකථන මාර්ග 247 ක්ද, ජාත්‍යන්තර දුරකථන මාර්ග 39 ක්ද නිතිපතා භාවිතය සඳහා බද්දට දී තිබිණි. ශ්‍රී ලං.ටෙ. සමාගම විසින් දුරකථන සඳහා මධ්‍යකාලීන ඉල්ලුම් පුරෝකථන මත පදනම්ව වර්ෂ 2002 වනවිට දුරකථන පොරොත්තු ලේඛණයේ සිටින සියලුම ඉල්ලුම්කරුවන්ට දුරකථන සැපයිය හැකිවන පරිදි, 1999-2003 කාලපරිච්ඡේදය ආවරණය වන ලෙස පස් අවුරුදු මධ්‍යකාලීන සැලසුමක්ද සකස්කර ඇත. මෙම සැලසුම යටතේ, ශ්‍රී ලං.ටෙ.සමාගම 1999 වර්ෂයේදී පමණක් රුපියල් බිලියන 20 ක් ආයෝජනය කිරීමට අපේක්ෂා කරයි. විදුලි සංදේශ ව්‍යාපෘති නියමිත පරිදි, කාල පමාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ලබාගත යුතු අවසර ගැනීම් සඳහා කල්ගතවීම, යම් යම් කාර්යයන් සඳහා රජයේ අනුමැතිය ලබාගැනීම සඳහා කල්ගතවීම, බැංකු සහතික ලබා ගැනීමේදී ඇතිවන දුෂ්කරතාවයන් සහ ආරක්ෂක තත්ත්වය හා සම්බන්ධ කාලපමාවන් බාධාවන්ව පවතී.

1998 දී ශ්‍රී ලං.ටෙ. සමාගමේ ආදයම රුපියල් දශ ලක්ෂ 16,388 ක් දක්වා සියයට 19 කින් වැඩිවිය. 1997 දී මුළු ආදයමෙන් සියයට 30 ක් පමණ වූ විදේශ මුදල් ඉපයීම හා සැසඳීමේදී 1998 වර්ෂයේ විදේශ මුදල් ඉපයීම සියයට 33 ක් පමණ විය. දේශීය සහ ජාත්‍යන්තර දුරකථන ඇමතුම් ගාස්තු තුලනය කිරීමේ අපේක්ෂාවෙන්, 1998 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක කරණ ලද ගාස්තු සංශෝධනය, ශ්‍රී ලං.ටෙ. සමාගමේ ආදයම වැඩිවීමට බොහෝදුරට බලපෑවේය. මෙම ගාස්තු සංශෝධනය යටතේ, දුරකථන සඳහා මාසික බද්ද රුපියල් 80 සිට රුපියල් 180 දක්වා වැඩි කරන ලද අතර, මාසික ඇමතුම් ප්‍රමාණය ඒකක 200 ඉක්මවන පාරිභෝගිකයන් සඳහා දේශීය ඇමතුම් ගාස්තුව ඒකකයකට රුපියල් 1.10 සිට රුපියල් 1.65 දක්වා වැඩිකරන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලං.ටෙ. සමාගමේ මෙහෙයුම් පිරිවැය සියයට 25 කින් පමණ වැඩිවූ හෙයින්, එහි බදුවලට පසු ලාභය රුපියල් දශ ලක්ෂ 1,825 දක්වා සියයට 24 කින් පමණ අඩුවිය. 1998 දී ශ්‍රී ලං.ටෙ.හි සේවක සංඛ්‍යාව 8,648 දක්වා සියයට 4 කින් පමණ වැඩිවිය. කෙසේ වෙතත්, වර්ෂය තුළදී නව දුරකථන සැපයුම සීඝ්‍රයෙන් ඉහළ ගිය හෙයින්, එක් සේවකයෙකු වෙනුවෙන් ඇති දුරකථන සංඛ්‍යාව 37.8 සිට 52.7 දක්වා වැඩිවිය.

1998 වර්ෂයේදී විදුලි සංදේශ සේවා ක්‍රියාත්මක කරනු ලබන පෞද්ගලික අංශයේ ආයතනවල ක්‍රියාකාරිත්වයද තවදුරටත් වැඩිදියුණු විය. රේඩියෝ පේජින් සේවාව හැර අනෙකුත් සියලුම පෞද්ගලික විදුලි සංදේශ සේවාවල ග්‍රාහක ජාලය 1998 දී සැලකියයුතු පරිදි පුළුල් විය. වර්ෂය අවසන් වනවිට, ජංගම දුරකථන සේවා සපයනු ලබන සමාගම් 4 යටතේ සිටි ග්‍රාහක සංඛ්‍යාව 174,202 දක්වා සියයට 52 කින් වර්ධනය විය. ජංගම දුරකථන සේවාවල ආයෝජනය කරන ලද මුළු සමුච්චිත ආයෝජන ප්‍රමාණයද රුපියල් දශ ලක්ෂ 8,842 දක්වා සියයට 29 කින් පමණ වැඩිවිය. 1998 වර්ෂය අවසානයට, ශ්‍රී ලං.ටෙ. සමාගම සතු පොදු දුරකථන

කුටි සංඛ්‍යාවද ඇතුලත්ව, ස්ථාපිත කොට තිබූ මුළු පොදු දුරකථන කුටි සංඛ්‍යාව 4,610 දක්වා සියයට 79 කින් පමණ වැඩිවිය. වර්ෂය තුළදී මෙම සේවාව සඳහා නව සමාගමක්ද ප්‍රවේශවීම නිසා මෙම අංශයෙහි සමුච්චිත ආයෝජනය රුපියල් දශ ලක්ෂ 1,090 දක්වා සියයට 52 කින් ඉහළ ගියේය. රේඩියෝ පේජින් සේවාවේ ග්‍රාහක සංඛ්‍යාව වර්ෂය තුළදී සියයට 3 කින් අඩුවිය. ඊට ප්‍රධාන වශයෙන් හේතුවූයේ අනෙකුත් රැහැන් රහිත දුරකථන පහසුකම් භාවිතය පුළුල් වීමයි. මේ අතර, දත්ත සන්නිවේදන සේවා සඳහා ග්‍රාහක සංඛ්‍යාව 19,019 දක්වා සියයට 62 ක තියුණු වර්ධනයක් වාර්තා කළේය. 1998 වර්ෂය තුළදී, රැහැන් රහිත දුරකථන සේවා සපයනු ලබන සමාගම් දෙක විසින් නව සම්බන්ධතා 41,550 ක් සපයන ලදී. මේ අනුව, 1998 වර්ෂය අවසන් වනවිට රැහැන් රහිත දුරකථන සේවා ලබන ග්‍රාහක සංඛ්‍යාව 67,931 දක්වා, සියයට 158 කින් වර්ධනය වූ අතර, මෙම අංශයේ සමුච්චිත ආයෝජනය රුපියල් දශ ලක්ෂ 9,291 දක්වා සියයට 37 කින් වර්ධනය විය. ශ්‍රී ලං.ටෙ.සමාගමේ දුරකථන සහ රැහැන් රහිත දුරකථන යන දෙවර්ගයම සැලකිල්លට ගත්විට දුරකථනයක් සඳහා සිටින පුද්ගලයන් සංඛ්‍යාව 30 දක්වා අඩුවේ. 1998 වර්ෂය අවසානයට පෞද්ගලික විදුලි සංදේශ අංශයෙහි නියුක්තව සිටි මුළු සේවක සංඛ්‍යාව 8,599 කි.

**විශේෂ සටහන 5**

## 2000 වසරේ අභියෝගය

මේ වසරේ සිදු වූ ඉතා වැදගත් ජයග්‍රහණය වන්නේ විද්‍යාවේ හා තාක්ෂණයේ ඇති වූ විශිෂ්ට ඉදිරි ගමනයි. පරිගණක තාක්ෂණයේ හා සන්නිවේදනයේ සිදු වූ ඉදිරි ගමන හේතුවෙන් දුර හා කාලය පිළිබඳ අපගේ ප්‍රත්‍යක්ෂයන් දැඩි වෙනසකට භාජනය විය. මීළඟ සහශ්‍ර වර්ෂයේදී විද්‍යාව හා තාක්ෂණය භාවිතයේ නව නවත් විකාශණයන් හා අධිගමනයන් අපේක්ෂා කෙරේ.

එබැවින් මේ තාක්ෂණික අභිවර්ධනයට 2000 වර්ෂයේ ප්‍රශ්නයක් ජනිත කිරීම ඉතිහාසයේ සරදමක් වී තිබේ. බොහෝ යන්ත්‍රෝපකරණවලට යොදගෙන තිබෙන පරිගණක දෘඩාංග, මෘදුකාංග හා ක්ෂුද්‍ර පරිපථවල වර්ෂය සටහන් කිරීමට ඉලක්කම් දෙකක් භාවිතා කිරීමට සැළසුම් කර තිබෙන නිසා ඒවාට වර්ෂ 2000 මාරු වීම හඳුනා ගැනීමට නොහැකි වීමෙන් මේ ප්‍රශ්නය ඇති වී තිබේ. මෙම ප්‍රශ්නයට මුහුණ දීම නිසා පරිගණක වික්ෂිප්ත භාවයට පත් වීම, වැරදි ලෙස ක්‍රියා කිරීම හෝ සම්පූර්ණයෙන් අක්‍රීය තත්ත්වයට පත් වීම හෝ සිදු විය හැකිය.

මෙය හුදෙක් තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රශ්නයක් පමණක්ම නොව ව්‍යාපාරික ප්‍රශ්නයක් ලෙසටද හඳුනාගෙන තිබේ. එක රටකට හෝ සමාජයේ එක අංශයකට සීමා නොවූ ලෝකයේ ජීවත් වන සියළු මිනිසුන්ගේ දිනපතා ජීවිතයට බලපාන ප්‍රශ්නයක් බවටද පත් වී තිබේ. එමනිසා, මෙම ගැටළුව විසඳීමට අවශ්‍ය කටයුතු කිරීම සෑම ආයතනයකම වගකීමක් වී තිබේ.

විසඳුම තාක්ෂණික එකකි. දනට ක්‍රියාත්මක වෙමින් ඇති පද්ධති තුළ තිබෙන ප්‍රශ්න පැන නැඟෙන අවස්ථා සොයමින් ඒවා නිවැරදි කිරීම අපහසු හා කාලය ගත වෙන කටයුත්තකි. අනුගත වීමේ කඩයිම නිශ්චිත වී තිබෙන බැවින් (1999.12.31) කාලය දිගු කිරීමටද කිසිදු හැකියාවක් නොමැත. පිළියම් යෙදීමට අපහසු අවස්ථාවලදී නව පද්ධති යොද ගැනීමට සිදු වේ. උපස්ථ සැළසුම්ද ස්ථාපිත කළයුතුය. එනිසා මෙහි විසඳුම මූල්‍ය හා මානුෂික සම්පත් අධික ලෙස වැය වෙන ඉතා වෙහෙසකාරී කටයුත්තක් වී තිබේ.

1998 ජූලි 14 වෙනි දින "2000 වර්ෂයේ විවාදාත්මක ප්‍රශ්නය" මැයෙන් වොෂින්ටනයේ ජාතික විද්‍යා ඇකඩමිය ඇමතූ ජනාධිපති බිල් ක්ලින්ටන්, මෙම ප්‍රශ්නයේ තිබෙන සංකීර්ණ ස්වභාවය අවධාරණය කරන ලදී."එකිනෙක හා බැඳී පවතින සිය දහස් ගණන් ආයතනවල සියක් කෝටි ගණන් ක්‍රම ලේඛණ පේළි නැවත ලිවීම සඳහා පැය දස ලක්ෂ ගණනින් වැය කිරීමට අවශ්‍ය වීමත් සමඟ මෙය, ඉතිහාසයේ කළමනාකරණය සම්බන්ධයෙන් ඇති වූ ඉතා සංකීර්ණ ප්‍රශ්නයන්ගෙන් එකක් බවට පත්ව ඇතැයි" පැවසීය.

" එක් ප්‍රධාන බැංකුවක් වූ චේස් මැන්හැටන් බැංකුව ගැන පමණක් හිතන්න. එය තම ක්‍රම ලේඛණ පේළි දස ලක්ෂ 200 ක් පරීක්ෂා කළ යුතුය. පෞද්ගලික පරිගණක 70,000 ක් පරීක්ෂා කළ යුතුය. සැපයුම් කරුවන් 600 කගෙන් ලබා ගත් මෘදුකාංග පැකේජ 1,000 ක් පරීක්ෂණයට ලක් කළ යුතුය".

මෙම ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ එතරම් ව්‍යාප්ත වුවක් නොවන්නට හැකිය. කෙසේ වුවත් රජයේ ආයතනවලට, බැංකුවලට හා මූල්‍ය අංශයට, ගුවන්තොටුපලවලට, වරායවලට, සන්නිවේදනයට හා බලශක්තිය යනාදියට මෙයින් ඇති වන බලපෑම දැඩි ස්වභාවයක් ගන්නා අතර ආර්ථිකයට හා ජනතාවගේ එදිනෙද ජීවිතයටද අවහිරතා ඇති වීමට ඉඩ තිබේ.

කැබිනට් නිර්දේශයක් මත 1998 මැයි මාසයේදී, 2000 වර්ෂයේ ප්‍රශ්නය ගැන ක්‍රියා කිරීමේදී රජයේ ආයතනවල සිදු කෙරෙන කටයුතු හැසිරවීමට හා මඟ පෙන්වීමට තොරතුරු තාක්ෂණ කවුන්සිලයේ (සින්ටෙක්) පාලනය යටතේ ක්‍රියාත්මක වෙන ජාතික කාර්ය සාධන

**විශේෂ සටහන 5 (සම්බන්ධයි)**

බලකායක් පත් කරන ලදී. ඊට අමතරව, 2000 වර්ෂයේ ප්‍රශ්ණය විසඳීම සඳහා ගන්නා ක්‍රියා මාර්ගයේ වර්ධනය නිරීක්ෂණය කිරීමට හා බැංකු හා මුදල් අංශයේ කටයුතු හැසිරවීමට උපයෝගී කර ගැනීම සඳහා තවත් කාර්ය සාධන බලකායක් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළතද පිහිටුවන ලදී.

මූල්‍ය අංශයද ඇතුළුව රජයේ හා පෞද්ගලික අංශයේ ආයතන සපයනු ලැබූ තොරතුරු පදනම් කරගෙන එම ආයතනයන්හි 2000 වර්ෂයේ කටයුතු සඳහා සිදු කෙරෙන සූදානම පිළිබඳ වාර්තාවක් ජාතික කාර්ය සාධන බලකාය විසින් 1998 දෙසැම්බර් 16 වෙනි දින ජනාධිපතිතුමිය වෙත ඉදිරිපත් කරන ලදී.

මහ බැංකුව, 1998 මැයි මාසයේදී බැංකු වෙත, ඔවුන් විසින් ඉටු කළයුතු කාර්යයන්ද ඒවා අවසන් කළයුතු දිනයද දනුම් දෙන ලදී. එක්සත් රාජධානියේ මූල්‍ය සේවා අධිකාරිය බැංකු කටයුතුවල 2000 වර්ෂයේ ව්‍යාපෘතිය විමර්ශනය කොට වාර්තා කිරීම සඳහා වූ විශේෂඥ සේවාවක නියුක්ත විය. 1998 අගෝස්තු මාසයේදී බැංකු හා මූල්‍ය ආයතනවල අධ්‍යක්ෂවරුන් ඇතුළත් වූ ඉහළ පෙළේ කළමනාකරුවන් අතර මේ පිළිබඳව දනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. සාමාන්‍ය ජනයා දනුවත් කිරීමේ දන්වීමක්ද දිනපතා පුවත්පත්වල පළ කරන ලදී.

1999 ජූනි මාසය වනවිට රටේ තිබෙන සියළු බැංකු තම පද්ධති 2000 වර්ෂයේ වෙනස් වීමට මුහුණ දීමට සූදනම් කර හා ඒවා පරීක්ෂාකරද තැබිය යුතුය යන ඉලක්කය වෙත ළඟා වීමට මහ බැංකුව කටයුතු කරමින් සිටී. මහ බැංකුව තමන්ගේ පද්ධති පිළියම් කිරීමේ කටයුතු 1996 දී ආරම්භ කරන ලද අතර දන් ඒවායේ 2000 වර්ෂ අනුගත වීම පිළිබඳව සූක්ෂම ලෙස විමර්ශනය කරමින් සිටී. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ හා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එකතු වී වාණිජ බැංකු හා විශේෂිත බැංකුවල ක්‍රියාත්මක වෙන 2000 වර්ෂ පිළියම් කිරීමේ කටයුතු නිරන්තරයෙන් විමර්ශනයට ලක් කරමින් සිටී.

සෑම ආයතනයකටම 2000 වර්ෂ අනුගත කිරීම සඳහා පිළියම් යෙදිය යුතුව තිබෙන තමන්ගේ සියළුම කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීම කළ නොහැකි දෙයක් වුවද, කාර්යමය වශයෙන් තීරණාත්මක වූ හෙවත් තම ව්‍යාපාරය නොකඩවා පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය වූ යෙදුම්වලට පිළියම් යෙදීම, ඒවා පරීක්ෂා කර නිවැරදි බව සනාථ කිරීම හා එම පිළියම් විගණනය කිරීම අවශ්‍යයෙන්ම සිදු කළයුතුව ඇත.

මෙය තරඟකාරීව කටයුතු කරන සියළු දෙනාම එකතු වී, පොදු අරමුණක් ළඟා කර ගැනීම සඳහා ක්‍රියා කළයුතුව තිබෙන අවස්ථාවකි. එක් අයෙකුගේ ප්‍රශ්නයක් අනික් අයට අහිතකර ලෙස බලපෑ හැකිය. සෑම ආයතනයක්ම 2000 වර්ෂයට අනුගත වීමේ අරමුණ ඉටු කර ගැනීම සඳහා තම තමන්ගේ තොරතුරු හා සම්පත් අනික් අය සමඟ හුවමාරු කර ගනිමින් පොදු උත්සාහයක යෙදිය යුතුය. තමන්ගේ පරිගණක පද්ධති සියල්ලට අවශ්‍ය කරන පිළියම් යොද ගනු ලැබුවද බලශක්තිය හෝ සන්නිවේදනය නිසි ලෙස ක්‍රියාත්මක නොවුවහොත් බැංකුවලට තම කටයුතු අවහිරයකින් තොරව කරගෙන යාමට හැකි නොවෙනු ඇත. රටවල්වල පවතින මූල්‍ය ක්‍රියාදමයන් අධික ලෙස අන්‍යොන්‍යව රඳ පැවතීමේ හේතුවෙන් එක රටක කටයුතුවල ඇතිවන බිඳ වැටීමක් අනික් රටවලටද අහිතකර ලෙස බලපෑ හැකිය.

බොහෝ ජාත්‍යන්තර ආයතන දියුණු වෙමින් පවතින රටවලට ආධාර සැපයීමේ කටයුතුවල නිරතව සිටී. ජාත්‍යන්තර පියවීමේ කටයුතු සඳහා වූ බැංකුව සතුව අවශ්‍ය තොරතුරු හා මඟ පෙන්වීම් ලබා දෙන, කළයුතුව තිබෙන කාර්යයන්ගේ පිරික්සුම් ලැයිස්තු සපයන හා වැදගත් ආයතනවල දනට ක්‍රියාත්මක වෙමින් තිබෙන 2000 වර්ෂ ව්‍යාපෘතීන්ගේ තත්ත්වය දනුම් දෙන වෙබ් අඩවියක් තිබේ.

ලෝක බැංකුව සිය " ඉන්ෆොඩෙව් " සැළසුම යටතේ ආධාර අවශ්‍ය කරන සෑම දියුණු වෙමින් පවතින රටකටම ඇමෙරිකන් ඩොලර් 500,000/- ක සැළසුම් ක්‍රියාත්මක කිරීමේ දීමනාවක්ද සපයනු ලැබේ. සිය ආර්ථිකයේ 2000 වර්ෂ ප්‍රතිකර්ම යෙදීමේ සැළසුම ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකාව ඇමෙරිකන් ඩොලර් 100,000/- වූ සැළසුම් සකස් කිරීමේ දීමනාව දනටම ලබාගෙන තිබේ. සින්ටෙක් ආයතනය මඟින් මෙය ප්‍රයෝජනයට ගත හැකි වේ. සින්ටෙක් ආයතනය සැළසුම් ක්‍රියාත්මක කිරීමේ දීමනාව ලබා ගැනීම සඳහාද යෝජනාවක් සූදනම් කරමින් සිටී. මීට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය අංශයට හා තවත් අත්‍යාවශ්‍ය ආයතනවලට මෙම ප්‍රශ්නයට මුහුණ දීමට උපකාර කිරීම සඳහා ලෝක බැංකුවෙන් ණයක්ද ඉල්ලුම් කරන ලදී. ඉල්ලීම ඉදිරිපත් කල දිනයේ සිට තුන් මාසයක් තුළදී ලෝක බැංකුව තම සාමාන්‍ය ක්‍රියාපටිපාටීන් බොහොමයක් ලිහිල් කරමින් මෙම ණය ලබා දීමට කටයුතු කරන ලදී. ඇමෙරිකන් ඩොලර් දශ ලක්ෂ 29 ක් වූ මෙම මෘදු ණය ශ්‍රී ලංකාවට බොහෝදුරට වාසි සහගත කොන්දේසි හා නියමයන් යටතේ ලබා දී තිබේ. මෙම මුදල් බැංකුවලට හා රජයේ වැදගත් ආයතනවලට ලබාගත හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් ඇතුළත් වන, බැංකු ක්ෂේත්‍රය සඳහා වූ ඒකකයකින්ද, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළත් වන, රාජ්‍ය අංශයේ ආයතන සඳහා වූ ඒකකයකින්ද යුත් ව්‍යාපෘති සම්බන්ධතා ඒකක දෙකක් මඟින් මෙම ණය මුදල් බෙද හැරීම පාලනය කරනු ඇත.

මෙය, ලෝකයට සාමූහික උත්සාහයෙන් මුහුණ දීමට සිදු වී තිබෙන විශාලතම පරිපාලන අභියෝගය බවට සැකයක් නැත. මෙයින් සාර්ථකව ජය ගැනීමට නම් සෑම අයෙක්ම තමන් වෙත පැවරී තිබෙන වගකීම නිසි ලෙස ඉටු කළයුතු වේ. සාමූහිකව හා කඩිනමින් කටයුතු කිරීමෙන් මෙම අභියෝගය ජය ගනු හැකිවනු ඇත.

## 5.5 බලශක්තිය

ලෝක වෙළෙඳපොළෙහි බණිජතෙල් නිෂ්පාදිත මිල ගණන් පහත වැටීමත්, ජලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශවලට සතුටුදායක වර්ෂාපතනයක් ලැබීමත් හේතුවෙන් බලශක්ති අංශයෙහි සතුටුදායක ප්‍රගතියක් දක්නට ලැබිණි. 1998 දී ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) විසින් පවත්නා ජල විදුලිබල ධාරිතාවයෙන් සියයට 98 ක්ම උපයෝජනය කරගනු ලැබූ අතර, එමගින් ගි.වො.පැය දශ ලක්ෂ 3,908 ක් උත්පාදනය කළේය. 1998 දී මෙ.වො.51 ක ධාරිතාවයෙන් යුත් පෞද්ගලික විදුලි බලාගාරයක් BOO පදනම යටතේ ආරම්භ කිරීමත් සමග, තාපබල උත්පාදන ධාරිතාවය මෙ.වො.497 දක්වා වැඩිවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත විදුලිබල උත්පාදන ධාරිතාවය මෙ.වො. 1,636 දක්වා සියයට 4 කින් වර්ධනය විය. මෙමගින්, පිරිවැය අධික කුලියට ගත් විදුලි බලාගාර භාවිතය 1998 මැයි මාසයේ සිට සම්පූර්ණයෙන්ම නතර කිරීමට ලං.වි.ම. ට හැකිවිය. වර්ෂය තුළදී ස්වයං විදුලිබල උත්පාදනයද සැලකියයුතු පරිදි අඩුකරන ලදී. 1998 දී විදුලිබල ඉල්ලුම ගි.වො.පැය 4,509 දක්වා සියයට 12 කින් වර්ධනය විය.

ජල විදුලිබලය මත ඇති අධි-රැඳියාව අඩුකිරීම සඳහා, රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම සහභාගිත්වයෙන් තාප විදුලිබල ධාරිතාවය පුළුල් කිරීම සම්බන්ධයෙන් පසුගිය වර්ෂවලදී විශේෂ අවධානය යොමු කරන ලදී. ජාතික විදුලිබල ප්‍රතිපත්තිය මගින්ද, විදුලිබල සැපයුම ඉහළ නැංවීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන ධෛර්‍යමත් කිරීම තුළින් මෙම අංශයේ ආයෝජන ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගැනීමත්, අඩු මිල ගණන් යටතේ පාරිභෝගිකයාට විදුලිබලය ලබාදීමත් එහි ප්‍රධාන අරමුණු වශයෙන් ප්‍රකාශයට පත්කොට ඇත. මේ යටතේ, විශේෂයෙන්ම තාපබල උත්පාදනය සහ කුඩා ජල විදුලි බලාගාර පිහිටුවීම යන ක්ෂේත්‍රවල ප්‍රධාන කාර්යභාරයක් පෞද්ගලික අංශයෙන් අපේක්ෂා කෙරේ.

### විදුලි බලය

1998 දී ස්ථාපිත විදුලිබල උත්පාදන ධාරිතාවය මෙ.වො.1,636 දක්වා සියයට 4 කින් වැඩිවිය. මෙම වැඩිවීමට සම්පූර්ණයෙන්ම දායක වූයේ පෞද්ගලික ස්වාධීන විදුලිබල උත්පාදකයින්වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු ස්ථාපිත විදුලිබල ධාරිතාවයෙන්, ජල විදුලිබලය මත ඇති රැඳියාව පසුගිය වර්ෂයේදී සියයට 72 සිට 1998 අවසානයේදී සියයට 69 දක්වා තවදුරටත් අඩුවිය. ඒසියා පවර් පුද්ගලික සමාගම විසින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 62 ක පිරිවැයකින් ඉදි කරන ලද මෙ.වො. 51 ක ඩීසල් විදුලි බලාගාරයේ විදුලිබල උත්පාදනය 1998 මැයි මාසයේදී ආරම්භ කරන ලදී. මාලබේ ප්‍රදේශයේ මෙ.වො.8.2 ක ඩීසල් විදුලි බලාගාරයක් ක්‍රියාත්මක කරන කුල් එයාර් වෙන්චර්ස් පෞද්ගලික සමාගම විසින් මෙ.වො.10 ක නව විදුලි බලාගාරයක්, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 10 ක පිරිවැයකින් කන්කසන්තුරය ප්‍රදේශයේ, 1998 නොවැම්බර් මාසයේදී ඉදි කරන ලදී. කෙසේ වෙතත්, විදුලිබලය සම්ප්‍රේෂණය කිරීමේ සහ බෙදාහැරීමේ විදුලි රැහැන් ප්‍රතිසංස්කරණය කිරීම සම්පූර්ණ කර නොමැති බැවින් මෙම විදුලි බලාගාරයේ උත්පාදන ධාරිතාවය ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට නොගැනේ. මේ අතර, කුඩා ජල විදුලි බලාගාර දෙකක් වන රිටිගහඔය (මෙ.වො.0.112) සහ රක්වාන ගඟ (මෙ.වො.0.76) ව්‍යාපෘති වර්ෂය තුළදී නිම කිරීමත් සමග පෞද්ගලික ජල විදුලිබල උත්පාදන ධාරිතාවය මෙ.වො.2.2 දක්වා වැඩිවිය.

ලං.වි.ම. ට වාර්තා කර ඇති ස්වයං විදුලිබල උත්පාදනයද ඇතුලත්ව, 1998 දී උත්පාදනය කරන ලද මුළු විදුලිබල ප්‍රමාණය ගි.වො.පැය 5,673 ක් දක්වා සියයට 10 කින් වර්ධනය විය. 1997 දී විදුලිබල උත්පාදනය සියයට 14 කින් වැඩිවිය. මුළු විදුලිබල උත්පාදනයෙන් සියයට 69 ක්වූ ජල විදුලිබල උත්පාදනය පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 6 ක වර්ධනය හා සැසඳීමේදී 1998 දී සියයට 14 කින් වර්ධනය විය. 1993 ට පසු වාර්තා වූ ඉහළම වර්ධනය මෙය වේ. තාපබල උත්පාදනය ද තවදුරටත් සියයට 18 කින් වැඩිවිය. ලං.වි.ම.යේ විදුලි බලාගාර වලින් උත්පාදනය කරන ලද විදුලිබල ප්‍රමාණය 1998 දී සියයට 15 කින් වර්ධනය විය. මේ අතර, පෞද්ගලික අංශයේ විදුලිබල උත්පාදනය 1997 දී ගි.වො.පැය 17 සිට 1998 දී ගි.වො.පැය 393 දක්වා තියුණු ලෙස වැඩිවිය. මෙයට හේතුවූයේ 1997 වර්ෂයේ අවසානයේදී ආරම්භ කෙරුණු ලක්දනාව් විදුලි බලාගාරය (මෙ.වො.22.5) 1998 වර්ෂය පුරාම ක්‍රියාත්මක වීමත්, ඒසියා පවර් විදුලි බලාගාරය (මෙ.වො.51), එය ආරම්භ කෙරුණ මැයි මාසයේ සිට අඛණ්ඩව විදුලිබලය උත්පාදනය කිරීමත්ය. ලක්දනාව් විදුලි බලාගාරයට වර්ෂයකට ගි.වො.පැය 168 ක විදුලිබලය උත්පාදනය කළහැකි අතර, ඒසියා පවර් විදුලි බලාගාරයට වර්ෂයකට ගි.වො.පැය 330 ක් උත්පාදනය කළහැකි ය. මේ අතර, කලින් සැලසුම් කර තිබූ පරිදි 1998 මාර්තු සිට ජූනි මාසය දක්වාත්, දෙසැම්බර් මාසයේදීත්, ස්වයං විදුලිබල උත්පාදනය සඳහා ලං.වි.ම. විසින් අවසර දෙන ලදී. මේ අනුව, 1998 දී වාර්තා වූ ස්වයං විදුලිබල උත්පාදන ප්‍රමාණය ගි.වො.පැය 108 ක් වූ අතර, එය 1997 සමග සැසඳීමේදී සියයට 54 ක අඩුවීමකි. 1997 ජූලි මාසයේ සිට විදුලිබල උත්පාදනය සඳහා ලං.වි.ම. ට අවශ්‍ය ඉන්ධන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් තීරුබදු රහිත මිලට සැපයීම නිසා ලං.වි.ම. යේ සහ කුලියට ගත් තාප විදුලිබලාගාරවල ඉන්ධන පිරිවැය රුපියල් දශ ලක්ෂ 2,751 දක්වා සියයට 49 කින් පමණ පහත වැටිණි. මේ අතර 1998 දී මිලට ගත් විදුලිබල ප්‍රමාණය ඉහළයාම නිසා, පෞද්ගලික ස්වාධීන විදුලිබල උත්පාදකයින්ගෙන් ලං.වි.ම. මිලට ගත් විදුලි බලය සඳහා වූ පිරිවැය රුපියල් දශ ලක්ෂ 1,776 ක් විය. විදුලිබලය මිලට ගැනීමේ ගිවිසුම්වලට අනුව ලං.වි.ම. විසින් වර්ෂයකට අවම වශයෙන් ලක්දනාව් බලාගාරයෙන් ගි.වො.පැය 168 ක්ද, ඒසියා පවර් බලාගාරයෙන් ගි.වො.පැය 330 ක්ද මිලට ගතයුතු වන අතර ඒ සඳහා ඒකකයකට ගෙවන මිල මූල්‍ය ගාස්තුව/ධාරිතා ගාස්තුව, ඉන්ධන ගාස්තුව, ක්‍රියාත්මක කිරීමේ ගාස්තුව සහ ගෙවිය යුතු බදු ආදිය සැලකිල්ලට ගැනීමෙන් පසු තීරණය කෙරේ. 1998 වර්ෂයේදී ලං.වි.ම. විසින් විදුලිබලය මිලට ගැනීමේ සාමාන්‍ය මිල විදුලි ඒකකයක් සඳහා රුපියල්

**5.5 සංඛ්‍යා සටහන**

**බලශක්ති අංශයේ මූලික ලක්ෂණ**

| ශීර්ෂය | ඒකක | 1996 | 1997 | 1998(අ) | ප්‍රතිශත වෙනස 1997 | ප්‍රතිශත වෙනස 1998 |
|---|---|---|---|---|---|---|
| 1. විදුලිය | | | | | | |
| පවත්නා ධාරිතාව | මෙගවොට් | 1,453 | 1,595 | 1,636 | 10 | 3 |
| ස්ථාපිත ධාරිතාව | · | 1,409 | 1,575 | 1,636 | 12 | 4 |
| ලං.වි.ම. - ජලබලය | · | 1,137 | 1,137 | 1,137 | 0 | 0 |
| තාප බලය | · | 272 | 405 | 405 | 49 | 0 |
| පෞද්ගලික - ජලබලය | · | - | 1.5 | 2.2 | - | 47 |
| තාප බලය | · | - | 30.7 | 92.7 | - | 199 |
| කුලියට ගත් පෞද්ගලික | · | 44 | 20 | 0 | -55 | -100 |
| ජනනය කළ ඒකක | ගිගවොට් පැය | 4,530 | 5,145 | 5,673 | 14 | 10 |
| ලං.වි.ම. - ජල බලය | · | 3,249 | 3,443 | 3,908 | 6 | 14 |
| තාප බලය | · | 974 | 1,052 | 1,246 | 8 | 18 |
| පෞද්ගලික-ජල බලය | · | 3 | 4 | 5 | 33 | 25 |
| තාප බලය | · | - | 13 | 388 | - | 2,885 |
| පෞද්ගලික අංශයේ බලශක්තිය | · | 152 | 398 | 18 | 162 | -95 |
| ස්වයං තාපබල උත්පාදනය | · | 152 | 235 | 108 | 55 | -54 |
| මුළු අලෙවිය | · | 3,740 | 4,039 | 4,509 | 8 | 12 |
| ගෘහස්ත | · | 1,046 | 1,213 | 1,368 | 16 | 13 |
| කාර්මික (ආ) | · | 1,513 | 1,430 | 1,612 | -5 | 13 |
| වාණිජ | · | 592 | 689 | 757 | 16 | 10 |
| පළාත් පාලනා ආයතන | · | 542 | 657 | 722 | 21 | 10 |
| වීදි ආලෝක කිරීම | · | 47 | 50 | 50 | 6 | 0 |
| 2. ඛනිජතෙල් නිෂ්පාදන | | | | | | |
| ආනයනය කළ ප්‍රමාණය | | | | | | |
| බොරතෙල් | මෙ.ටො. '000 | 2,033 | 1,814 | 2,034 | -11 | 12 |
| පිරිපහදු නිෂ්පාදන | · | 729 | 1,084 | 692 | 49 | -36 |
| එල්.පී.ගෑස් | · | 71 | 87 | 98 | 23 | 13 |
| ආනයන වටිනාකම (මි.ගැ.) | | | | | | |
| බොරතෙල් | රු.දශලක්ෂ | 16,809 | 15,584 | 13,240 | -7 | -15 |
| | එ.ජ.ඩො.දශලක්ෂ | 304 | 263 | 205 | -13 | -22 |
| පිරිපහදු නිෂ්පාදන | රු.දශලක්ෂ | 8,465 | 12,467 | 5,966 | 47 | -52 |
| | එ.ජ.ඩො.දශලක්ෂ | 153 | 212 | 92 | 39 | -57 |
| එල්.පී.ගෑස් | රු.දශලක්ෂ | 1,237 | 1,635 | 1,568 | 32 | -4 |
| | එ.ජ.ඩො.දශලක්ෂ | 22 | 28 | 24 | 27 | -14 |
| බොරතෙල් බැරලයක | රු./බැරල් | 1,116 | 1,155 | 884 | 3 | -23 |
| සාමාන්‍ය මිල (මි.ගැ.) | එ.ජ.ඩො./බැරල් | 20.19 | 19.42 | 13.63 | -4 | -30 |
| | | 661 | 547 | 468 | -17 | -14 |
| | | 5,740 | 6,131 | 4,665 | 7 | -24 |
| | | 104 | 95 | 72 | -9 | -24 |
| දේශීය අලෙවිය | මෙ.ටො.'000 | 2,120 | 2,321 | 2,436 | 9 | 5 |
| පෙට්‍රල් | · | 197 | 193 | 203 | -2 | 5 |
| සුදු ඩීසල් | · | 1,048 | 1,295 | 1,181 | 24 | -9 |
| බැර ඩීසල්(ඇ) | · | 87 | - | - | - | - |
| සුපිරි ඩීසල් | · | 26 | 33 | 38 | 27 | 15 |
| භූමිතෙල් | · | 228 | 225 | 235 | -1 | 4 |
| දැවි තෙල් | · | 336 | 372 | 551 | 11 | 48 |
| ගුවන්යානා ඉන්ධන | · | 110 | 104 | 111 | -5 | 7 |
| එල්.පී.ගෑස් | · | 88 | 99 | 117 | 13 | 18 |
| දේශීය මිල | | | | | | |
| පෙට්‍රල් | රු./ලීටර | 50.00 | 50.00 | 50.00 | 0 | 0 |
| සුදු ඩීසල් | · | 13.20 | 13.20 | 13.20 | 0 | 0 |
| බැර ඩීසල් | · | 11.70 | - | - | - | - |
| සුපිරි ඩීසල් | · | 18.50 | 18.50 | 18.50 | 0 | 0 |
| භූමිතෙල් | · | 10.40 | 10.40 | 10.40 | 0 | 0 |
| දැවි තෙල් | | | | | | |
| 500 | · | 7.80 | 7.80 | 7.80 | 0 | 0 |
| 800 | · | 7.50 | 7.50 | 7.50 | 0 | 0 |
| 1,000 | · | 7.20 | 7.20 | 7.20 | 0 | 0 |
| එල්.පී.ගෑස් | රු./කි.ග්‍රෑ. | 22.30 | 23.07 | 23.07 | 3 | 0 |

(අ) තාවකාලික
(ආ) ස්වයං තාපබල උත්පාදනය ඇතුලත් නැත
(ඇ) 1996 ජූනි මාසයේ සිට බැර ඩීසල් අලෙවිය සුදු ඩීසල් යටතේ වර්ග කර ඇත.

මූලය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා විදුලිබල මණ්ඩලය
ෂෙල් ගෑස් ලංකා සමාගම
ලංකා මෙරයින් සර්විසස් (පෞද්ගලික) සමාගම

4.58 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1998 දී පැවැති සාමාන්‍ය විදුලිබල ගාස්තුව වූ රුපියල් 4.47 ට වඩා සුළු වශයෙන් ඉහළ අගයකි. කෙසේ වෙතත්, මෙය ලං.වි.ම. ට ප්‍රධාන ප්‍රශ්නයක් නොවූයේ අඩු පිරිවැයක් සහිත ජල විදුලිබලය සම්පූර්ණයෙන්ම මෙන් උපයෝජනය කරගැනීමට හැකි වීමත්, තීරුබදු රහිත මිලට ඉන්ධන ලැබීම වැනි වක්‍ර පිහිටාධාර ලබාගැනීමට හැකිවීමත් නිසාය. කෙසේ වෙතත්, මිලට ගන්නා ලද විදුලිබල ප්‍රමාණය මුළු විදුලිබල උත්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට (සියයට 7 ක් පමණ) සැලකියයුතු ප්‍රමාණයක් නොවේ.

1998 දී සාමාන්‍ය විදුලිබල ගාස්තුව සියයට 8 කින් පමණ වැඩිවිය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ 1997 සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි විදුලිබල ගාස්තු සියයට 11 කින් පමණ වැඩි කිරීමයි. මීට අමතරව, මසකට විදුලි ඒකක 90 කට වඩා පරිභෝජනය කරනු ලබන පාරිභෝගිකයන්ගේ විදුලි බිල්පත්වලට භාණ්ඩ හා සේවා බද්ද පැනවීමද, සාමාන්‍ය විදුලිබල ගාස්තුව වැඩිවීමට බලපෑවේය. දනට පවත්නා විදුලිබල ගාස්තු ක්‍රමය යටතේ, වාණිජ සහ කර්මාන්ත අංශ මගින් ගෘහස්ත පාරිභෝගිකයන් වෙත ඉහළ මට්ටමක හරස්-පිහිටාධාරයක් සපයනු ලබයි. පොළී ගෙවීම් රහිතව, විදුලි ඒකකයක සාමාන්‍ය පිරිවැය රුපියල් 3.50 ක් වී තිබියදීත්, සාමාන්‍ය ගෘහස්ත විදුලිබල ගාස්තුව ඒකකයකට රුපියල් 3.11 ක් විය. වාණිජ අංශය සඳහා සාමාන්‍ය විදුලිබල ගාස්තුව ඒකකයකට රුපියල් 7.00 ක් වූ අතර එය සාමාන්‍ය පිරිවැය මෙන් දෙගුණයක් විය. කර්මාන්ත අංශය සඳහා සාමාන්‍ය විදුලිබල ගාස්තුව ඒකකයකට රුපියල් 5.20 ක්වූ අතර එය සාමාන්‍ය පිරිවැයට වඩා සියයට 49 කින් වැඩි අගයක් විය. තාප විදුලිබලය මත ඇති රැඳියාව ක්‍රමයෙන් වැඩිවන හෙයින්, විදුලිබල උත්පාදනයෙහි පිරිවැය ඉහළ යමින් පවතී. කෙසේ වෙතත්, 1998 දී විදුලිබල ගාස්තු නැවත වරක් වැඩිකිරීමේ අවශ්‍යතාවය, තාපබල උත්පාදනය සඳහා අවශ්‍ය ඉන්ධන තීරුබදු රහිත මිලට සැපයීමට රජය එකඟවීම නිසා වළක්වා ගැනීමට හැකිවිය. එමෙන්ම කලින් ලං.වි.ම. විසින් ගෙවමින් සිටි ව්‍යාපාර පිරිවැටුම් බද්ධ සඳහා ගැලපුම් කිරීමකින් තොරව, නව භාණ්ඩ හා සේවා බද්ද පාරිභෝගිකයා මත පැවරීමට හැකිවීමෙන්ද ලං.වි.ම. ප්‍රතිලාභ ලැබීය. මූලික වශයෙන් ඉහතින් සඳහන් කළ කරුණු හේතුකොටගෙන විදුලිබල ඒකකයක් උත්පාදනය කිරීමේ සාමාන්‍ය පිරිවැය 1997 දී රුපියල් 4.50 සිට 1998 දී රුපියල් 3.50 දක්වා පහත වැටිණි. කෙසේ වෙතත්, මෙවැනි අපැහැදිලි සහ විනිවිද භාවයෙන් තොර ගාස්තු සංශෝධන මගින් ලං.වි.ම.යේ මිල ප්‍රතිපත්තියෙහි පවත්නා දුර්වලතා සඳහා කල්පවත්නා විසඳුමක් ලබාගැනීමට දුෂ්කර වනු ඇත. ලං.වි.ම. යේ මිල ප්‍රතිපත්තිය තාර්කික කිරීම සඳහා විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙද හැරීමේ ආර්ථික පිරිවැය මත පදනම් වූ පැහැදිලි ක්‍රියාමාර්ගයක් අවශ්‍ය කෙරේ.


1998 දී මුළු විදුලිබල පරිභෝජනය ගි.වො.පැය 4,509 දක්වා සියයට 12 කින් වැඩි වූ අතර, ඊට ප්‍රධාන වශයෙන් හේතුවූයේ පාරිභෝගික ජාලය පුළුල් වීමයි. ගෘහස්ත අංශය සඳහා අලෙවි කළ විදුලිබල ප්‍රමාණය ගි.වො.පැය 1,368 දක්වා සියයට 10 කින් වැඩිවූ අතර, සීමාසහිත ලංකා විදුලිබල සමාගමේ (ලං.වි.ස.) පාරිභෝගිකයන්ද ඇතුළුව මුළු ගෘහස්ත පාරිභෝගික සංඛ්‍යාව 2,053,833 දක්වා සියයට 10 කින් පුළුල් විය. (මුළු විදුලිබල අලෙවියෙන් සියයට 10 ක් පමණ ලං.වි.ස. මගින් අලෙවි කරනු ලැබේ.) ගෘහස්ත පාරිභෝගික ජාලයෙහි මෙම පුළුල්වීමට ප්‍රධාන වශයෙන් මෑතකදී නිම කරන ලද ග්‍රාමීය විදුලිබල යෝජනාක්‍රම දායක විය. 1998 වර්ෂය අවසන් වනවිට විදුලිබලය සපයා ඇති නිවාස සංඛ්‍යාව, මුළු නිවාස සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට සියයට 52 ක් පමණ වන බව ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, මෑතකදී ලං.වි.ම. විසින් කරන ලද සමීක්ෂණයකට අනුව, නාගරික ප්‍රදේශවල විදුලිබල පහසුකම් සපයා ඇති නිවාස ප්‍රමාණය සියයට 95 ක් පමණ වන අතර, එය සමග සැසඳීමේදී ග්‍රාමීය ප්‍රදේශවල විදුලිබලය සපයා ඇති නිවාස ප්‍රමාණය සියයට 36 ක් පමණ වේ. ග්‍රාමීය විදුලි යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම අධික පිරිවැය සහිත වුවද, විදුලිබලය සැපයීමෙන් ඇතිවන සාමාජීය ප්‍රතිලාභ ඉමහත්ය. ප්‍රාදේශීය මට්ටමින් ස්වභාවික බලශක්ති මූලයන් සහ තාපබල මූලයන් සංවර්ධනය කිරීම තුළින් විදුලිබලය සම්ප්‍රේෂණය කිරීමේදී සහ බෙද හැරීමේදී සිදුවන අලාභ අවම කරගත හැකිය. මේ අතර, ස්වයං විදුලිබල ජනනය කිරීම් රහිතව, කර්මාන්ත අංශය පරිභෝජනය කරන ලද විදුලිබල ප්‍රමාණය ගි.වො.පැය 1,786 දක්වා සියයට 13 කින් වැඩිවූ අතර ඉන් ගි.වො.පැය 174 ක් අලෙවි කරනු ලැබුවේ ලං.වි.ස. මගිනි. විමර්ශනය කරනු ලබන කාලපරිච්ඡේදය තුළදී, ලං.වි.ස. යටතේ ඇති කර්මාන්තද ඇතුලත්ව, විදුලිබල සම්බන්ධතා සපයා ඇති මුළු කර්මාන්ත සංඛ්‍යාව 28,006 දක්වා සියයට 5 කින් වර්ධනය විය. ලං.වි.ම. විසින් වාණිජ අංශයට සපයන ලද විදුලි බල ප්‍රමාණය ගි.වො.පැය 757 දක්වා සියයට 10 කින් පුළුල් වූ අතර, ලං.වි.ස. විසින් මෙම අංශයට කරන ලද විදුලිබල සැපයුම ගි.වො.පැය 118 දක්වා සියයට 15 කින් වර්ධනය විය. වාණිජ අංශයෙහි මුළු විදුලි පාරිභෝගික සංඛ්‍යාව 252,016 දක්වා සියයට 7 කින් වර්ධනය වූ අතර, ඉන් පාරිභෝගිකයින් 32,750 ක් ලං.වි.ස. යටතේ විය.

සලකා බලන වර්ෂය තුළදී විදුලිබල අංශයෙහි කරන ලද ආයෝජනය රුපියල් දශ ලක්ෂ 14,873 දක්වා සියයට 58 කින් පමණ තියුණු වර්ධනයක් වාර්තා කළේය. මෙම ආයෝජනය සඳහා අවශ්‍ය වූ අරමුදල්වලින් රුපියල් දශලක්ෂ 6,029 ක් විදේශ මූලාශ්‍ර වලින්ද, රුපියල් දශ ලක්ෂ 1,000 ක් රාජ්‍ය අරමුදල් වලින්ද, රුපියල් දශ ලක්ෂ 6,044 ක් ලං.වි.ම. යේ අරමුදල් වලින්ද ඉතිරි රුපියල් දශ ලක්ෂ 1,800 පාරිභෝගික දායකත්ව මගින්ද මූල්‍යායනය කරන ලදී. විදුලිබල ව්‍යාපෘති ගණනාවක ඉදිකිරීම් කටයුතු වර්ෂය තුළදී ක්‍රියාත්මක කෙරෙමින් පැවතුනි. මෙ.වො.40 ක ධාරිතාවයෙන් යුත් සපුගස්කන්ද දෙවන ඩීසල් විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු වර්ෂය තුළදී අඛණ්ඩව කරගෙන ගිය අතර එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 1999 වර්ෂය අවසානයේදී පමණ නිම කිරීමට අපේක්ෂිතය. ජපානයේ ජා.ජා.ස.ඒ. සහයෝගය ඇතිව ඉදිකිරීමට යෝජිත කුකුලේ ගඟ ජල විදුලි බලාගාරයේ (මෙ.වො.70) ප්‍රවේශ මාර්ග ඉදිකිරීම වැනි ප්‍රාථමික වැඩකටයුතු 1998 වර්ෂයේදී අඛණ්ඩව කරගෙන යන ලදී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉදිකිරීම් 1999 වර්ෂයේ මුල් භාගයේදී ආරම්භ කිරීමට නියමිතව ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කර ඇති මුළු


වියදම රුපියල් දශ ලක්ෂ 13,000 කි. මේ අතර සමනලවැව ජලාශයෙහි දකුණු ඉවුරෙහි ජල කාන්දුවීම වළක්වා ගැනීමේ වැඩකටයුතුවල පළමු අදියර 1998 මාර්තු මාසයේදී ඇරඹූ අතර එය 1998 ඔක්තෝබර් මාසයේදී අවසන් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජල කාන්දුව තත්පරයට ඝන මීටර් 2.8 සිට 2.2 දක්වා අඩුකර ගැනීමට හැකිවූ අතර, පහත් ප්‍රදේශවල ජල පීඩනය අඩුකර ගැනීමටද හැකිවී ඇත. මෙම ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය රුපියල් දශ ලක්ෂ 1,428 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර ඉන් රුපියල් දශ ලක්ෂ 768 ක් 1998 දී වියදම් කරන ලදී. පළමු අදියරෙහි සාර්ථකභාවය පිළිබඳ තක්සේරු කිරීමකින් අනතුරුව, දෙවන අදියරෙහි කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

**5.3 රූප සටහන**


**ප්‍රධාන බලශක්ති ප්‍රභවයන්**





5.3.1 රූප සටහන
විදුලිබල උත්පාදනය සහ අලෙවිය (1990 = 100)




5.3.2 රූප සටහන
විදුලිබලය: සාමාන්‍ය ගාස්තු සහ ඒකක පිරිවැය




5.3.3 රූප සටහන
බනිජතෙල් නිෂ්පාදිත මිල සහ පිරිවැය - 1998




5.3.4 රූප සටහන
බනිජතෙල් නිෂ්පාදිත දේශීය අලෙවිය

ජපානයේ වි.ආ.ස.අ. මගින් මූල්‍යාධාර සපයනු ලබන මෙ.වො.150 ක ධාරිතාවයෙන් යුත් කැළණිතිස්ස ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරයෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර, එය වර්ෂ 2000 දී නිම කිරීමට නියමිතව ඇත. ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා අවශ්‍යව තිබූ පාරිසරික බලපෑම පිළිබඳ සහතිකය, වන සම්පත් සහ පාරිසරික අමාත්‍යාංශයේ ලේකම් විසින් මෑතකදී නිකුත් කරන ලදී. කෙසේවෙතත්, රාජ්‍ය නොවන සංවිධානයක් විසින් මෙම තීරණයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර දැනට උසාවි නියෝගයක් ලැබෙන තෙක් ව්‍යාපෘති කටයුතු නතර කොට ඇත. මේ අතර බටහිර මුහුදු තීරයෙහි ඉදිකිරීමට යෝජිත ගල් අඟුරු විදුලි බලාගාරය හා සම්බන්ධ තාක්ෂණික සහ පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරු කිරීම් 1998 වර්ෂය තුළදී අඛණ්ඩව සිදුවිය. දැනටමත් පාරිසරික බලපෑම් පිළිබඳ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

1997 දී ආරම්භ කරන ලද තෙවන ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රමය, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත 1998 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය, වර්ෂ 2000 අවසන් වනවිට, නව ග්‍රාමීය පාරිභෝගිකයින් 110,000 කට විදුලිබලය සැපයීම පිණිස සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි සමස්ත පිරිවැය රුපියල් දශ ලක්ෂ 3,051 කි. 1998 වර්ෂය අවසන් වනවිට මෙම ව්‍යාපෘතියෙන් සියයට 52 ක් පමණ අවසන් කර තිබුණි.

1998 වර්ෂයේ පෞද්ගලික අංශයේ විදුලි යෝජනාක්‍රම කිහිපයකම ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතිණි. 1998 වර්ෂය අවසානයේදී, කුල් එයාර් වෙන්චර්ස් පුද්ගලික සමාගම විසින් කන්කසන්තුරය ප්‍රදේශයේ මෙ.වො.10 ක ඩීසල් විදුලි බලාගාරයක් BOO පදනම යටතේ ස්ථාපිත කරන ලදී. මෙ.වො.40 ක ඩීසල් විදුලි බලාගාරයක් ප්‍රාදේශීය වශයෙන් අනුරාධපුරය/මාතර/මතුගම යන ප්‍රදේශයක ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින් තිබිණි. මේ අතර, මෙ.වො.165 ක ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරයක් BOOT පදනම යටතේ කැළණිතිස්ස පිහිටුවීම සම්බන්ධයෙන්, අදළ පාර්ශවකරුවන් අතර අභිප්‍රාය ලිපි අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන කොටස් හිමිකරු වන්නේ එක්සත් ජනපදයෙහි ඒඊඑස් (AES) සමාගමයි. කොළඹ වරායේ පාරුවක් මත මෙ.වො.60 ක විදුලි බලාගාරයක් ඉදිකිරීම හා සම්බන්ධ සාකච්ඡා වර්ෂය තුළදී නිම කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් දශ ලක්ෂ 3,500 ක් පමණ වන අතර, එහි ඉදිකිරීම් කටයුතු වර්ෂ 2000 දී නිම කිරීමට නියමිතය. මීට අමතරව, මෙ.වො. 4.03 ක මුළු ධාරිතාවයෙන් යුත් කුඩා ජල විදුලි බලාගාර 4 ක සහ සීමාසහිත හේකාබ් සමාගම යටතේ කසළ දහනයෙන් විදුලිබලය නිපදවීමේ බලාගාරයක (මෙ.වො.0.39 ක) මූලික ඉදිකිරීම් කටයුතු 1998 වර්ෂය තුළදී නිම කරන ලදී. එමෙන්ම, මෙ.වො.27.7 ක අධි ධාරිතාවයකින් යුත් කුඩා ජල විදුලිබලාගාර 5 ක් ඉදිකිරීම හා සම්බන්ධ ව්‍යාපෘති යෝජනා සැලකිල්ලට භාජනය වෙමින් තිබිණි. ලං.වි.ම. සහ දෙල්ගොඩ කුඩා ජල විදුලි බලාගාරය (මෙ.වො.2.5) ඉදිකරනු ලැබූ ආයෝජකයන් අතර විදුලිය මිලට ගැනීමේ ගිවිසුම වර්ෂය තුළදී අත්සන් කෙරුණ අතර, වෙනත් කුඩා ජල විදුලි ව්‍යාපෘති දෙකක් හා සම්බන්ධ විදුලි බලය මිලට ගැනීමේ ගිවිසුම් සාකච්ඡා මට්ටමේ පැවැතිණි.

## ඛණිජ තෙල් නිෂ්පාදිත

ශ්‍රී ලංකාවේ මුළු ප්‍රාථමික බලශක්ති පරිභෝජනයෙන් සියයට 32 ක් පමණ සමන්විත වනුයේ ඛණිජ තෙල් නිෂ්පාදිත වලිනි. ඛණිජතෙල් නිෂ්පාදිත සඳහා දේශීය ඉල්ලුම පසුගිය වර්ෂ 5 තුළදී සාමාන්‍යයෙන් වර්ෂයකට සියයට 12 කින් පමණ වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, ඩීසල් සහ දැවිතෙල් සඳහා ඉල්ලුම සාපේක්ෂ වශයෙන් ඉහළ අනුපාතිකයකින් වර්ධනය වන අතර ඊට තාප විදුලිබල උත්පාදනය මෑතකදී පුළුල් වීම සහ ප්‍රවාහන අංශයේ ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

පසුගිය වර්ෂයේ ඛණිජතෙල් පිරිපහදුව අඛණ්ඩව ක්‍රියාත්මක වූ බැවින් බොර තෙල් ආනයනය මෙ.ටොන් දශ ලක්ෂ 2 ක් දක්වා සියයට 12 කින් පමණ වැඩිවිය. එහෙයින් පිරිපහදු නිෂ්පාදිත ආනයනය සියයට 36 කින් අඩුවිය. 1998 දී ඛණිජතෙල් ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 345 ක් දක්වා සියයට 36 කින් අඩු වූ අතර ඊට මූලික වශයෙන් ලෝක වෙළෙඳපොළෙහි ඛණිජතෙල් මිල ගණන් පහළ මට්ටමක පැවතීම හේතුවිය. ආනයනිත බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල 1997 දී එ.ජ.ඩොලර් 19.42 සිට 1998 දී 13.63 දක්වා අඩුවිය. 1998 වර්ෂය අවසන් වනවිට බොරතෙල් බැරලයක මිල එ.ජ.ඩොලර් 10.97 ක් පමණ විය.

ලෝක වෙළෙඳපොළෙහි බොරතෙල් මිල ගණන් සැලකියයුතු පරිදි පහත වැටුනද ඊට අනුරූපව ඛණිජතෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් අඩු කිරීමක් සිදු නොවුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.ස.) සිය නිෂ්පාදිත වලින් ලද ලාභ ආන්තිකයන් පුළුල් විය. පෙට්‍රල් අලෙවි මිල, බදුද ඇතුලත් එහි නිෂ්පාදන පිරිවැයට වඩා සියයට 60 කින් පමණ වැඩිය. ඩීසල් සහ දැවිතෙල් මිල ගණන් ඒවායේ නිෂ්පාදන මිලට වඩා පිළිවෙලින් සියයට 24 කින් සහ සියයට 19 කින් ඉහළ අගයක් විය. මේ අතර, ජාත්‍යන්තර මිල ගණන් තියුණු ලෙස පහත වැටී තිබියදීත් ගෑස් මිල ගණන් නොවෙනස්ව පැවතිණි. කෙසේ වෙතත්, වර්ෂය තුළදී, ඩොලරයට එරෙහිව රුපියලේ වටිනාකම සියයට 9.6 කින් පමණ අවප්‍රමාණයවීම නිසා, ලං.ඛ.නී.ස. ට හිමි වූ ලාභය යම් තරමකින් අඩුවිය. මීට අමතරව, ලං.ඛ.නී.ස. ට හිමිවූ ලාභයෙන් කොටසක් විශේෂ බදු මාර්ගයෙන් සහ 1997 නොවැම්බර් සිට ක්‍රියාත්මක වන පරිදි ඛණිජ තෙල් සඳහා වන තීරුබද්ද සියයට 25 සිට සියයට 30 දක්වා වැඩිකිරීම මගින් රජය වෙත ලබාගන්නා ලදී. ලං.ඛ.නී.ස. වේ ලාභයෙන් කොටසක් සිය වගකීම් අඩුකර ගැනීම සඳහා ද යොදා ගන්නා ලදී. තාවකාලික දත්තවලට අනුව, ලං.ඛ.නී.ස. 1998 දී බද්දට පෙර ලාභය වශයෙන් රුපියල් බිලියන 6.6 ක් වාර්තා කර ඇත. ලං.ඛ.නී.ස. 1997 දී රුපියල් දශ ලක්ෂ 407 ක ලාභයක්ද, 1996 දී රුපියල් දශ ලක්ෂ 3,657 ක අලාභයක්ද වාර්තා කර ඇත. ලෝක වෙළෙඳපොළෙහි ඛණිජතෙල් මිල ගණන් සැලකියයුතු පරිදි පහත බැස තිබියදීත්, 1998 දී ඛණිජතෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් සංශෝධනය නොකරන ලද්දේ, රජයේ සම්පත් අවශ්‍යතාවය ඉහළ ගිය බැවිනි.

1998 වර්ෂයේදී ඛණිජතෙල් නිෂ්පාදිතවල දේශීය අලෙවිය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.4 දක්වා සියයට 5 කින් පමණ වැඩිවිය. මෙම වැඩිවීම පැහැදිලිවම දැවිතෙල් අලෙවියෙහි දක්නට ලැබුණ අතර ඊට ප්‍රධාන වශයෙන් නව තාප විදුලි බලාගාර වලින් කෙරුණ දැඩි ඉල්ලුම හේතු විය. මෙම තත්ත්වය, නැව් සඳහා සැපයූ ඉන්ධන ප්‍රමාණය සීමා කිරීමට ලං.ඛ.නී.සං. සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කොළඹ වරායට පැමිණෙන නැව් වලින් දැවිතෙල් සඳහා කෙරෙන ඉල්ලුම සම්පූර්ණයෙන් සපුරාලීමට සීමාසහිත ලංකා මැරයින් සර්විසස් සමාගමට (ල.මැ.ස.ස.) නොහැකි වූ අතර, එමගින් විදේශ විනිමය ඉපයීමට තිබූ අවස්ථා මහ හැරුණි. නැව්වලට අලෙවි කරනු ලැබූ දැවිතෙල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 189,000 දක්වා සියයට 15 කින් පමණ අඩු වූ අතර, ඉපයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 16 ක් දක්වා සියයට 33 කින් පමණ අඩුවිය. කොළඹ වරායේ නැව් වලට සේවා සැපයීම සඳහා සාපේක්ෂ වශයෙන් ඉහළ මිල ගණන් අයකරනු ලබන බැවින්, පසුගිය කාලය තුළ ඉන්ධන ලබාගැනීම වැනි නැව් සේවා සඳහා කොළඹ වරායට පැමිණි නැව් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වී ඇත. 1998 දී කොළඹ වරායේ දැවිතෙල් මෙට්‍රික් ටොන් එකක සාමාන්‍ය මිල එ.ජ.ඩොලර් 86 ක් පමණ විය. දැනට ලං.ඛ.නී.ස. වේ උප සමාගමක් වන ලං.මෙ.ස.ස. නැව්වලට ඉන්ධන සැපයීමේ ඒකාධිකාරි බලය ලබාගෙන සිටී. සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක ඇති ඉන්ධන මිල ගණන් සහ ප්‍රමාණවත් නොවන සැපයුම් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, කොළඹ වරායේ නැව් වලට ඉන්ධන සැපයීම, නිදහස් තරඟකාරී තත්ත්වයක්

යටතේ සිදු කළයුතු බවට නැව් සමාගම් නියෝජිතයින් විසින් දැඩි ලෙස ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. කෙසේ වුවද, නැව් සේවා සඳහා කොළඹ වරායට වැඩි වැඩියෙන් නැව් ආකර්ශණය කර ගැනීම සඳහා තරඟකාරී මිල ගණන් යටතේ නැව් සේවා සැපයීම හා සම්බන්ධ නිශ්චිත ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ඉතා වැදගත් බව සඳහන් කළ යුතුව ඇත. ඊට ප්‍රධාන හේතුව වන්නේ එමගින් වෙනත් බොහෝ ආර්ථික කටයුතු සඳහා මහ පැදීමක් වන බැවිනි.

මේ අතර, පෙට්‍රල් අලෙවිය, පසුගිය වසරේ වූ සියයට 2 ක අඩුවීම හා සැසඳීමේදී, 1998 දී සියයට 5 කින් පමණ ඉහළ ගිය අතර ඊට ප්‍රධාන වශයෙන් පෙට්‍රල් මෝටර්රථ සංඛ්‍යාව වැඩිවීම හේතු වී ඇත. කෙසේ වෙතත්, ඩීසල් අලෙවිය වර්ෂය තුළදී මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.2 දක්වා සියයට 9 කින් පමණ අඩුවිය. මීට ප්‍රධාන වශයෙන් කුලියට ගත් තාප විදුලි බලාගාර ඇතුළු ඩීසල් විදුලි බලාගාර වලින් කෙරුණු ඉල්ලුම අඩුවීම හේතුවිය. තාප විදුලිබල උත්පාදනය සඳහා ඩීසල් ඉල්ලුම මෙට්‍රික් ටොන් 110,201 දක්වා සියයට 64 කින් අඩු වූ අතර, ප්‍රවාහන කටයුතු සඳහා වූ ඩීසල් ඉල්ලුම මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1,042,109 දක්වා සියයට 11 කින් වැඩිවිය. භූමිතෙල් ඉල්ලුම සියයට 4 කින් වැඩිවිය. මේ අතර, සාපේක්ෂ වශයෙන් මිල ගණන් ඉහළ මට්ටමක පවතිද්දීත්, ගුවන්යානා ඉන්ධන අලෙවිය සියයට 7 කින් වැඩිවිය. ශ්‍රී ලංකාව, සිවිල් ගුවන් ප්‍රවාහනයේ කේන්ද්‍රස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන්නේ නම්, ගුවන්යානා ඉන්ධන මිල ගණන් තරඟකාරී ලෙස තීරණය කිරීම පූර්ව අවශ්‍යතාවයක් වනු ඇත. 1998 දී එල්.පී.ගෑස් පරිභෝජනය මෙට්‍රික් ටොන් 117,269 දක්වා සියයට 19 කින් වැඩිවිය. එල්.පී. ගෑස් ආනයනය මෙට්‍රික් ටොන් 97,905 දක්වා සියයට 13 කින් ඉහළ ගිය අතර, ල.ඛ.නී.සං. වෙන් මිලට ගනු ලැබූ එල්.පී. ගෑස් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 17,221 දක්වා සියයට 24 කින් වැඩිවිය. ගෘහස්ථ අංශයේ ගෑස් පරිභෝජනය පුළුල් වීම නිසා 1998 දී ගෘහස්ථ අංශය සඳහා ගෑස් අලෙවිය මෙට්‍රික් ටොන් 86,090 දක්වා සියයට 16 කින් වැඩිවිය. මේ අතර, 1998 දී කර්මාන්ත අංශය සඳහා ගෑස් අලෙවිය මෙට්‍රික් ටොන් 31,179 දක්වා සියයට 28 කින් ඉහළ ගියේය. පෙට්‍රල් මෝටර් වාහන, ගෑස් වලින් ධාවනය කිරීම සඳහා පරිවර්තනය කිරීමද ගෑස් අලෙවිය වැඩිවීමට යම් දුරකට බලපා ඇත. දළ ඇස්තමේන්තුවලට අනුව, දනට ප්‍රසිද්ධ සමාගම් විසින් පෙට්‍රල් වාහන 5,000 ක් පමණ ගෑස් වලින් ධාවනය කිරීම සඳහා පරිවර්තනය කර ඇති අතර, මෙම සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. එමනිසා, මෙම පරිවර්තනය කිරීම් සුපරීක්ෂණය කිරීම සඳහා සහ ආරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සම්පාදනය කිරීම අවශ්‍යව ඇත.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් සිය ගබඩා පහසුකම් සහ ඛනිජතෙල් බෙද හැරීමේ ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඛනිජතෙල් ගබඩා පහසුකම් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ආ.සං.බැං. වේ සහයෝගය ඇතිව, ඔරුගොඩවත්ත සහ කොළොන්නාව පිහිටි අනතුරට ලක්වූ තෙල් ටැංකි පුනරුත්ථාපනය කිරීමේ සහ සපුගස්කන්දේ ඛනිජතෙල් බෙද හැරීමේ පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු 1998 දී ආරම්භ කරන ලදී. මේ යටතේ, ඔරුගොඩවත්ත පිහිටි තෙල් ටැංකි 3 ක් සහ කොළොන්නාව පිහිටි තෙල් ටැංකි 6 ක් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු 1999 වර්ෂය මැද භාගයේදී අවසන් කිරීමට නියමිතය. සපුගස්කන්ද පිහිටි ඛනිජතෙල් බෙදහැරීමේ නව පහසුකම් 1999 වර්ෂය අවසන් වනවිට නිම කිරීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් දශ ලක්ෂ 3,048 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ප්‍රාදේශීය වශයෙන් පිහිටි ඛනිජතෙල් ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර ඒ සඳහා වියදම වන රුපියල් දශ ලක්ෂ 55 ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ අරමුදල් වලින් පියවනු ඇත. කටුනායක ගුවන් තොටුපල වෙත ගුවන්යානා ඉන්ධන සැපයීමේ පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක්ද 1998 දී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් දශ ලක්ෂ 462 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. කොළඹ වරායේ සිට කොළොන්නාව දක්වා පිරිපහදු තෙල් පොම්ප කිරීම සඳහා දනට ඇති නල මාර්ගය රුපියල් දශ ලක්ෂ 150 ක වියදමකින් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක්ද සැලසුම් කර ඇත.

## 5.6 ප්‍රවාහනය

### ප්‍රවාහන පද්ධතිය

ගොඩ බිම්, මුහුදු හා ගුවන් ප්‍රවාහනය, ආර්ථික යටිතල පහසුකම් අංශයේ ප්‍රධාන කොටසකට දයකත්වය දරයි. විශේෂයෙන්ම බස් ප්‍රවාහනයේ පෞද්ගලික අංශයෙහි සහභාගිත්වය මෑතකාලීනව ඉහළ යෑමක් දක්නට ලැබුනද ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහන පහසුකම් සැපයීමේදී තවදුරටත් ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයේ සහභාගිත්වය ප්‍රබල තත්ත්වයක පවතී. සමහර උප අංශ වල පසුබැම් පෙන්නුම් කරනු ලැබුවද, සමස්තයක් වශයෙන් 1998 වර්ෂයේදී ප්‍රවාහන අංශය තරමක වර්ධනයක් පෙන්නුම් කළේය. 1997 වර්ෂයේදී ජනතා සන්තක බස් සමාගම්, ප්‍රාදේශීය ප්‍රවාහන සමාගම් (ප්‍රා.ප්‍ර.ස.) බවට ඒකාබද්ධ කිරීමේ හා වඩාත් කැප වූ මගී සේවාවක් සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී. ලං. දු. සේ) විසින් මෑතකදී හඳුන්වා දෙන ලද ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිලාභ ඉදිරියේදී ලැබිය යුතුව ඇත.

කි.මී. 100,000 ක් පමණ වූ දීප ව්‍යාප්ත මාර්ග පද්ධතිය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රවාහනය සඳහා වූ ඉල්ලුමෙන් සියයට 90 ක පමණ ප්‍රමාණයක් සපුරාලනු ලැබේ. මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ.) කි.මී. 11,285 ක් වූ 'ඒ' සහ 'බී' කාණ්ඩවලට අයත් ජාතික මහා මාර්ග පද්ධතිය නඩත්තු කිරීමෙහි හා සංවර්ධනය කිරීමෙහි වගකීම දරයි. 'සී' සහ 'ඩී' කාණ්ඩ වශයෙන් වර්ග කර ඇති ආසන්න වශයෙන් කි.මී. 15,000 ක් පමණ වූ මාර්ග පද්ධතියක් පළාත් සභා යටතේ පවතී. ග්‍රාමීය මාර්ග, වතු මාර්ග හා කෘෂිකාර්මික මාර්ග වලින් සමන්විත සෙසු මාර්ග ප්‍රාදේශීය සභා හා වතු සමාගම්, මහවැලි සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යනාදී රාජ්‍ය හා පෞද්ගලික ආයතන යටතේ පවතී.

1998 වර්ෂය අවසාන වනවිට ප්‍රා.ප්‍ර.ස. වල මුළු බස් ප්‍රමාණය 7,942 ක් විය. මෙය සියයට එකක පමණ ආන්තික අඩු වීමක් පෙන්නුම් කරන අතර, ධාවනයට නුසුදුසු තත්ත්වයේ පැවති බස් රථ සැලකියයුතු ප්‍රමාණයක් විකිණීම ප්‍රධාන වශයෙන් මෙයට හේතු විය. 1998 වර්ෂයේදී මගී ප්‍රවාහනයෙහි යෙදවූ පෞද්ගලික බස් රථ ප්‍රමාණය 14,000 ක් පමණ විය. 1980 වර්ෂයේ සිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ (මෝ.ප්‍ර.දෙ.) ලියාපදිංචි වී ඇති මෝටර් කාර් සංඛ්‍යාව 300,532 ක් වූ අතර, මෝටර් බයිසිකල්

ප්‍රමාණය 711,617 ක් විය. භාණ්ඩ ප්‍රවාහන සේවය සඳහා වූ කැපී පෙනෙන දයකත්වය පිළිබිඹු කරමින් භාණ්ඩ ප්‍රවාහනය සඳහා මෙම කාලය තුළ ලියාපදිංචි වී ඇති වාහන ප්‍රමාණය 106,438 ක් විය. මෝ.ප්‍ර.දෙ. හි මේ දක්වා ලියාපදිංචි වී ඇති මුළු ත්‍රීරෝද රථ ප්‍රමාණය 75,666 ක් විය. මෙම ත්‍රීරෝද රථ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල වැදගත් ප්‍රවාහන මාධ්‍යයක් බවට පත් වී ඇත. මේ අනුව, මෝටර් බයිසිකල් හා ත්‍රීරෝද රථද ඇතුළුව 1980 වර්ෂයේ සිට ලියාපදිංචි වී තිබූ මුළු වාහන සංඛ්‍යාව 1998 වර්ෂය අවසානය වන විට 1,267,496 ක් විය. ශ්‍රී.ල.දු.සේ. සතුව ධාවනයෙහි යෙදවිය හැකි දුම්රිය එන්ජින් හා මැදිරි ප්‍රමාණය, එන්ජින් 65 ක්, බලවේග කට්ටල් 26 ක්, දුම්රිය මැදිරි 1,262 ක් හා භාණ්ඩ ප්‍රවාහන ගැල් 2,575 කින් සමන්විත විය. මුළු දුම්රිය මාර්ග පද්ධතිය කි.මී. 1,463 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. ජාතික ගුවන් සේවාව වූ එයාර් ලංකා ආයතනය රටවල් 21 ක ගමනාන්ත 29 ක් වෙත සිය කටයුතු නොකඩවා ක්‍රියාත්මක කළේය. මෙමගින් ඉන්දියානු අර්ධද්වීපය, ඈත පෙරදිග යුරෝපය හා මැද පෙරදිග යන කලාපයන් ආවරණය විය. මුහුදු ප්‍රවාහන අංශය පිළිබඳව සලකා බලනවිට, ශ්‍රී ලංකාව තරඟකාරී නැව් කර්මාන්තය වෙත යොමු වනවා වෙනුවට වරායන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රධාන වශයෙන්ම පහසුකම් සළසන්නෙකු වශයෙන් කටයුතු කරයි. මෙම අංශයේ ප්‍රධානතම ආයතනය වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය කොළඹ, ත්‍රිකුණාමලය, ගාල්ල හා කන්කසන්තුරේ යන ස්ථානවල වරායන් හතරක් ක්‍රියාත්මක කරයි. ලංකා නැව් සංස්ථාව හා පෞද්ගලික අංශයේ නැව් සමාගම් කිහිපයක් සීමිත නැව් සේවාවන් සැපයීමෙහි යෙදී සිටිති.

## මාර්ග සංවර්ධනය

1998 වර්ෂයේදී කි.මී. 11,285 ක් වූ ජාතික මහා මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳව වගකීම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් උසුලනු ලැබීය. වර්ෂය තුළදී කි.මී. 138 ක ප්‍රමාණයක් ජාතික මහා මාර්ග පද්ධතියට අළුතින් එක් කරන ලදී. මීට අමතරව, පාලම් 4,200 ක්ද මාර්ග සංවර්ධන අධිකාරිය නඩත්තු කළේය. 1998 වර්ෂයේදී මහා මාර්ග සඳහා වූ මුළු වියදම සියයට තුනකින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 5,783 ක් විය. මෙම මුළු වියදමින් සියයට 56 ක් මාර්ග, පාලම් හා බෝක්කු පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහාද, සියයට 38 ක් මාර්ග ඉදි කිරීම්, නව එකතු කිරීම් හා වැඩි දියුණු කිරීම් සඳහාද වෙන් කරන ලදී. මේ අතර, ජාතික මාර්ග නඩත්තු කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 265 ක් දක්වා සියයට 3 කින් වැඩි විය.

ශ්‍රී ලංකාව තුළ සාපේක්ෂ වශයෙන් සතුටුදයක මාර්ග ජාලයක් හා මාර්ග ඝනත්වයක් පැවතියද, සම්පත් සීමිත භාවය හේතුවෙන් මාර්ග නඩත්තුව හා වැඩි දියුණු කිරීම ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන ගොස් නොමැත. නව මාර්ග ඉදි කිරීම හා පවත්නා මාර්ග පළල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී මුහුණ දීමට සිදු වී ඇති විරෝධතාවයන්, මහාමාර්ග බලධාරීන් හා මූලික පහසුකම් සැපයීමේ යෙදී සිටින අනිකුත් ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැති වීම හා ව්‍යාපෘති යෝජනා නිම කිරීමේදී කොන්ත්‍රාත්කරුවන් මුහුණ දෙන මූල්‍යමය බාධක ආදී ගැටළු සමහර යෝජනා ක්‍රම නිම කිරීම ප්‍රමාද කරයි. මේ අතර, පළාත් මට්ටමින් ගත් කල ජාතික මාර්ග පද්ධතියෙහි වැඩි දියුණු කිරීමක් දිගුකලක සිට පැවති අවශ්‍යතාවයකි. බොහෝ පළාත්බද මාර්ග පිළිගත් ඉංජිනේරු ප්‍රමිති මත සැළසුම්කර හෝ ගොඩ නගා නොමැති බැවින් වැඩි වන වාහන ප්‍රමාණය, විශේෂයෙන්ම බර වාහන ප්‍රමාණය මෙම මාර්ගවලට හානි පමුණුවයි. සම්පත් සංරෝධකයන් මෙම මාර්ග පුනරුත්ථාපනය සඳහා පවතින ප්‍රධාන ප්‍රශ්නය ලෙස හඳුනාගෙන ඇත.

1998 වර්ෂයේදී ජාතික මහා මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම සඳහා දරන ලද උත්සාහයන්හි සැළකිය යුතු වර්ධනයක් සිදු විය. මා.සං.අ. යටතේ විදේශ අරමුදල් ලබන මාර්ග සංවර්ධන වැඩසටහන් රාශියක් වර්ෂය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවතිණි. මෙම වැඩසටහන් සියල්ලම පාහේ සැළසුම් කර තිබුනේ ජාතික මහා මාර්ග පද්ධතියේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහාය. දකුණ, බටහිර හා වයඹ පළාත්වල කි. මී. 397 ක මාර්ග සහ පාලම් 19 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා වූ ලෝක බැංකු ආධාර ලබන තුන් වන මාර්ග පුනරුත්ථාපන වැඩසටහන වර්ෂය තුළදී ක්‍රියාත්මකව පැවතිණි. මේ යටතේ ව්‍යාපෘති රාශියක වැඩකටයුතු මේ වනවිට සම්පූර්ණ කර තිබේ. ආසියානු සංවර්ධන බැංකුව (ආ.සං.බැ.) විසින් ආධාර සපයනු ලබන ආ.සං.බැ. තෙවැනි මාර්ග පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියද ක්‍රියාත්මක වෙමින් තිබිණි. මෙම ව්‍යාපෘතිය යටතේ නාරම්මල-ගිරිඋල්ල, කුරුණෑගල-පාදෙනිය, කටුගස්තොට-මාතලේ, වත්තේගම-මාතලේ, පේරාදෙණිය-ගම්පොල හා මහනුවර-තැන්නේකුඹුර යන මාර්ගවල කි.මී. 82 ක ප්‍රමාණයක් පුනරුත්ථාපනය කිරීම නිමවීමට ආසන්නව පැවතිණි. රුපියල් දශ ලක්ෂ 1,084 ක වියදමින් කටුනායක-පුත්තලම මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කටයුතුද ක්‍රියාත්මක වෙමින් තිබිණි. මෙම ව්‍යාපෘතිය යටතේ 1998 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 753 ක් වටිනා වැඩ ප්‍රමාණයක් නිම කර තිබිණි. ජපානයේ විදේශ ආර්ථික සංවර්ධන අරමුදලෙහි (වි.ආ.ස.අ.) ආධාර ඇතිව ජපන් ශ්‍රී ලංකා මිත්‍රත්ව පාලමෙහි දෙවන අදියරෙහි කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, එය වසර 2000 දී නිම කිරීමට නියමිතය. වි.ආ.ස.අ. ආධාර සහිතව බේස්ලයින් මාවත පුනරුත්ථාපනය කිරීමෙහි පළමු අදියරෙහි කටයුතු සිදු කෙරෙමින් පැවතිණි. මෙම වැඩසටහන යටතේ එක් දිශාවකට ධාවන තීරු තුනක් සහිත මාර්ගයක් කැළණිතිස්ස වටරවුමේ සිට කනත්ත වටරවුම දක්වා ඉදි කිරීමත්, දෙමටගොඩ ප්‍රධාන දුම්රිය මාර්ගය හරහා ගුවන් පාලමක් ඉදි කිරීමත් හා බොරැල්ලෙහි මගී උමං මාර්ගයක් තැනීමත් සිදු කෙරේ. කනත්ත වටරවුමේ සිට හයිලෙවල් පාර දක්වා වූ ඉතිරි කොටසෙහි වැඩ කටයුතු 1999 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතය. මෙම වැඩසටහන සඳහා වන මුළු පිරිවැය රුපියල් දශ ලක්ෂ 1,530 ක් වේ යැයි

ඇස්තමේන්තු කර ඇති අතර 1998 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 457 ක් වැය කර තිබිණි.

අරාබි සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදලෙහි ආධාර යටතේ රුපියල් දශ ලක්ෂ 600 ක වියදමින් පාලම් 28 ක් පුනරුත්ථාපනය කිරීමේ/ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු 1998 වර්ෂය තුළදී ක්‍රියාත්මකව පැවතිණි. මේ අතර, මාර්ග ඉදිකිරීමේ යන්ත්‍රෝපකරණ සැපයීමේ ව්‍යාපෘතියක් වි.ආ.ස.අ. ආධාර ඇතිව වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී. මීට අමතරව, කි.මී. 345 ක මාර්ග හා පාලම් 47 ක් වැඩි දියුණු කිරීමේ අරමුණින්, ආ.සං.බැ. ආධාර යටතේ සිව් වන මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 1999 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතය.

ජපානයේ වි.ආ.ස.අ. ආධාර සහිතව වැලි මුද්‍රිත තාර ආලේප කිරීම සහ මාර්ග මතුපිට සකස් කිරීම ඇතුළත් කාලීන නඩත්තු වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන යටතේ සම්පූර්ණ කරන ලද සමුච්චිත කි. මී. ප්‍රමාණය 3,215 ක් වූ අතර මෙයින් කි.මී. 3,104 ක වැලි මුද්‍රිත තාර ආලේප කිරීම කළ අතර, කි.මී. 111 ක දෙවරක් තාර දමා මතු පිට සකස් කිරීමේ කටයුතු කරන ලදී. මෙම වැඩසටහන යටතේ 1998 වර්ෂයේදී කරන ලද මුළු වියදම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,179 කි.

ඒකාබද්ධ අරමුදල යටතේ වෙන් කර ඇති රුපියල් දශ ලක්ෂ 1,658 මඟින් පළාත් මට්ටමින් මහා මාර්ග හා පාලම් ඉදිකිරීම සහ වැඩි දියුණු කිරීම දිගටම කරගෙන යන ලදී. මේ යටතේ රුපියල් දශ ලක්ෂ 72 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත බටහිර මුහුදු තීරය ඔස්සේ දිවෙන මැරයින් මාර්ගයේ කටයුතු සිදු කෙරෙමින් පවතියි. ඩුප්ලිකේෂන් පාර දීර්ඝ කිරීමේ කටයුතුද කරගෙන යනු ලබන අතර ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කර ඇති මුළු පිරිවැය රුපියල් දශ ලක්ෂ 52 කි. මීට අමතරව, පාලම් 50 ක ඉදි කිරීම් කටයුතු 1998 වර්ෂයේදී නිම කරන ලද අතර ඒවා පණස් වැනි නිදහස් සමරුව වෙනුවෙන් විවෘත කරන ලදී. රුපියල් දශ ලක්ෂ 110 ක වියදමින් කැළණි ගඟ හරහා කැළණිසිරි පාලම ඉදි කිරීමේ කටයුතු සිදුකරමින් පැවතිණි. මේ අතර, රුපියල් දශ ලක්ෂ 200 ක වියදමින් ප්‍රධාන දුම්රිය මාර්ගය හරහා රාගම ඉදි කෙරෙන ගුවන් පාලමෙහි කටයුතු නිම වෙමින් තිබිණි. 1998 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙහි ප්‍රථම වතාවට රුපියල් දශ ලක්ෂ 24 ක වියදමින් මගී උමං මාර්ගයක් මහනුවර ඉදි කරන ලදී. පදිකයන්ගේ ආරක්ෂාකාරී ගමනාගමනය සඳහාත්, වාහන තදබදය අඩු කරනු පිණිසත්, මෙවැනි උමං මාර්ග අවශ්‍යතාවය මත රටේ අනිකුත් ප්‍රදේශවලද ඉදිකිරීමට අපේක්ෂිතය.

වේගයෙන් සහ විශ්වාසයෙන් ධාවනය කළහැකි මාර්ග සඳහා රට තුළ වැඩි වෙමින් පවතින ඉල්ලුම සපුරාලීම සඳහා තීරණාත්මක පියවර කිහිපයක් ගෙන තිබේ. ඒ අනුව, අධිවේගී මාර්ග තුනක් ඉදි කිරීමට යෝජනා කර ඇත. තීරු හතරකින් යුක්ත වන මාර්ගයක් ලෙස සැළසුම් කර ඇති කොළඹ කටුනායක අධිවේගී මාර්ගයෙහි කටයුතු රුපියල් බිලියන 6.5 ක වියදමින් 1999 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතය. මාතර-කොළඹ අධිවේගී මාර්ගයෙහි ශක්‍යතා අධ්‍යයන අවසන් වාර්තාව පිළියෙල වෙමින් පවතින අතර සවිස්තර ඉංජිනේරු සැළසුම් සකස් කිරීම 1999 මාර්තු මාසයේදී ඇරඹීමට නියමිතය. කොළඹ-මහනුවර අධිවේගී මාර්ගය සම්බන්ධයෙන් පූර්ව-ශක්‍යතා අධ්‍යයනයක්ද 1999 වර්ෂය තුළදී සිදු කිරීමට නියමිතය.

## මගී ප්‍රවාහනය

මගී ප්‍රවාහන අංශය වැඩි දියුණු කිරීම සඳහා බස් රථ සංඛ්‍යාව ඉහළ නැංවීම, බස් හා දුම්රිය සේවා තවදුරටත් ඒකාබද්ධ කිරීම හා මූල්‍ය මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය මඟින් අවශ්‍ය සහයෝගය ලබා දීම වැනි අංශ කෙරෙහි 1998 වර්ෂයේදී අවධානය යොමු කෙරිණි. වාණිජමය හැකියාව පිළිබඳව අවධානය යොමු නොකිරීම මගී ප්‍රවාහන අංශයේ පවතින අකාර්යක්ෂමතාවයන් අතරින් ප්‍රධාන තැනක් ගනී. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල බස් සේවාව දියුණු කිරීම සඳහා ආසන 32 නව බස් රථ 500 ක් ලබා දීමත්, බස් රථ අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රා.ප්‍ර.ස. වෙත නව එන්ජින් 500 ක් ලබා දීමත් 1998 වර්ෂය තුළ මගී ප්‍රවාහන අංශයේ සිදු වූ ප්‍රධාන සංවර්ධනයන් වේ. ක්‍රියාකාරිත්වය අපේක්ෂිත පරිදි සතුටුදායක තත්ත්වයක නොපැවතියද, ජනතා සන්තක බස් සමාගම්, පොකුරු බස් සමාගම් (ප්‍රා.ප්‍ර.ස) ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම අනාගත සංවර්ධනය සඳහා ශක්තිමත් අඩිතාලමක් සපයා ඇත. පවතින දුෂ්කරතා මධ්‍යයේ වුවද, වඩා හොඳ දුම්රිය ප්‍රවාහන සේවයක් සැළසීම සඳහා ශ්‍රී.ලං.දු. සේ. ද වර්ෂය තුළදී ශක්තිමත් කරන ලදී.

## බස් ප්‍රවාහනය

බස් ප්‍රවාහනය සඳහා වන ඉල්ලුම වාර්ෂිකව ඉහළ යමින් පවතී. ප්‍රා.ප්‍ර.ස. මඟින් සතුටුදායක බස් සේවයක් ලබා දීම සඳහා සාමාන්‍යයෙන් බස් රථ 6,340 ක් පමණ අවශ්‍යය. කෙසේ වුවද, ප්‍රා.ප්‍ර.ස. මඟින් ධාවනය කරන ලද සාමාන්‍ය බස් ප්‍රමාණය 1998 වර්ෂයේදී 4,325 ක් විය. 1998 දී ප්‍රා.ප්‍ර.ස. වල ධාවන කිලෝ මීටර් ප්‍රමාණය දශ ලක්ෂ 313 දක්වා සියයට 6 කින් පහත වැටුණි. මගී කිලෝ මීටර් ප්‍රමාණයද දශ ලක්ෂ 17,716 දක්වා සියයට 8 කින් පහත වැටුණි. ප්‍රා.ප්‍ර.ස. වල මුළු ආදායම රුපියල් දශ ලක්ෂ 4,742 දක්වා සියයට තුනකින් පහළ ගියේය. ආදායම් අඩු බස් මාර්ගවල ධාවනය කිරීම සහ පාසැල් ළමුන් වෙත සහනදායී මිලකට වාර ප්‍රවේශ පත්‍ර ලබා දීම වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 435 ක මුදලක් ප්‍රා.ප්‍ර.ස. වෙත රජය විසින් ලබා දෙන ලදී. 1998 වර්ෂයේදී ප්‍රා.ප්‍ර.ස. වල මුළු වියදමද රුපියල් දශ ලක්ෂ 6,362 දක්වා සියයට 2 කින් වැඩි විය.

රාජ්‍ය අංශයේ බස් මගී ප්‍රවාහන පහසුකම් ලබා දීම ප්‍රතිව්‍යුහකරණ වැඩසටහන යටතේ, කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් පියවර කිහිපයක් ගනු ලබමින් පවතියි. ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී.ලං.ම.ග.ම.) සේවක සංඛ්‍යාවෙන් ආසන්න වශයෙන් 1,500 දෙනෙකු පමණ අඩු කිරීමේ අරමුණින් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර මේ සඳහා අවශ්‍ය රුපියල් දශ ලක්ෂ 800 ක මුදල් ප්‍රමාණයක් පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ලබා දී ඇත. ශ්‍රී.ලං.ම.ග.ම. යේ

ඉතිරි වන සේවකයන්ගෙන් තෝරා ගත් නිලධාරීන්ගෙන් සමන්විත මධ්‍යම මෙහෙයුම් ඒකකයක් පිහිටුවීමට නියමිතය. ශ්‍රී.ලං.ම.ග.ම. ට අනුබද්ධ ආයතනද ප්‍රතිව්‍යුහගත කරනු ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා ජර්මන් කාර්මික පුහුණු ආයතනය හා රියදුරු අභ්‍යාස පාසැල, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය යටතේ ස්වාධීනව කටයුතු කිරීමට ඉඩ සළසනු ඇත.

පෞද්ගලික අංශයේ මගී ප්‍රවාහන සේවාවෙහි කැපී පෙනෙන වර්ධනයක් 1998 වර්ෂය තුළදී දැකිය හැකි විය. 1998 වර්ෂය තුළදී (උතුරු හා නැගෙනහිර පලාත් හැර) පලාත් තුළ ධාවනය වූ මුළු බස් ප්‍රමාණය 11,242 ක් විය. මෙය 1997 වර්ෂය හා සසඳනවිට සියයට 19 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. පෞද්ගලික බස් රථවල මුළු ආසන ධාරිතාවයද සියයට 29 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. පලාත් සභා විසින් නිකුත් කරන ලද මුළු බලපත්‍ර ප්‍රමාණය සියයට 17 කින් ඉහළ ගියේය. පලාත් මට්ටමින් පෞද්ගලික අංශය සඳහා වෙන් කරන ලද මාර්ග ප්‍රමාණය 1997 දී 1,335 සිට 1998 දී 1,446 දක්වා වැඩි විය. කෙසේ වුවද, පසුගිය වර්ෂයේ දක්නට ලැබුණු එක් ධාවකයෙකුට එක් බස් රථයක් පමණක් හිමි තත්ත්වයේ සිට බස් රථ කිහිපයක් හිමි තත්ත්වයක් දක්වා ක්‍රමිකව වර්ධනය වීමේ ප්‍රවණතාවයට ප්‍රතිවිරුද්ධව, බස් රථ හිමියන්ගේ සංඛ්‍යාව 1997 දී පැවති 9,432 සිට 1998 දී 10,922 දක්වා කැපී පෙනන ලෙස වැඩි විය. මෙම තත්ත්වය පෞද්ගලික බස් කර්මාන්තයේ පිරිවැය සඵලත්වය හා සුපරීක්ෂණ කටයුතු

**5.6 සංඛ්‍යා සටහන**

**ගමනාගමන අංශයේ මූලික ලක්ෂණ**

| ශීර්ෂය | | ඒකක | 1996 | 1997 | 1998(අ) | ප්‍රතිශත වෙනස 1997 | ප්‍රතිශත වෙනස 1998(අ) |
|---|---|---|---|---|---|---|---|
| 1. මෝටර් රථ නව ලියාපදිංචි කිරීම | | | | | | | |
| 1.1 | බස්රථ | සංඛ්‍යාව | 1,364 | 1,999 | 3,190 | 46.6 | 59.6 |
| 1.2 | පෞද්ගලික මෝටර් රථ | " | 17,671 | 31,338 | 41,151 | 77.3 | 31.3 |
| 1.3 | ද්විත්ව කාර්ය වාහන | " | 14,250 | 16,293 | 18,455 | 14.3 | 13.3 |
| 1.4 | මෝටර් බයිසිකල් | " | 31,955 | 36,755 | 42,089 | 15.0 | 14.5 |
| 1.5 | භාණ්ඩ ප්‍රවාහන වාහන | " | 5,660 | 5,561 | 8,703 | -1.7 | 56.5 |
| 1.6 | ඉඩම් වාහන | " | 8,340 | 7,652 | 8,405 | -8.2 | 9.8 |
| 1.7 | පෞද්ගලික බස්රථ | " | 115 | 60 | 158 | -47.8 | 163.3 |
| 1.8 | වෙනත් | " | 65 | 16 | 62 | 47.8 | 163.3 |
| 2. ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය (ශ්‍රී ල.දු.සේ.) | | | | | | | |
| 2.1 | ධාවන කිලෝමීටර් | '000 | 7,705 | 7,787 | 8,467 | 1.1 | 8.7 |
| 2.2 | මගී කිලෝමීටර් | දශලක්ෂ | 3,241 | 3,290 | 3,538 | 1.5 | 7.5 |
| 2.3 | බඩු ටොන් කිලෝමීටර් | දශලක්ෂ | 107 | 96 | 102 | -10.3 | 6.3 |
| 2.4 | මුළු ආදායම | රු. දශලක්ෂ | 938 | 1,030 | 1,190 | 9.8 | 15.5 |
| 2.5 | වර්තන වියදම් | රු. දශලක්ෂ | 1,826 | 1,742 | 2,256 | -4.6 | 29.5 |
| 2.6 | මෙහෙයුම් අලාභය | රු. දශලක්ෂ | 887 | 712 | 1,066 | -19.7 | 49.7 |
| 2.7 | ප්‍රාග්ධන වියදම් | රු. දශලක්ෂ | 4,624 | 4,187 | 3,457 | -9.5 | -17.4 |
| 3. ප්‍රාදේශීය බස් සමාගම් | | | | | | | |
| 3.1 | ධාවන කිලෝමීටර් | දශලක්ෂ | 348 | 332 | 313 | -4.6 | -5.7 |
| 3.2 | මගී කිලෝමීටර් | දශලක්ෂ | 20,259 | 19,154 | 17,716 | -5.5 | -7.5 |
| 3.3 | මුළු ආදායම | රු. දශලක්ෂ | 5,170 | 4,892 | 4,742 | -5.4 | -3.1 |
| 3.4 | මෙහෙයුම් වියදම් | රු. දශලක්ෂ | 6,012 | 6,467 | 6,362 | 7.6 | -1.6 |
| 3.5 | මෙහෙයුම් අලාභය | රු. දශලක්ෂ | 842 | 1,575 | 1,620 | 87.1 | 2.9 |
| 4. එයාර් ලංකා | | | | | | | |
| 4.1 | පියාසර කරන ලද පැය ගණන | පැය | 29,899 | 31,045 | 24,118 (ආ) | 3.8 | ලැ.නො. |
| 4.2 | මගී කි.මීටර් ප්‍රමාණය | දශලක්ෂ | 3,809 | 4,264 | 3,056 (ආ) | 11.9 | ලැ.නො. |
| 4.3 | මගීන් පැටවීමේ අනුපාතය | % | 69.9 | 75.9 | 69.7 (ආ) | 8.6 | ලැ.නො. |
| 4.4 | බර පැටවීමේ අනුපාතය | % | 63.1 | 68.6 | 62.1 (ආ) | 8.7 | ලැ.නො. |
| 4.5 | භාණ්ඩ ප්‍රවාහනය | මෙ.ටො. | 25,128 | 36,959 | 27,743 (ආ) | 47.1 | ලැ.නො. |
| 4.6 | සේවා නියුක්තිය | සංඛ්‍යාව | 5,089 | 4,793 | 4,782 (ආ) | -5.8 | ලැ.නො. |

(අ) තාවකාලික
(ආ) 1998 සැප්තැම්බර් දක්වා

මූලයන් : මෝටර් රථප්‍රවාහන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ජාතික ප්‍රවාහන කොමිසම
සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකිය. 1998 වර්ෂයේදී මෙම අංශයෙහි පලාත් මට්ටමින් පැවති සෘජු රැකියා අවස්ථා සංඛ්‍යාව 27,000 පමණ වෙතැයි ඇස්තමේන්තු කර ඇත. මේ අතර, ප්‍රා.ප්‍ර.ස. හා පෞද්ගලික ධාවකයන් මගින් මෝ.ප්‍ර.දෙ. හි කරන ලද මුළු නව ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව 1998 දී 3,190 දක්වා සියයට 60 කින් වැඩි විය.

බස් මගී ප්‍රවාහනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් රජයට උපදෙස් දෙනු ලබන ජාතික ප්‍රවාහන කොමිසම (ජා.ප්‍ර.කො.) විසින් රට තුළ වර්තමාන බස් සේවාව ඉහළ නැංවීමේ අරමුණින් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. පලාත් බලධාරීන්ගේ සහයෝගය ඇතිව පොදු බස් නැවතුම්පොළවල් භාවිතා කර පෞද්ගලික ධාවකයින් හා ප්‍රා.ප්‍ර.ස. විසින් පොදු කාලසටහන් අනුව බස් ධාවනය කරවීම සඳහා ජා.ප්‍ර.කො. විසින් පියවර ගෙන තිබේ. දනට පවතින මිටි වහල සහිත බස් රථ ධාවනයෙන් ඉවත් කිරීමේ කටයුතුද සිදු කෙරෙමින් පැවතිණි. ලෝක බැංකු ආධාර සහිතව හා ශ්‍රී.ලං.ම.ග.ම. රියදුරු අභ්‍යාස විද්‍යාලයේ සහයෝගය ඇතිව පෞද්ගලික බස් රථ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන, ජා.ප්‍ර.කො. විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ 1998 වර්ෂය අවසාන වනවිට, රියදුරන් 6,266 ක් හා කොන්දෙස්තරවරුන් 8,529 දෙනෙකු පුහුණු කර තිබිණි. මීට අමතරව ප්‍රා.ප්‍ර.ස. වලට අයත් තවත් 10,000 ක බස් රථ කාර්ය මණ්ඩලයකට පුහුණුව ලබා දෙනු ඇත. මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණු වන්නේ ඵලදායිතාවය ඉහළ නැංවීමත්, සේවය ඉහළ නැංවීමත් හා මගී ප්‍රවාහනයේදී මාර්ග ශික්ෂණය ඉහළ නැංවීමත්ය. දකුණු පලාත තුළ බස් හිමියන් දනුවත් කිරීමේ වැඩසටහනක්ද සාර්ථකව නිම කර තිබේ. පෞද්ගලික බස් රථ හේතුවෙන් අනතුරට ලක් වූ පුද්ගලයන්ට සහන සැලසීම, පලාත් අතර හා පලාත් තුළ බලපත්‍ර නිකුත් කිරීම හා ග්‍රාමීය බස් සේවා වෙනුවෙන් මුදල් ආධාර සැපයීම (රුපියල් දශ ලක්ෂ 212) ජා.ප්‍ර.කො. විසින් 1998 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද අනෙකුත් කටයුතුවලට ඇතුළත් වේ. ලෝක බැංකු ආධාර ඇතිව දීප ව්‍යාප්ත බස් ධාවනය පිළිබඳව මධ්‍යම බස් රථ තොරතුරු ක්‍රමයක් පිහිටුවීමටද ජා.ප්‍ර.කො. විසින් යෝජනා කර ඇත.

ආ.සං.බැ. ආධාර ඇතිව 1998 වර්ෂයේදී විවෘත කරන ලද මාර්ග ආරක්ෂාව පිළිබඳ මහ ලේකම් කාර්යාලය මහාමාර්ගවල රථ වාහන ප්‍රවාහනය විධිමත් කිරීමෙහි හා කළමනාකරණය කිරීමෙහි යෙදී සිටී. මෙම මහ ලේකම් කාර්යාලයේ උපදෙස් ඇතිව කොළඹ හා අවට ප්‍රදේශවල වර්ණාලෝක මාර්ග සංඥා රාශියක්ද 1998 වර්ෂයේදී පිහිටුවන ලදී. මාර්ග ඉදිකිරීම් හා සංවර්ධන සමාගම හා මොරටුව විශ්ව විද්‍යාලය සාමූහිකව ක්‍රියාත්මක කළ වර්ණාලෝක මාර්ග සංඥා දේශීය වශයෙන් නිපදවීමේ ව්‍යාපෘතියෙහි ප්‍රතිඵලයක් වශයෙන් මාර්ග සංඥා සඳහා වන වියදම සියයට අසූවකින් පමණ අඩු කර ගැනීමට හැකි වී ඇත.

වඩා හොඳ සේවයක් සාධාරණ පිරිවැයකට ලබා දීම සඳහා මගී ප්‍රවාහනය හා අදාළ රාජ්‍ය අංශයේ වර්තමාන සියයට 50 ක් පමණ වන කොටස සියයට 60 දක්වා ඉහළ නැංවිය යුතු බව ජාතික බස් ප්‍රවාහන ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා පත් කල කමිටුවක් විසින් නිර්දේශ කර ඇත. පවත්නා සම්පත් පාවිච්චි කිරීම උපරිම කිරීමෙන් කාර්යක්ෂම හා භාවිතා කරන්නාට හිතවත් ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීම මින් බලාපොරොත්තු වේ. ඵලදායීතාවය ඉහළ නැංවීම හා සුපරීක්ෂණ කටයුතු පහසු කිරීමටත් හැකි වන අයුරින් අවම වශයෙන් බස් රථ 50 ක්වත් සහිත පුද්ගලික බස් සමාගම් පිහිටුවීමේ අවශ්‍යතාවයද අවධාරණය කර ඇත. කෙසේ වුවද, පිරිවැය පියවා ගත නොහැකි මට්ටමක ගාස්තු තීරණය කිරීම බස් ප්‍රවාහනයෙහි පවත්නා ප්‍රධාන ගැටළුවකි. පෞද්ගලික අංශයේ මැදිහත් වීම මගින් මෙම අංශය සංවර්ධනය කිරීමට ඇති හැකියාව මෙමගින් වළකාලනු ලැබ තිබේ. මෙම මූලික තත්ත්වය පිළිබඳව අවධානය යොමු නොකර බස් ප්‍රවාහනයෙහි රාජ්‍ය අංශයේ කොටස ඉහළ නැංවීම පැරණි ප්‍රතිපත්ති වෙත ආපසු ගමන් කිරීමක් වනු ඇත.

මාර්ග ප්‍රවාහන අංශයෙහි වර්තමාන සංවර්ධනයන් අතර ප්‍රධාන වශයෙන් රාජ්‍ය ප්‍රවාහන ක්‍රමයේ පවතින දුර්වලතා හේතුවෙන් ප්‍රවාහනය සඳහා පෞද්ගලික වාහන යොද ගැනීමෙහි ඉහළ යෑමක් දක්නට ඇත. මෙම ප්‍රවණතාවය විශේෂයෙන්ම මුදුන් පැයවලදී නගර තුළ වාහන තදබදය ඇති වීමට හේතු වී තිබේ. මෙම ප්‍රවණතාවයෙහි කොටසක් වශයෙන් නගර තුළ පාසැල් වෑන් රථ, මෝටර් බයිසිකල් හා ත්‍රීරෝද රථ භාවිතය සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතියි. ආර්ථික කටයුතු ඉහළ නංවමින් හා රැකියා අවස්ථා සංවර්ධනය කිරීම තුළින් මෙම ප්‍රවණතාවය මගින් ආර්ථිකය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළද, අනවශ්‍ය වාහන තදබදය නැති කිරීම සඳහා මෙන්ම විශේෂයෙන්ම වඩා වැදගත් අංශයක් ලෙස මෙම වාහනවල ගමන් ගන්නා මගීන්ගේ ආරක්ෂාව සඳහා පාලන නීති රීති පද්ධතිය සෑහෙන පමණ සංවර්ධනය වී නොමැත. අනෙක් අතට, අනෙකුත් වාහන මුළු මාර්ග ධාරිතාවයෙන් සියයට 60 ක් පමණ භාවිතා කරන අතර ආර්ථිකයට වන දයකත්වය වඩා කැපී පෙනෙන එකක් වුවද, මගී ප්‍රවාහන බස් රථ භාවිතා කරන්නේ මාර්ග ධාරිතාවයෙන් ඉතා අඩු ප්‍රතිශතයකි. මේ අතර, පෞද්ගලික හා වාණිජ ආයතන මගින් සිය සේවකයන් ප්‍රවාහනය කිරීමද අයවැය දිරි ගැන්වීම් ලබා දීම තුළින් ධෛර්යමත් කර තිබේ. මෙම ආයතන විසින් බස් රථ මිලදී ගැනීම සඳහා දරන වියදම, ආදායම් බදු වලින් නිදහස් කර ඇත. මීට අමතරව, තීරු බදු වලින් නිදහස්ව බස් රථ ආනයනය කිරීමට මෙම ආයතනවලට අවකාශ සළසා දී තිබේ. බස් රථ එකලස් කිරීමෙහි නියැලී සිටින දේශීය සමාගම්වලටද කොටස් හා උපකරණ තීරු බදු වලින් නිදහස්ව ආනයනය කිරීමට ඉඩ දී ඇත. මෙම ප්‍රතිපත්ති විශේෂයෙන් මුදුන් පැයවලදී මගී ප්‍රවාහනය සඳහා වන ඉල්ලුම් බලපෑම අඩු කිරීමට හේතු වනු ඇතැයි අපේක්ෂිතය. මීට අමතරව, පෞද්ගලික අංශයේ බස් ධාවකයන් හට ආසන 40 ට වැඩි බස් රථ ආනයනය සඳහා ඉඩ ලැබෙන පරිදි තීරු බදු සහන ලබා දීම තවත් ව්‍යාප්ත කර තිබේ.

රාජ්‍ය අංශයේ ප්‍රවාහන ගාස්තු පිළිබඳ කමිටුව විසින් 1996 වර්ෂයේදී ප්‍රමාණවත් ගාස්තු වැඩි කිරීමක් නිර්දේශ කළද, රජය මගින් අවසර දෙනු ලැබුවේ 1996 ජූලි හා

මාර්තු සිට බලපැවැත්වෙන පරිදි බස් හා දුම්රිය ප්‍රවාහනය සඳහා පිළිවෙලින් සියයට 15 හා සියයට 20 ක ගාස්තු ඉහළ නැංවීමක් පමණි. අමතර කොටස්වල තියුණු මිල ඉහළ යාම, වැටුප් වැඩි වීම හා 1998 අප්‍රේල් මාසයේදී හඳුන්වා දෙන ලද භාණ්ඩ හා සේවා බද්ද යනාදිය හේතුවෙන් මේ වනවිට මෙම ගාස්තු ඉහළ නැංවීමෙහි ප්‍රතිලාභ හීනවී ගොස් ඇත. මෙම කර්මාන්තය තුළ පවතින අඩු ලාභ ආන්තිකයන්, සේවාවෙහි පහත වැටීමට පමණක් නොව බස් කර්මාන්තය තුළ නව ආයෝජන අධෛර්යමත් කිරීමටද හේතු වී තිබේ. වර්තමානයේ පවත්නා ගාස්තු ක්‍රමය දිගින් දිගටම ක්‍රියාත්මක වීම රාජ්‍ය අංශයේ බස් සමාගම් වලට සපයන සහනාධාර හේතුවෙන් ඉදිරියේදී රජයට බරක් ඇති කරනු ඇත. 1999 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රා. ප්‍ර. ස. වල සේවකයන් සඳහා පිරිනමන ලද වැටුප් වැඩි කිරීම සඳහා වන අමතර වියදම්ද අයවැය ප්‍රතිපාදන වැඩි කිරීම මගින් රජයට දැරීමට සිදු වනු ඇත. සාධාරණ ප්‍රමාණයකින් මගී ගාස්තු ඉහළ දැමීමේ බලවත් අවශ්‍යතාවයක් පවතින අතර එමගින් ලබා ගන්නා අමතර ආදායම වඩා හොඳ තත්ත්වයේ හා වඩා විශ්වාසදායක බස් සේවයක් මහජනතාවට ලබා දීම සඳහා සතුටුදායක අන්දමින් යොදා ගත යුතුය.

## දුම්රිය ප්‍රවාහනය

ප්‍රමාණවත් නොවන එන්ජින් හා මැදිරි සංඛ්‍යාව හා ක්ෂය වෙමින් පවතින දුම්රිය යටිතල පද්ධතිය යනාදී බොහෝ කල් සිට පවත්නා ප්‍රශ්නයන්ගෙන් දිගින් දිගටම පීඩා වින්දද, සැළකිල්ලට භාජනය වන වර්ෂය තුළදී ශ්‍රී.ලං.දු.සේ. ක්‍රියාකාරිත්වය තරමක වැඩි දියුණු වීමක් පෙන්නුම් කළේය. ඒ අනුව, ධාවන කිලෝ මීටර් ප්‍රමාණය දශ ලක්ෂ 8.5 දක්වා සියයට 9 කින් ඉහළ ගියේය. මගී කිලෝ මීටර් ප්‍රමාණයද දශ ලක්ෂ 3,538 දක්වා සියයට 8 කින් වැඩි වූ අතර ප්‍රවාහනය කරන ලද මගීන් ප්‍රමාණය දශ ලක්ෂ 87.4 දක්වා සියයට එකකින් ආන්තිකව වැඩි විය. භාණ්ඩ කිලෝ මීටර් ප්‍රමාණය ටොන් කිලෝ මීටර් දශ ලක්ෂ 102 දක්වා සියයට 6 කින් වැඩි වූ අතර ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.2 දක්වා සියයට 4 කින් ඉහළ ගියේය.

ක්‍රියාකාරිත්වයෙහි වැඩි දියුණු වීමක් දක්නට ලැබුනද, 1998 වර්ෂයේදී ශ්‍රී.ලං.දු.සේ. අඛණ්ඩව දුෂ්කරතාවලට මුහුණ දුන්නේය. ශ්‍රී.ලං.දු.සේ.ට මුහුණ දීමට සිදු වී ඇති ප්‍රශ්න විවිධාකාරය. නිරන්තර පීලි පැනීම්වලට ලක් වන හා වේග සීමා රාශියක් ක්‍රියාත්මක කිරීමට හේතු වී ඇති දුර්වල දුම්රිය මාර්ග පද්ධතිය, දුම්රිය එන්ජින් හා මැදිරිවල දුර්වල ක්‍රියාකාරිත්වය, යල් පැන ගිය මධ්‍යගත දුම්රිය පාලන හා සන්නිවේදන පද්ධතිය හා යෝග්‍ය නොවන තාක්ෂණික තත්ත්වයන් ආදිය ප්‍රධාන තාක්ෂණික ප්‍රශ්න වේ. දුර්වල සේවක ඵලදායීතාවය ප්‍රධාන අභ්‍යන්තර සමාජ ප්‍රශ්නයක් වන අතර උතුරු හා නැගෙනහිර පළාත්වල නොවිසඳී පවත්නා ආරක්ෂක තත්ත්වය ශ්‍රී.ලං.දු.සේ. මුහුණ දෙන ප්‍රධාන බාහිර සමාජ ප්‍රශ්නයකි. කිසිසේත්ම පිරිවැය පියවාගත නොහැකි, අතාත්වික අන්දමින් පහළ මට්ටමක ඇති දුම්රිය ගාස්තු මෙම ප්‍රශ්ණ තවත් සංකීර්ණ කරනු ලබයි. මේ අනුව බලන විට, 1999 අයවැයෙන් ඉදිරිපත් කරන ලද දුම්රිය ගාස්තු ඉහළ නැංවීමේ යෝජනාව අවසන් මොහොතේ ඉවත් කර ගැනීම කණගාටුදායක සිදු වීමකි.

මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා පියවර කිහිපයක් ගෙන ඇති අතර සේවාවෙහි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම, දුම්රිය එන්ජින් හා මැදිරි සංඛ්‍යාව ශක්තිමත් කිරීම හා ශ්‍රී.ලං.දු.සේ. යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යන අංශ විශේෂයෙන් වැදගත් වේ. ඒ අනුව, විශේෂයෙන් පොල්ගහවෙල/මහනුවර හා නාවලපිටිය/ගලබොඩ අතර ගමන් කරන පාසැල් ළමුන්ගේ පහසුව සඳහා නව දුම්රිය දෙකක් හඳුන්වා දීම මගින් ප්‍රධාන මාර්ගයේ (උඩරට) දුම්රිය සේවා කාලසටහන ප්‍රතිශෝධනය කරන ලදී. කොළඹ අර්ධ නාගරික ප්‍රදේශය තුළ කොළඹ හා ගම්පහ අතර හඳුන්වා දෙන ලද සීඝ්‍රගාමී දුම්රිය, සන්ධ්‍යා භාගයේ කාර්යාල දුම්රිය තදබදය ලිහිල් කිරීමට උපකාරී විය. ගාල්ල හා කොළඹ කොටුව අතර නව නගරාන්තර දුම්රිය සේවයක් හඳුන්වා දෙන ලදී. ත්‍රිකුණාමලය මාර්ගයේ දිවා දුම්රියක් ක්‍රියාත්මක වූ අතර, ආරක්ෂක හේතු මත මඩකලපුව මාර්ගයේ ධාවනය පොළොන්නරුවෙන් නතර කරන ලදී. 1998 වර්ෂය තුළදී උප දුම්රිය ස්ථාන පහක් විවෘත කරන ලදී. මීට අමතරව කට්ටුව, පූනාව, අග්බෝපුර, තිස්මල්පුර හා පින්නවල යන ස්ථානවලට නව දුම්රිය ස්ථාන ලබා දීමට පියවර ගෙන තිබේ. මේ අතර, සියයට 60 ක් පමණ වූ දුම්රිය ගමන්වාර ප්‍රමාණයක් නියමිත කාලසටහන් වලට අනුව ගමනාන්තයට ළඟාවූ අතර, එමගින් කාලසටහන් අනුව දුම්රිය ධාවනය කිරීමෙහි වැඩි දියුණුවක් පෙන්නුම් කළේය. කොළඹ අර්ධ නාගරික ප්‍රදේශය තුළ කාලසටහනට අනුව ධාවනය වීම තවදුරටත් වර්ධනය වූ අතර, සියයට 75 ක ප්‍රමාණයක් නියමිත වේලාවට ගමනාන්තය කරා ළඟා විය. 1998 වර්ෂය තුළ දුම්රිය අවලංගු කිරීම් සිදු වූයේ මුළු කාලසටහන්ගත දුම්රිය ගමන් ප්‍රමාණයෙන් සියයට 5 ක් පමණි. මගීන්ගේ අවශ්‍යතා අනුව දුම්රිය කාලසටහන් නැවත සකස් කිරීමට මගී සංවිධාන සමඟ පැවැත්වූ සාකච්ඡා උපකාරී විය.

සාමාන්‍ය ධාවන කටයුතු සඳහා යෙදවිය හැකි දුම්රිය එන්ජින් සංඛ්‍යාව ප්‍රමාණවත් පරිදි පවතින බව සහතික කිරීම සඳහා ශ්‍රී.ලං.දු.සේ. අඛණ්ඩව ප්‍රයත්න දැරීය. ඒ අනුව රුපියල් දශ ලක්ෂ 180 ක වියදමින් ඉන්දියානු දුම්රිය එන්ජින් දෙකක් දැනට පවත්නා දුම්රිය එන්ජින් සමූහයට එකතු කරන ලද අතර, දුම්රිය එන්ජින් නැවත බල ගැන්වීමේ වැඩසටහන යටතේ ඉතිරිව පැවැති M5 වර්ගයේ එන්ජිමක් 1998 වර්ෂයේදී සේවය සඳහා මුදා හරින ලදී. කන්කසන්තුරේ ප්‍රදේශයෙහි වසර 10 කට ආසන්න කාලයක් සිරවී පැවති M2 වර්ගයේ දුම්රිය එන්ජිමක් කොළඹට ගෙන එනු ලැබූ අතර අළුත්වැඩියා කිරීම් වලින් පසුව සාමාන්‍ය සේවය සඳහා එක් කරන ලදී. ජපානයේ වි. ආ. ස. අ. ආධාර යටතේ W3 පන්තියේ දුම්රිය එන්ජින් 4 ක්ද පුනරුත්ථාපනය කිරීමෙන් පසුව සේවයට යොදවන ලදී. මීට අමතරව වසර 2000 මැද භාගය වනවිට දුම්රිය

එන්ජින් 10 ක් සැපයීම සඳහා ටෙන්ඩරයක් ප්‍රදානය කරන ලදී. ඩීසල් බලවේග කට්ටල 15 ක් සැපයීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලද අතර ඉන් ඒකක 6 ක් 1999 වර්ෂයේදී සපයනු ඇත. මෙය, බලවේග කට්ටල් ධාරිතාවය ශක්තිමත් කිරීමට හේතු වනු ඇත. මාලිගාවත්තෙහි පිහිටි විද්‍යුත් දුම්රිය අළුත්වැඩියා අංගනය වැඩිදියුණු කිරීම සඳහා සැළසුම් සකස් කර ඇති අතර ව්‍යාපෘතියෙහි පළමු අදියර 1998 වර්ෂයේදී සම්පූර්ණ කරන ලදී. මෙය අළුත්වැඩියා කිරීම්වල ගුණාත්මක භාවය වැඩි කිරීමට හේතු වනු ඇත.

දුම්රිය මාර්ග පද්ධතියේ තත්ත්වය ඉහළ නැංවීම හා අතිරේක දුම්රිය මාර්ග ගොඩ නැගීමේ අපේක්ෂාවෙන් ශ්‍රී.ලං.දු.සේ. විසින් වැඩසටහන් ගණනාවක් වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදී. වි.ආ.ස.අ. ආධාර සහිතව ක්‍රියාත්මක කරනු ලබන දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 1998 වර්ෂය තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක විය. මීට අමතරව, කි.මී. 40 ක පමණ දුම්රිය මාර්ගය දේශීය අරමුදල් යොදගෙන පුනරුත්ථාපනය කරන ලදී. පොල්ගහවෙල සිට රඹුක්කන දක්වා දෙවන දුම්රිය මාර්ගයක් ඉදි කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලද අතර පානදුර සිට අලුත්ගම දක්වා තවත් දෙවන දුම්රිය මාර්ගයක ඉදි කිරීම් කටයුතු වර්ෂය තුළදී ආරම්භ කර නිම කරන ලදී. රාගම සිට මීගමුව දක්වා දෙවන දුම්රිය මාර්ගයක් ඉදි කිරීමේ කටයුතුද වර්ෂය තුළදී ආරම්භ කරන ලදී. මුහුදුබඩ මාර්ගය ඔස්සේ නව වර්ණාලෝක විදුලි සංඥ පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතුද සිදු කෙරෙමින් පවතියි. තදාසන්න ප්‍රදේශවල දුම්රිය ජාලය විද්‍යුත්කරණය කිරීම සඳහා පියවර ගනු ලබමින් පවතින අතර දනටමත් මේ සම්බන්ධව කැබිනට් පත්‍රිකාවක්ද ඉදිරිපත් කර තිබේ.

ශ්‍රී.ලං.දු.සේ. මූල්‍ය තත්ත්වය පිළිබඳව සලකා බලනවිට, පසුගිය වර්ෂයට සාපේක්ෂව 1998 දී මුළු ආදයම සියයට 8 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. මෙයට ප්‍රධාන වශයෙන්ම භාණ්ඩ ප්‍රවාහනය හා අනෙකුත් මූලයන් මඟින් ලද ආදයමෙහි පිළිවෙලින් ඇති වූ සියයට 20 ක හා සියයට 27 ක තියුණු වැඩිවීම් හේතු විය. නඩත්තු වියදම සියයට 26 කින් හා වැටුප් සඳහා වූ වියදම සියයට 2 කින් ඉහළ යෑම හේතුවෙන් වර්තන වියදම රුපියල් දශ ලක්ෂ 2,030 දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ නැගිනි. මේ අතර, 1997 වර්ෂය හා සසඳනවිට ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 3,504 දක්වා කැපී පෙනෙන අඩු වීමක් පෙන්නුම් කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු වියදම සියයට 11 කින් පහත වැටුණි. මේ හේතුවෙන්, ශ්‍රී.ලං.දු.සේ. මෙහෙයුම් අලාභය රුපියල් දශ ලක්ෂ 917 දක්වා සියයට 29 කින් ඉහළ ගියේය. මෙම තත්ත්වය අනුව ශ්‍රී.ලං.දු.සේ. යේ අලාභය අවම කර ගැනීම සඳහා පවත්නා සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම මෙන්ම සාධාරණ මට්ටමකින් මගී ගාස්තු ඉහළ නැංවීමක්ද අවශ්‍ය වන්නේය.

දුම්රිය ප්‍රවාහන සේවය වැඩි දියුණු කිරීම සඳහා පියවර කිහිපයක් ගැනීමට ශ්‍රී.ලං.දු.සේ. බලාපොරොත්තු වේ. ඒ අනුව, නිදහස් ප්‍රවේශ ප්‍රතිපත්තියක් යටතේ ශ්‍රී.ලං.දු.සේ. හා පෞද්ගලික අංශයේ භාණ්ඩ ප්‍රවාහන කරුවන් සාමූහිකව භාණ්ඩ ප්‍රවාහන සේවා පවත්වාගෙන යෑම සඳහා දුම්රිය මාර්ගය භාවිතා කිරීමට ඉඩ දෙනු ඇත. භාණ්ඩ ප්‍රවාහනය වාණිජකරණය කිරීම තුළින් ශ්‍රී.ලං.දු.සේ. ට අතිරේක ආදයමක් ලබා ගැනීම මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණය. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී.ලං.දු.සේ. ව්‍යාපාර ඒකකය සැළකිය යුතු ප්‍රගතියක් 1998 වර්ෂය තුළදී පෙන්නුම් කළේය. මීට අමතරව, ශ්‍රී.ලං.දු.සේ. කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා කළමනාකාරිත්වය ප්‍රතිව්‍යුහගත කිරීමට ජාතික සංවර්ධන සභාව යෝජනා කර ඇත. දුම්රිය කළමනාකරණ මණ්ඩලයක් හරහා ශ්‍රී.ලං.දු.සේ. ට යම් ප්‍රමාණයක කළමනාකරණ ස්වාධීනත්වයක් ලබා දීම මඟින් මෙම යෝජනාව ඉක්මණින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. ක්‍රියාකාරිත්ව මධ්‍යස්ථාන ඇති කිරීමේ නව සංකල්පයද ක්‍රියාත්මක කිරීමට නියමිතය.

## සිවිල් ගුවන් සේවාව

සිවිල් ගුවන් සේවා අංශය පිළිබඳව රට තුළ පවත්නා ප්‍රධානතම ආයතනය වශයෙන් සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව (සි.ගු.සේ.දෙ.) මෙම ක්ෂෙත්‍රයේ ජාත්‍යන්තර අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මූලික වශයෙන් සිවිල් ගුවන් සේවා ප්‍රවාහනය පිළිබඳව ජාත්‍යන්තර ආරක්ෂක ප්‍රමිතීන් හා මෙහෙයුම් ප්‍රමිතීන් සහතික කිරීමේ වගකීම උසුලයි. සි.ගු.සේ.දෙ. වේ කාර්යයන්වලට, ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම් හා ගුවන් ගමන් අයිතිවාසිකම් පිළිබඳව සාකච්ඡා පැවැත්වීම, සිවිල් ගුවන් යානා ලේඛණගත කිරීම, සිවිල් ගුවන් යානා සඳහා ගුවන් යෝග්‍යතා සහතික නිකුත් කිරීම, ගුවන් යානා අනතුරු විමර්ශනය, ගුවන් නියමුවන්, ගුවන් යානා ඉංජිනේරු හා අනෙකුත් මෙහෙයුම් පිරිස් සහ ගුවන් ගමන් පාලක පිරිසට මෙන්ම ගගන යාත්‍රාංගන සහ ගුවන් සේවා මෙහෙයුම් කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීම අයත් වේ. ලෝකයට ප්‍රවේශ වන ශ්‍රී ලංකාවේ දොරටුව ලෙස ක්‍රියාත්මක වන බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට අමතරව, දේශීය ගුවන් තොටුපල 12 ක් ශ්‍රී ලංකාව තුළ ඇත. මෙම දේශීය ගුවන් තොටුපලවල් බොහොමයක් සිවිල් ගුවන් යානා සඳහා විරලව යොද ගනු ලබන අතර සමහර ගුවන් තොටුපලවල් ප්‍රධාන වශයෙන් හමුදමය කටයුතු සඳහා යොද ගනු ලබයි. මූලික වශයෙන් ගුවන් යානා බදු ගැනීම මඟින් ගුවන් සේවා සපයන පෞද්ගලික ගුවන් ප්‍රවාහන සමාගම් කිහිපයක් විසින්ද ඔවුන්ගේ එම සීමිත කටයුතු සඳහා මෙම ගුවන් තොටුපල වලින් සමහරක් යොද ගනු ලබයි.

ජාතික ගුවන් සේවය, එනම් එයාර් ලංකා සමාගමේ කොටස් වලින් සියයට 26 ක් ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 43 කට එමිරේට්ස් ගුවන් සමාගමට (එ.ගු.ස.) පැවරීම මඟින් 1998 දී එහි අයිතියෙහි වෙනස්කම් කරන ලදී. එයාර් ලංකා සමාගමේ කළමනාකාරිත්වයද එ.ගු.ස. වෙත පවරන ලදී. මෙම අයිතිය වෙනස් කිරීමෙන් පසුව හා නව කළමනාකාරිත්වය යටතේ එයාර් ලංකා සමාගම සුවිශාල ප්‍රාග්ධන ආයෝජන වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර, ඒ යටතේ නව එයාර් බස් ගුවන් යානා 6 ක් මිලදී ගැනීමට අපේක්ෂා කරයි. ඒ සඳහා අවශ්‍ය ඇනවුම් දනටමත් භාර දී ඇත. මීට අමතරව, එයාර් ලංකා සමාගමට උපරිම ප්‍රතිලාභ

අත් වන පරිදි ගුවන් කාලසටහන්ද තාර්කික ලෙස නැවත සකස් කර තිබේ. 1998 දී එයාර් ලංකා සමාගමෙහි පියාසර කරන ලද කිලෝ මීටර් ප්‍රමාණය සියයට 6 ක වර්ධනයක් පෙන්වමින් කිලෝ මීටර් 22,925,000 දක්වා ළඟා විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල මඟින් කරන ලද භාණ්ඩ මෙහෙයුම් ප්‍රමාණය 1997 වර්ෂය හා සසඳන විට සියයට 4 ක වැඩි වීමක් පෙන්වීය. එයාර් ලංකා සමාගමේ මුළු ආදයම රුපියල් දශ ලක්ෂ 17,608 ක් විය. මෙහෙයුම් පිරිවැය රුපියල් දශ ලක්ෂ 14,640 ක් වූ හෙයින් එයාර් ලංකා සමාගමේ බදු අය කිරීමෙන් පසු ලාභය රුපියල් දශ ලක්ෂ 1,642 ක් විය.

මෑතකදී සිදු කරන ලද එයාර් ලංකා සමාගමේ වෙනස්කම් හේතුවෙන් ගුවන් මඟී ප්‍රවාහන අංශය තුළ තරමක වැඩි දියුණුවක් පෙන්නුම් කළද, සිවිල් ගුවන් සේවාව සමස්ථයක් වශයෙන් ගත් කල රට තුළට ලබා ගත හැකි උපරිම ප්‍රතිලාභ ජනිතකර ගතහැකි හැකියා මට්ටමට තවමත් සංවර්ධනය වී නොමැත. එසේ හෙයින්, ආරක්ෂක ප්‍රමිතීන් විගණනය කිරීමට හා සි.ගු.සේ.දෙ. ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයෙන් (ජා.සි.ගු.සේ.ස.) ඉල්ලා සිටින ලදී. ජා.සි.ගු.සේ.ස. විසින් ක්‍රියාකාරී සැළසුමක් පිළියෙල කර ඇති අතර එහි යෝජනා ක්‍රියාත්මක කිරීම දැනටමත් සිදු කෙරෙමින් පවතියි. ඒ අනුව, සි.ගු.සේ.දෙ., අධිකාරියක් මඟින් කළමනාකරණය කරනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය බවට පත් කිරීමට බලාපොරොත්තු වේ.

මූලික වශයෙන් කැප වීමෙන් යුත් පරිශ්‍රමයක් නොමැති වීම හා ලෝකය තුළ ඇති වෙමින් පවත්නා සීඝ්‍ර වෙනස්වීම්වලට අනුකූල වන පරිදි සකස් වීමට නොහැකි වීම හේතුවෙන් ගුවන් ප්‍රවාහන අංශයෙහි සමස්ත ක්‍රියාකාරිත්වය වර්ෂ ගණනාවක් තිස්සේ සැළකිය යුතු දියුණුවක් නොලබා පැවතිනි. මඟී ප්‍රවාහන අංශය පිළිබඳව සලකා බලනවිට, මෑත කාලයේදී තරමක වර්ධනයක් පෙන්නුම් කර ඇත්තේ ජාතික ගුවන් සේවාව පමණි. පෞද්ගලික මෙහෙයුම් කරුවන් වඩා පෘථුල සේවයක් ලබා දීමට කැමැත්තෙන් සිටින අතර ඒ සඳහා දැනටමත් විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කර ඇත. නමුත් ආරක්ෂක හේතූන් මෙන්ම පැහැදිලි හා සෘජු සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තියක් නොමැති වීම ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබේ. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් ගුවන් ගමන් හා සංචාරක කර්මාන්තය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් දැනට ළඟා කරගෙන ඇති තත්ත්වයට අමතරව වාණිජ වශයෙන් ශක්තිමත් කර්මාන්තයක් ලෙසට ගුවන් සේවා අංශය දියුණු කිරීමේ සැලකියයුතු හැකියාවක් රට තුළ පවතී. ගුවන් මඟීන් හා භාණ්ඩ මාරු වන ස්ථානයක් වශයෙන් මෙන්ම අනෙකුත් ගුවන් ප්‍රවාහනය සම්බන්ධ සේවාවන් සඳහා කලාපය තුල ප්‍රධාන ගුවන් තොටුපලක් වශයෙන් නැඟී සිටීමේ සියළු හැකියාවන් ශ්‍රී ලංකාව සතුව ඇත. ජාත්‍යන්තර ගුවන් සේවා නඩත්තු අංගනයක් ඉදි කිරීම, ගුවන් සේවා සම්බන්ධ නිෂ්පාදන කර්මාන්ත දියුණු කිරීම, ගුවන් සේවා සම්බන්ධ සේවා කර්මාන්ත උසස් කිරිම හා ගුවන් භාණ්ඩ ප්‍රවාහන සේවා සැපයීම යනාදිය මෙම කර්මාන්තයට මෙන්ම රටටද ප්‍රතිලාභ ඇති කරගත හැකි ප්‍රධානතම දියුණු කළහැකි අංශයන්ගෙන් සමහරකි. අනෙකුත් යටිතල සේවාවන්වලට මෙන්ම මෙම අංශයටද අදල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන අරමුදල්, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සපයා ගැනීමට ඉදි කිරීම, ක්‍රියාත්මක කිරීම හා අයිතිය දැරීම (BOO)/ ඉදි කිරීම, ක්‍රියාත්මක කිරීම හා පැවරීම (BOT) යන ක්‍රමයන් යොදගත හැකිය.

## වරාය සේවා

වර්ෂයකට හසුරුවනු ලබන බහලු ප්‍රමාණය අනුව දැනට කොළඹ වරාය ලෝකයේ බහලු හසුරුවන වරායන් අතරින් 26 වන ස්ථානය හිමි කරගෙන ඇත. කොළඹ වරාය වර්තමානයේදී එහි වර්ෂයකට හැසිරවිය හැකි උපරිම සැළසුම්ගත ධාරිතාවය වන බහලු ඒකක (අඩි 20 ට සමාන බහාලු ඒකක) දශ ලක්ෂ 1.7 මට්ටමින් ක්‍රියාත්මක වේ. ජාත්‍යන්තර නාවික ගමන් මාර්ග වලට ආසන්නව කොළඹ වරායෙහි පිහිටීම හා දකුණු ආසියාතික කලාපයේ වෙළෙඳපොළ වර්ධනය වෙමින් පැවතීම යන කරුණු මත බහලුගත භාණ්ඩ හැසිරවීම ඇරඹී වසර 18 ක් වැනි කෙටි කලක් තුළදී කොළඹ වරායට මෙම තත්ත්වය කරා ළඟා වීමට හැකි විය. කෙසේ වුවද, භාණ්ඩ හැසිරවීමෙහි දක්නට ලැබුණු සීඝ්‍ර වර්ධනය 1998 වර්ෂයේ සිට නැවතී ඇති බවක් පෙනේ. ධාරිතාවෙහි පවතින සීමාකම්, පෙරදිග ආසියානු මූල්‍ය අර්බුදයෙහි බලපෑම, මෙහෙයුම් කාර්යක්ෂමතාව අඩු මට්ටමක පැවතීම හා විශේෂයෙන්ම භාණ්ඩ ප්‍රතිනැව්ගත කිරීමේ කටයුතු සඳහා ලෝකයේ අනෙකුත් වරායන් වෙතින් එල්ල වන දැඩි තරඟකාරිත්වය ආදිය මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. කොළඹ වරාය ප්‍රතිනැව්ගත භාණ්ඩ කෙරෙහි දැඩි රැඳියාවක් (මුළු භාණ්ඩ හැසිරවීම් වලින් සියයට 75 ක් පමණ ප්‍රතිනැව්ගත භාණ්ඩ වේ.) දක්වන නිසා බාහිර ලෝකයෙහි ඇති වන ඕනෑම නව ප්‍රවණතාවයක් කොළඹ වරායෙහි මෙහෙයුම් කෙරෙහි කැපී පෙනෙන බලපෑමක් ඇති කරයි. ආසියානු කලාපය තුළ නව වරායන් හා පර්යන්ත රාශියක් ඉදි කෙරෙමින් පවතින අතර එවැනි එක් වරායක් වන ඕමානයේ සලාලාහි නව වරාය 1998 වර්ෂයේ අග භාගයේ සිට බහලු මෙහෙයුම් කටයුතු සඳහා විවෘත කර ඇත. මෙම වරාය සතුව බහලු ඒකක 900,000 ක් හැසිරවීමේ ධාරිතාවයක් වර්තමානයේදී පවතින අතර වසර 2000 දී ඉදිකිරීම් සම්පූර්ණ කිරීමෙන් පසුව බහලු ඒකක දශ ලක්ෂ 1.9 ක ප්‍රමාණයක් හැසිරවිය හැකි වනු ඇත. තවත් එවැනි නව ප්‍රධාන පර්යන්තයක් යේමනයේ ඒඩ්න් හිදී 1999 වර්ෂයේ මුල් භාගයේදී විවෘත කිරීමට නියමිතය. ඉන්දියාවේද ඉදිරි වර්ෂ කිහිපය තුළදී වරාය පහසුකම් ඉහළ නැංවීමේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. මෙයට ජවහර්ලාල් නේරු වරායෙහි ඉදි වන වර්ෂයකට බහලු ඒකක 500,000 ක් හැසිරවීමේ ධාරිතාවයෙන් යුත් 'නව ෂෙවා' බහලු පර්යන්තය ඉදිකිරීමද අයත් වේ. මැදපෙරදිග රටවල ප්‍රධාන වරායන්ද පුළුල් වෙමින් පවතී. සිංගප්පූරුවද එහි ධාරිතාවය සැළකිය යුතු පරිදි වැඩි කිරීමෙහි සැලසුමක් ක්‍රියාත්මක කරමින් සිටී. ආසියානු කලාපය තුළ බහලු භාණ්ඩ ප්‍රතිනැව්ගත කිරීමෙහි වර්ධන වේගයට වඩා, බහලු හැසිරවීමෙහි

**5.7 සංඛ්‍යා සටහන**
**වරාය සේවා ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 1996 | 1997 | 1998(අ) | ප්‍රතිශත වෙනස 1997 | ප්‍රතිශත වෙනස 1998(අ) |
|---|---|---|---|---|---|
| 1. පැමිණි නැව් සංඛ්‍යාව | 3,857 | 4,087 | 4,233 | 6 | 4 |
| කොළඹ | 3,467 | 3,627 | 3,879 | 5 | 7 |
| ගාල්ල | 84 | 56 | 104 | -33 | 86 |
| ත්‍රිකුණාමලය | 306 | 404 | 250 | 32 | -38 |
| 2. මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000) | 22,722 | 26,832 | 26,847 | 18 | 0 |
| කොළඹ | 20,885 | 25,117 | 24,793 | 20 | -1 |
| ගාල්ල | 236 | 182 | 402 | -23 | 121 |
| ත්‍රිකුණාමලය | 1,601 | 1,533 | 1,652 | -4 | 8 |
| 3. බහාලූ මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ආ) (ඇ) | 1,356 | 1,687 | 1,714 | 24 | 2 |
| 4. අන්තර් නැව් බහාලූ ප්‍රමාණය (TEUs '000) (ඈ) | 980 | 1,232 | 1,191 | 26 | -3 |
| 5. ආදයම (රු.දශලක්ෂ) | 9,007 | 10,974 | 13,638 | 22 | 24 |
| කොළඹ | 8,775 | 10,731 | 13,221 | 22 | 23 |
| ගාල්ල | 81 | 81 | 218 | 0 | 170 |
| ත්‍රිකුණාමලය | 151 | 162 | 199 | 8 | 23 |
| 6. වියදම (රු.දශලක්ෂ) | 6,551 | 8,194 | 8,590 | 25 | 5 |
| කොළඹ | 6,188 | 7,807 | 8,163 | 26 | 5 |
| ගාල්ල | 150 | 152 | 186 | 2 | 22 |
| ත්‍රිකුණාමලය | 213 | 235 | 241 | 10 | 3 |
| 7. ශුද්ධ ලාභය - බදු ගෙවීමට පෙර (රු.දශලක්ෂ) | 2,456 | 2,780 | 5,048 | 13 | 82 |
| කොළඹ | 2,587 | 2,924 | 5,059 | 13 | 73 |
| ගාල්ල | -69 | -72 | 32 | 4 | -145 |
| ත්‍රිකුණාමලය | -62 | -73 | -42 | 17 | -42 |
| 8. සේවක සංඛ්‍යාව | 17,476 | 19,033 | 18,957 | 9 | 0 |
| කොළඹ | 15,589 | 17,101 | 17,181 | 10 | 0 |
| ගාල්ල | 841 | 831 | 759 | -1 | -9 |
| ත්‍රිකුණාමලය | 1,046 | 1,101 | 1,017 | 5 | -8 |
| 9. ඵලදායිතා දර්ශක (ප්‍රධාන බහාලූ තොටකා) | | | | | |
| පැයකට ග්‍රැන්ට්‍රි දොඹකර මෙහෙයුම් වාර ගණන (දළ) | 14 | 16 | 16 | 14 | 0 |
| පැයකට ග්‍රැන්ට් දොඹකර මෙහෙයුම් වාර ගණන (ශුද්ධ) | 15 | 17 | 18 | 13 | 6 |

(අ) තාවකාලික
(ආ) බහාලූ හසුරුවනු ලබන්නේ කොළඹ වරායේ දී පමණි.
(ඇ) TEUs= අඩි 20 ට සමාන බහාලූ ඒකක
(ඈ) නැන්මාරු මෙහෙයුම් රහිතව

මූලය : ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ධාරිතාවය වේගයෙන් වර්ධනය වෙමින් පවතින බව මෙම තත්ත්වය පෙන්නුම් කරයි. මෙවැනි තත්ත්වයන් යටතේ ප්‍රධාන යාත්‍රා හිමි නැව් සමාගම් ආකර්ශනය කර ගැනීමට හා කලාපයේ ප්‍රධාන වරායක් වශයෙන් දිගටම ක්‍රියාත්මක වීමට නම් කොළඹ වරායෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කළයුතු අතරම ධාරිතාවයද වැඩි කිරීම සඳහා අවශ්‍ය පියවර වහා ගත යුතුව ඇත.

1998 වර්ෂය තුළදී කොළඹ, ගාල්ල හා ත්‍රිකුණාමලය යන වරායන් වෙත පැමිණි මුළු නැව් ප්‍රමාණය 4,233 දක්වා සියයට 4 කින් වැඩි විය. කොළඹ වරායට පැමිණි භාණ්ඩ නැව් ප්‍රමාණය සියයට 7 කින් වැඩි වූ අතර, අළුත්වැඩියා කටයුතු, ඉන්ධන ලබා ගැනීම හා අනිකුත් සේවා සඳහා පැමිණි නැව් සංඛ්‍යාව 74 දක්වා සියයට 20 කින් අඩු විය. සාපේක්ෂ වශයෙන් ඉහළ ඉන්ධන මිල ගණන් හා සීමිත ඉන්ධන සැපයුම හේතුවෙන් විශේෂයෙන් සේවා ලබා ගැනීම සඳහා කොළඹ වරායට නැව් පැමිණීම පසුගිය වර්ෂ කිහිපය තුළදී දිගටම අඩු වෙමින් පවතී. මේ අතර 1997 දී වූ සියයට 7 ක වැඩිවීමට සාපේක්ෂව 1998 දී හසුරුවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය ආන්තික වශයෙන් අඩු විය. සියයට 24 ක වැඩි වීමක් පෙන්වූ 1997 වර්ෂය හා සසඳනවිට 1998 වර්ෂයේ බහලූ මෙහෙයුම් ප්‍රමාණය බහලූ ඒකක 1,714,000 ක් දක්වා සියයට 2 කින් පමණක්

වර්ධනය විය. 1997 වර්ෂයේ ප්‍රතිනැව්ගත බහලු හැසිරවීමේ වූ සියයට 7 ක වර්ධනය හා සසඳනවිට 1998 දී බහලු ඒකක 1,191,000 දක්වා සියයට තුනකින් අඩු විය. කෙසේ වුවද, විදේශ වෙළඳාමෙහි සිදු වූ ප්‍රසාරණය හේතුවෙන් දේශීය බහලු හැසිරවීමේ ප්‍රමාණය බහලු ඒකක 478,698 දක්වා සියයට 15 කින් වර්ධනය විය. මේ අතර, ගාල්ල හා ත්‍රිකුණාමල වරායන්හි ක්‍රියාකාරිත්වය 1998 වර්ෂය තුළදී සතුටුදායක ලෙස වර්ධනය විය. ගාල්ල වරායෙහි භාණ්ඩ මෙහෙයුම් ප්‍රමාණය දෙගුණයකටත් වඩා වැඩි වූ අතර ත්‍රිකුණාමලයෙහි එය සියයට 8 කින් වැඩි විය.

කොළඹ වරායේ ප්‍රතිනැව්ගත කිරීමේ බහලු හැසිරවීම් අඩු වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක කිහිපයක් වෙයි. පළමුවෙන්ම, නිව් වර්ල්ඩ් අලයන්ස් වැනි ප්‍රධාන නැව් සමාගම් කිහිපයක් ඒකාබද්ධ වීම සහ එන්.ඕ.එල්. සමාගම විසින් ඒ.පී.එල්. සමාගම මිලට ගැනීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1998 වර්ෂය තුළදී කොළඹ වරායට බහලු ඒකක 100,000 ක් පමණ අහිමි විය. දෙවනුව, ඕමානයේ සලාලාහි මීනා රිසුට් වරාය විවෘත කිරීමත් සමඟම සීලන්ඩ්/මර්ස්ක් කොන්සෝටියම් සමාගම් ඔවුන්ගේ ප්‍රතිනැව්ගත හැසිරවීම් වලින් වැඩි කොටසක් කොළඹ සිට සලාලා වෙත හැරවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් බහලු ඒකක 35,000 ක් පමණ අහිමි විය. තෙවනුව, නැව් දෙකක් අනතුරට ලක්වීම හේතුවෙන් ජය බහලු පර්යන්තයේ දෙවන පර්යන්තය මාස කිහිපයක් වසා තැබීමට සිදු වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නෞකා වරාය තුළට කැඳවීමේ ප්‍රමාදයන් හේතුවෙන් සමහර නෞකා කොළඹ වරාය මග හැර යන ලදී. අවසාන වශයෙන්, සමහර ප්‍රධාන ඒකාබද්ධ නැව් සමාගම් විසිරී යෑම හා කොළඹ වරාය තුළට නෞකා කැඳවීමේ ප්‍රමාදයන් හේතුවෙන් සමහර නැව් කොළඹ වරායට නොපැමිණෙන ලදී. නව නැව් සමාගම් කිහිපයක් කොළඹ වරායට පැමිණීම ආරම්භ කිරීම හේතුවෙන් ප්‍රතිනැව්ගත බහලු හැසිරවීමේ ප්‍රමාණයෙහි මෙම අඩු වීමෙන් කොටසක් පියවා ගැනීමට හැකි විය. තවද, ජය කන්ටේනර් පර්යන්තයෙහි අතිරේක උපකරණ යෙදවීම, නව පර්යන්තයක් විවෘත කිරීම හා වැඩ මුර ක්‍රමය දිනකට පැය 24 ම වැඩ කරන ක්‍රමයක් බවට වෙනස් කිරීම යනාදිය නෞකා ආපසු යැවීමේ කාලය අඩු කර ගැනීමට හා ප්‍රතිනැව්ගත බහලු තවදුරටත් අඩුවීම නතර කර ගැනීමට උපකාරී විය.

වරාය සේවාවන් සඳහා වන අනාගත ඉල්ලුම සපුරාලීම සඳහා ඵලදායිතාවය වර්ධනය කිරීමත්, වරාය පහසුකම් ප්‍රසාරණය කිරීමත් අරමුණු කරගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රී.ලං.ව.අ.) විසින් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරමින් සිටියි. වරාය සංවර්ධනය සඳහා වූ සැලැස්මට අනුකූලව බහලු හැසිරවීමේ ධාරිතාවය වැඩි කිරීම සඳහා මෙම ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘති වලින් බොහොමයකට අරමුදල් සපයනු ලබන්නේ ජපානයේ JICA ආයතනය විසිනි. රුපියල් දශ ලක්ෂ 612 ක වියදමින් JICA ආයතනයේ ආධාර සහිතව එකපිට එක හිස් බහලු 8 ක් තැබිය හැකි බහලු අංගනයක් ඉදි කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතියි. ජය බහලු පර්යන්තයේ ධාරිතාවය හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය අතිරේක උපකරණ රුපියල් දශ ලක්ෂ 1,750 ක වියදමින් ස්ථාපනය කරමින් පවතියි. 1998 නොවැම්බර් මාසයේදී සමගි බහලු පර්යන්තය විවෘත කිරීමත් සමඟම උතුරු පියරය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි පළමු අදියර සම්පූර්ණ කරන ලදී. සමගි බහලු පර්යන්තයේ ධාරිතාවය වර්ෂයකට බහලු ඒකක 100,000 කි. අතිරේක බහලු ඒකක 100,000 කට ඉඩ සැළසීම සඳහා වන මෙම ව්‍යාපෘතියෙහි දෙවන අදියර කෙටි කාලයක් තුළදී ආරම්භ කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය රුපියල් දශ ලක්ෂ 2,375 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර මින් රුපියල් දශ ලක්ෂ 828 ක් ව්‍යාපෘතියෙහි පළමු අදියර සඳහා වියදම් කර ඇත.

ඉදි කිරීම, ක්‍රියාත්මක කිරීම හා පැවරීම (BOT) යන පදනම මත පෞද්ගලික අංශයේ සහයෝගය සහිතව එළිසබත් රැජිණ ජැටිය සංවර්ධනය කිරීමේ අරමුණින් 1998 වර්ෂය තුළදී ශ්‍රී ලංකා රජය, සීමාසහිත සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් පුද්ගලික සමාගම සමඟ ප්‍රාථමික ව්‍යාපෘති ගිවිසුමකට එළඹිණි. මෙම ව්‍යාපෘතිය යටතේ රැජිණ ජැටිය මීටර 100 කින් පුළුල් කරනු ලබන අතර බහලු පර්යන්ත 3 ක්ද ඉදිකරනු ඇත. මෙම ව්‍යාපෘතියෙහි පිරිවැය එ.ජ. ඩොලර් දශලක්ෂ 240 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු, එළිසබත් රැජිණ ජැටියෙහි බහලු මෙහෙයවීමේ ධාරිතාවය වර්ෂයකට බහලු ඒකක 250,000 සිට බහලු ඒකක දශ ලක්ෂය දක්වා වැඩි වනු ඇත. මෙම ව්‍යාපෘතියෙහි ඉදි කිරීම් කටයුතු 1999 දී ඇරඹීමට නියමිත අතර අදියර තුනකින් වර්ෂ 2004 දී සම්පූර්ණ කරනු ඇත. මේ අතර, රුපියල් දශ ලක්ෂ 1,200 ක වියදමින් කොළඹ වරායෙහි අතිරේක පෝෂක නැංගුරම් පොළක් ඉදි කිරීම සඳහා ශ්‍රී.ලං.ව.අ. ලංසු කැඳවා තිබේ. මීට අමතරව, දකුණු පලාතෙහි අවශ්‍යතා සපුරාලීමට මෙන්ම තොග භාණ්ඩ කොළඹ වරායේ සිට ගාල්ලට හැරවීම මගින් කොළඹ වරායේ තදබදය ලිහිල් කිරීමටත් ගාලු වරායෙහි ජැටියක් ඉදි කිරීම සඳහා පියවර ගෙන තිබේ. එමෙන්ම රුපියල් දශ ලක්ෂ 2,000 ක වියදමින් ත්‍රිකුණාමල වරායෙහි නව ජැටියක් ඉදි කිරීමටද සැළසුම් කර ඇත.

වරාය සේවා සඳහා වන දීර්ඝකාලීන ඉල්ලුම සපුරාලීම සඳහා එළිසබත් රැජින ජැටියට පිටතින් නව කොළඹ දකුණු වරාය නමින් වරායක් ඉදි කිරීමටද යෝජනා කර ඇත. තාවකාලික සැලසුම්වලට අනුව මෙම වරාය නැංගුරම්පලවල් 11 කින් යුක්ත වන අතර බහලු ඒකක දශ ලක්ෂ 4 ක් හැසිරවීමේ ධාරිතාවයකින් යුක්ත වනු ඇත. ව්‍යාපෘතියට සම්බන්ධ ඉංජිනේරුමය අධ්‍යයනය ඉතා ඉක්මණින් ආරම්භ කරනු ඇත. ඒ සමඟම, ගාලු වරාය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයද රජය හඳුනාගෙන තිබේ. දියකඩනය, පිවිසුම් ඇල හෑරීම හා වරායෙහි පදනම තැනීම යන අංශ රජය මගින් සිදු කිරීමටත්, පර්යන්ත ඉදිකිරීම BOT පදනම යටතේ පුද්ගලික අංශය මගින් සිදු කිරීමටත් යෝජනා ඉදිරිපත්ව ඇත.

1998 වර්ෂය තුළදී ශ්‍රී.ලං.ව.අ. යේ දළ ආදායම රුපියල් දශ ලක්ෂ 13,638 දක්වා සියයට 24 කින් වැඩි විය. මෙම වැඩිවීමට, ප්‍රධාන වශයෙන් 1997 අවසාන භාගයේදී වරාය ගාස්තු ඉහළ දැමීමත්, වරාය අධිකාරියේ වෙනත් ආදායම් ඉහළයාමත් හේතු විය. රුපියල් දශ ලක්ෂ 8,590 ක් වූ මුළු වියදම සියයට 5 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 1997 දී රුපියල් දශ

ලක්ෂ 2,780 සමඟ සසඳ බලනවිට ශ්‍රී.ලං.ව.අ. 1998 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 5,048 ක දළ ලාභයක් වාර්තා කළේය.

## 5.7 වාරිමාර්ග සහ ජනාවාස

මහවැලි සංවර්ධන වැඩසටහන යටතේ 1998 වර්ෂය තුළ කළමනාකරණ ප්‍රතිව්‍යුහගත කිරීම, ක්‍රමවිධි සංවර්ධනය සහ පුනරුත්ථාපන ආදිය ප්‍රධාන කාර්යයන් විය. ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය එහි කළමනාකරණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රති සංවිධානය කිරීමේ වැඩසටහනේ අංශයක් වශයෙන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීම සඳහා වූ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළේය. මේ සඳහා වර්ෂය තුළ වියදම් වූ මුදල රුපියල් දශ ලක්ෂ 1,844 ක් විය. මහවැලි බල ප්‍රදේශය තුළ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය 1997 දී හෙක්ටයාර 118,371 සිට 1998 දී හෙක්ටයාර 119,574 දක්වා සුළු වැඩි වීමක් වාර්තා කළේය.

1998 වර්ෂය තුළදී ලෝක බැංකු ආධාර යටතේ 'එච්' කලාපය තුළ පුනරුත්ථාපන වැඩ සටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර වලවේ වම් ඉවුර ප්‍රදේශ ව්‍යාප්ත කිරීම හා සම්බන්ධ සංවර්ධන වැඩ ආරම්භ කළේය. මිනිපේ නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය, ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සහ වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග යෝජනා ක්‍රමය ආදී විදේශ අරමුදල් ආයෝජිත ප්‍රධාන ව්‍යාපෘති 1998 දීද පවත්වාගෙන ගියේය. මේ වැඩසටහන් සඳහා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 488 ක්, රුපියල් දශ ලක්ෂ 567 සහ රුපියල් දශ ලක්ෂ 65 ක් වශයෙන් වියදම් කර ඇත. මිනිපේ නාගදීප පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ වර්ෂය අවසානය වනවිට විශාල සහ මධ්‍ය ප්‍රමාණයේ යෝජනා ක්‍රම 24 ක සහ කුඩා යෝජනා ක්‍රම 952 ක වැඩ කටයුතු නිම කරන ලදී. වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය යටතේ යෝජනා ක්‍රම 9 ක වැඩ සම්පූර්ණ කරන ලදී.

1994 සිට ක්‍රියාත්මක කළ යාය ආදර්ශන නියමු වැඩසටහන වර්ෂය තුළදී සියළුම මහවැලි වැඩසටහන් ප්‍රදේශ දක්වා ව්‍යාප්ත කරන ලදී. එමෙන්ම මහවැලි සංවර්ධන අධිකාරිය විසින් බිත්තර වී නිෂ්පාදන වැඩසටහන් තවදුරටත් ව්‍යාප්ත කිරීමට පියවර ගනු ලැබීය. මෙයට අමතරව, උඩවලවේ, චන්ද්‍රිකා වැව ප්‍රදේශයේ නව ගොවි සමාගම් සැලැස්ම ආරම්භ කිරීමත් සමඟ ගොවි සමාගම් පිහිටුවීමට පියවර ගෙන ඇත.

## 5.8 විශේෂ වැඩසටහන්

### නිවාස

නාගරික ජනගහණයේ වර්ධනයත් සමඟම, විශේෂයෙන් නාගරික නිවාස සඳහා වන ඉල්ලුම සීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී. නිවාස හා නාගරික සංවර්ධනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් මෑතකදී නිකුත් කරන ලද වාර්තාවකට අනුව, 1996 අවසානය වනවිට නාගරික නිවාස ඒකක 169,111 ක හිඟයක් පැවතුණි. තවද, 1998 - 2005 කාල පරිච්ඡේදය තුළ නිවාස අවශ්‍යතාවය ඒකක 511,987 ක් වන අතර ඉන් ඒකක 322,556 ක්ම අවශ්‍ය වනුයේ නාගරික ප්‍රදේශ සඳහා වන බවද ඇස්තමේන්තු කර ඇත. මුළු නිවාස අවශ්‍යතාවයෙන් පිළිවෙලින් සියයට 20 ක් හා සියයට 23 ක් රාජ්‍ය අංශය මඟින් හා පුද්ගලික නිවාස

**5.8 සංඛ්‍යා සටහන**

**තෝරාගත් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා වූ වියදම්**

| ව්‍යාපෘතිය | ආධාර ලබාගත් මූලාශ්‍රය(අ) | මුළු විදේශ ආධාර ප්‍රමාණය රු.දශලක්ෂ | 1997 වියදම්(ආ) රු.දශලක්ෂ | 1998 වියදම්(ඇ) රු.දශලක්ෂ | 1998 අවසානය දක්වා සමුච්චිත වියදම(ඇ) රු.දශලක්ෂ |
|---|---|---|---|---|---|
| 1. මිනිපේ නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය | | | | | |
| i.මහවැලි පාලම් | ජපානය | ජපාන යෙන් | 283 | 256 | 961 |
| ii.වාරිමාර්ග | වි.ආ.ස.අ. | ජපාන යෙන්1,850 | 78 | 232 | 815 |
| 2. වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය | යු.ජා.කො. | යු.මු.ඒ.6.3 | 105 | 65 | 628 |
| 3. ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය | ජා.සං.ස.<br>යු.ආ.ප්‍ර. | රුපියල් 1,406.9<br>රුපියල් 1,622.6 | 512 | 567 | 2,199 |

(අ) ජපානයේ ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය
වි.ආ.ස.අ. - විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදල (ජපානය)
යු.ජා.කො. - යුරෝපීය ජාතීන්ගේ කොමිසම
ජා.සං.ස. - ජාත්‍යන්තර සංවර්ධන සංවිධානය (ලෝක බැංකුව)
යු.ආ.ප්‍ර. - යුරෝපීය ආර්ථික ප්‍රජාව
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය : වාරිමාර්ග දෙපාර්තමේන්තුව

සංඛ්‍යා සටහන 5.9
රාජ්‍ය අංශයේ නිවාස වැඩසටහන

| උප වැඩසටහන | ආරම්භ කළ ඒකක සංඛ්‍යාව 1997 | ආරම්භ කළ ඒකක සංඛ්‍යාව 1998(අ) | සම්පූර්ණ කළ ඒකක සංඛ්‍යාව 1997 | සම්පූර්ණ කළ ඒකක සංඛ්‍යාව 1998(අ) | මුදහරින ලද ණය ප්‍රමාණය (රු.ද.ල.) 1997 | මුදහරින ලද ණය ප්‍රමාණය (රු.ද.ල.) 1998(අ) |
|---|---|---|---|---|---|---|
| ජන උදාන වැඩසටහන | 6,582 | 16,083 | 9,751 | 9,010 | 142 | 180 |
| ග්‍රාමීය නිවාස ණය වැඩසටහන | 23,307 | 23,102 | 20,705 | 19,933 | 305 | 211 |
| නාගරික නිවාස වැඩසටහන | 1,279 | 7,300 | 845 | 5,070 | 16 | 65 |
| වතු නිවාස වැඩසටහන | 1,008 | 2,224 | 883 | 1,397 | 19 | 20 |
| සෘජු ඉදිකිරීම් වැඩසටහන | 562 | 810 | 92 | 400 | 123 | 339 |
| ආපද නිවාස වැඩසටහන (දකුණු පළාත) | 184 | 82 | 1,571 | 2,351 | 23 | 25 |
| ධීවර නිවාස වැඩසටහන | 1,006 | 2,029 | 180 | 1,646 | 10 | 49 |
| එකතුව | 33,928 | 51,630 | 34,027 | 39,807 | 638 | 889 |

(අ) තාවකාලික

මූලය : ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

සංවර්ධන ආයතන මගින් ඉදි කරනු ඇතැයි අපේක්ෂිත අතර ඉතිරිය (සියයට 57) නිවාස අවශ්‍ය අය පුද්ගලිකව ඉදි කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහෙයින් ප්‍රමාණවත් පරිදි නිවාස සැපයුම වැඩි කර ගැනීම සඳහා පුද්ගලිකව නිවාස ඉදි කරන්නන්ට පහසුකම් සපයන අතරම පුද්ගලික අංශයේ ආයෝජකයින්ද දිරි ගන්වන පරිදි නිවාස ප්‍රතිපත්තිය සැලසුම් කළ යුතුය.

1998 වර්ෂයේ රාජ්‍ය අංශයේ නිවාස ඉදි කිරීම් වැඩපිළිවෙලෙහි තවදුරටත් වර්ධනයක් දක්නට ලැබුණි. රාජ්‍ය අංශයේ නිවාස වැඩපිළිවෙල සඳහා මූලික වගකීම් දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ප්‍රධාන නිවාස වැඩපිළිවෙල 7 ක් ක්‍රියාත්මක කරන ලදී. ජන උදාන වැඩසටහන, ග්‍රාමීය නිවාස වැඩසටහන, නාගරික නිවාස වැඩසටහන, වතු අංශයේ නිවාස වැඩසටහන, සෘජු ඉදි කිරීම් වැඩසටහන, ආපද නිවාස වැඩසටහන සහ ධීවර නිවාස වැඩසටහන විමසුමට ලක් වන වසර තුළදී ක්‍රියාත්මක වූ ප්‍රධාන නිවාස වැඩසටහන් විය. ආරම්භ කල හා සම්පූර්ණ කල නිවාස ඒකක සංඛ්‍යාව අතින් බලන කල රාජ්‍ය අංශයේ නිවාස සංවර්ධන වැඩසටහනෙහි සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. රාජ්‍ය අංශයේ නිවාස වැඩසටහන යටතේ 1998 වර්ෂය තුළදී ආරම්භ කල නිවාස ඒකක සංඛ්‍යාව සියයට 52 කින් වැඩි වී 51,630 ක් වූ අතර, සම්පූර්ණ කල නිවාස ඒකක සංඛ්‍යාව සියයට 17 කින් වැඩි වී 39,807 ක් විය. මෙම වැඩසටහන යටතේ සපයන ලද මුළු ණය හා ආධාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 888 ක් වූ අතර එය පසුගිය වසර හා සසඳන කල සියයට 39 ක වර්ධනයකි. 1998 වර්ෂයේදී නාගරික නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇති බැවින් 1997 වසර හා සසඳන කල ජන උදන වැඩසටහනෙහි හා ග්‍රාමීය නිවාස වැඩසටහනෙහි වර්ධනයන්හි අඩුවක් දක්නට ලැබුණි. කෙසේ නමුත්, 1998 වසර අවසානය වනවිට නිවාස ඒකක 11,484 ක් සහිතව ජන උදන ගම්මාන 196 ක් විවෘත කර තිබුණි. 1998 වසර තුළදී නාගරික නිවාස වැඩසටහන යටතේ ආරම්භ කරන ලද නිවාස ඒකක 7,300 ක් හා නිම කරන ලද නිවාස ඒකක 5,070 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 65 ක් ප්‍රදනය කර තිබූ අතර, 1997 වසරේදී එය රුපියල් දශ ලක්ෂ 16 ක් විය. වතු සේවකයින් සඳහා ඔවුන්ගේම නිවාස සැපයීමේ රජයේ ප්‍රතිපත්තියට අනුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැවිලි නිවාස සහ සමාජ සුභ සාධන භාරය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කර ඇති වතු නිවාස වැඩසටහන යටතේ සෑම ප්‍රතිලාභියෙකුටම වසර 15 කින් ගෙවීම සඳහා සියයට 15 ක පොලී අනුපාතයක් යටතේ රු. 30,000 ක් දක්වා ණය මුදල් ප්‍රදනය කර ඇත. මෙම වැඩසටහන යටතේ 1998 වසරේදී නිවාස ඒකක 2,224 ක් ආරම්භ කර ඇති අතර, ඒකක 1,397 ක් තනා නිම කර ඇත. තවද, 1998 වසර තුළ මුද හරින ලද ණය ප්‍රමාණය සියයට 4 කින් වැඩි වූ අතර එය රුපියල් දශ ලක්ෂ 20 ක් විය. සෘජු ඉදි කිරීම් වැඩසටහන යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, විශේෂයෙන් නාගරික මධ්‍යම පන්තික පවුල් සඳහා සාධාරණ මිලකට නිවාස සැපයීම සඳහා නිවාස ඉදි කිරීමට ඉදිරිපත් වී ඇත. 1998 වසර තුළදී රුපියල් දශ ලක්ෂ 339 ක වියදමින් මෙවැනි නිවාස ඒකක 810 ක් ආරම්භ කල අතර, නිවාස ඒකක 400 ක වැඩ නිම කර ඇත. විශේෂයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල අවතැන් වූ පවුල්වලට නිවාස සැපයීම සඳහා ආපද නිවාස වැඩසටහන සැලසුම් කර ඇත. මෙවැනි පවුල් සමහරක් දකුණු පලාතට සංක්‍රමණය වී ඇති බැවින් එම ප්‍රදේශවලද මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ 1998 වසර තුළදී රුපියල් දශ ලක්ෂ 25 ක වියදමින් නිවාස ඒකක 2,351 ක වැඩ නිම කර ඇති අතර අළුතින් නිවාස ඒකක 82 ක වැඩ ආරම්භ කර ඇත.

මේ අතර, වැවිලි නිවාස සහ සමාජ සුභසාධක භාරය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වැනි ආයතන කිහිපයක්ම ඒ ඒ ක්ෂේත්‍රයේ නියුතු ජනතාව සඳහා නිවාස වැඩසටහන් කිහිපයක් 1998 වසර තුළදී ක්‍රියාත්මක කර ඇත. විමසුමට ලක්වන

**විශේෂ සටහන 6**

# මහ කොළඹ නිවාස අනුමත කිරීමේ දර්ශකය

නිවාස ඉදිකිරීම ඉතා වැදගත් ආර්ථික කාර්යයක් වන අතරම එය දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහිද ඉතා වැදගත් අංශයක් වේ. එහෙත් වාර්ෂිකව මෙරට නිවාස ඉදිකිරීමේ ප්‍රමාණය සහ එහි ප්‍රවණතාවය පිළිබඳව නිර්නය කිරීමට සුදුසු නිර්නායකයක් දනට සකස්කර නොමැත. සමහර ක්ෂේත්‍ර සමීක්ෂණවල නිවාස ඉදිකිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් වුවද, අඛණ්ඩව එම දත්ත ලබා ගැනීම අසීරුය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහල් නිවාසද ඇතුලත්ව කොළඹ මහ නගර සභාව මගින් අනුමත කරනු ලබන ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳව තොරතුරු රැස්කරනු ලබයි. මෙම තොරතුරු මහ බැංකුවේ මාසික විවරණිකාවෙහි පළ කරනු ලැබේ. එහෙත්, මෙම දත්තවල ආවරණය හා ඉදිරිපත් කිරීමෙහි සීමාවන් පවතින අතර එය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය කරුණක්ව පවතී. ඉදිකිරීම් සඳහා ලබාගත හැකි ඉඩම් සීමිතවීම සහ ඉඩම් මිල අධික වීම කොළඹ මහ නගරසභා සීමාව තුළ නිවාස ඉදිකිරීම් සීමාවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. එහෙයින්, නිවාස ඉදිකිරීම් පිළිබඳව පුළුල් නියෝජනයක් ලබාගැනීම සඳහා අඩු තරමින් මහ කොළඹ ප්‍රදේශය හෝ ආවරණය වන පරිදි දත්ත රැස්කිරීම අත්‍යවශ්‍ය වී ඇත. මීට අමතරව නිවාස අනුමත කිරීම පිළිබඳ දර්ශකයක් සකස් කිරීම මගින් නිවාස ඉදිකිරීම සහ සාමාන්‍ය ආර්ථික කටයුතු අතර ඇති සම්බන්ධතාවය විශ්ලේෂණය කිරීම සඳහා ද, අනාගත ආර්ථික නැඹියාව පිළිබඳව පුරෝකථනය කිරීම සඳහා ද, ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්වීම්වලට නිවාස ඉදිකිරීම් අංශයේ ආයෝජකයන් දක්වන ප්‍රතික්‍රියා හඳුනාගැනීමටද උපකාරී වේ.

නිවාස ඉදිකිරීම පිළිබඳ දර්ශකයක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන මහනගර සභා 4 ක්, නගර සභා 3 ක් සහ ප්‍රාදේශීය සභා 8 ක් ඇතුලත් පළාත් පාලන ආයතන 15 කින් සමන්විත වසර 4 තුළ නිවාස අනුමත කිරීම හා සම්බන්ධ දත්ත රැස්කරන ලදී ජනගහන ඝනත්වය සහ කොළඹ නගරයට සමීපස්ථව පිහිටීම පළාත් පාලන ආයතන තෝරා ගැනීමේ ප්‍රධාන නිර්නායකය විය. මෙම පළාත් පාලන ආයතන 15 හි ජනගහනය බස්නාහිර පළාතේ ජනගහනයෙන් සියයට 54 ක් නියෝජනය වන අතර එය රටෙහි මුළු ජනගහණයෙන් සියයට 15 ක් නියෝජනය කරයි.

නිවාස අනුමත කිරීම පිළිබඳ සරල දර්ශකයක්, ගෙබිම් ප්‍රමාණය අනුව සහ ගොඩනැගිලි කාණ්ඩය අනුව සකස් කරන ලදී (සංඛ්‍යා සටහන 1). මෙහි මාසික හා ත්‍රෛමාසික දර්ශකයන්ද පිළියෙල කරන ලදී. මහ කොළඹ නිවාස අනුමත කිරීමේ දර්ශකය (1995=100) 1996 දී 93.3 දක්වා පහත වැටුණු අතර එය 1997 දී 95.7 ක් දක්වාද 1998 දී 96.7 දක්වාද සුළු වශයෙන් වැඩි වී ඇත. මධ්‍යම ප්‍රමාණයේ නිවාස (ව.අඩි 1000-2000 අතර) අනුමත කිරීම් මෙම කාලයේදී සියයට 3 කින් පමණ වර්ධනය වී ඇත. කුඩා නිවාස අනුමත කිරීම් (ව.අඩි 1,000 ට අඩු) සියයට 16 කින් අඩුවිය. එමෙන්ම ව.අඩි 2,000 ඉක්මවූ විශාල නිවාස අනුමත කිරීම් සියයට 3 කින් පමණ අඩු වී ඇත. 1996 දී, නිවාස අනුමත කිරීම් පහත වැටීමෙන් පසු 1997 සුළු වශයෙන් ඉහළ යාමක් දක්නට ලැබුණද, 1998 වර්ෂයේදී නිවාස අනුමත කිරීම් තවදුරටත් 1995 ට වඩා අඩු මට්ටමක විය. මහ කොළඹ නිවාස අනුමත කිරීමේ දර්ශකයෙහි වර්ධන අනුපාතිකය, ඉදිකිරීම් අංශයේ වර්ධන අනුපාතිකය හා සැසඳේ.

**සංඛ්‍යා සටහන 1**

**මහ කොළඹ නිවාස අනුමත කිරීමේ දර්ශකය (ම.කො.නි.අ.ද.)**

.(1995- 100)

| කාලච්ඡේදය | අනුමත කරන ලද සංඛ්‍යාව | | | | ම.කො.නි.අ.ද. | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව.අඩි 1000 ට අඩු | ව.අඩි 1000-2000 | ව.අඩි 2000 ට වැඩි | එකතුව | ව.අඩි 1000 ට අඩු | ව.අඩි 1000-2000 | ව.අඩි 2000 ට වැඩි | සමස්ථ දර්ශකය |
| 1995 | 3,462 | 4,094 | 3,101 | 10,657 | 100 | 100 | 100 | 100 |
| `1996 | 2,895 | 3,906 | 3,144 | 9,945 | 83.6 | 95.4 | 101.4 | 93.3 |
| 1997 | 2,986 | 4,152 | 3,066 | 10,204 | 86.3 | 101.4 | 98.9 | 95.7 |
| 1997 කාර්තුව 1 | 620 | 924 | 702 | 2,246 | 79.2 | 94.7 | 93.7 | 89.5 |
| කාර්තුව 2 | 773 | 1,019 | 750 | 2,542 | 98.7 | 104.4 | 100.1 | 101.4 |
| කාර්තුව 3 | 831 | 1,112 | 860 | 2,803 | 106.1 | 113.9 | 114.8 | 111.8 |
| කාර්තුව 4 | 762 | 1,097 | 754 | 2,613 | 97.3 | 112.4 | 100.7 | 104.2 |
| 1998 | 2,908 | 4,213 | 3,186 | 10,307 | 84.0 | 102.9 | 102.7 | 96.7 |
| 1998 කාර්තුව 1 | 673 | 976 | 754 | 2,403 | 85.9 | 100 | 100.7 | 95.8 |
| කාර්තුව 2 | 647 | 895 | 717 | 2,259 | 82.6 | 91.7 | 95.7 | 90.1 |
| කාර්තුව 3 | 765 | 1,202 | 973 | 2,940 | 97.7 | 123.2 | 129.9 | 117.2 |
| කාර්තුව 4 | 823 | 1,140 | 742 | 2,705 | 105.1 | 116.8 | 99.1 | 107.6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන 6 (සම්බන්ධයි)**

සියළුම කාණ්ඩවලට අයත් ගොඩනැගිලි අනුමත කිරීම් හා සම්බන්ධ දර්ශකයක්ද (නිවාස, වෙළෙඳ ගොඩනැගිලි සහ අනෙකුත් ගොඩනැගිලි) සකස්කර ඇත (සංඛ්‍යා සටහන 11). මෙම දර්ශකයද, නිවාස අනුමත කිරීමේ දර්ශකයෙහි දක්නට ලැබුණු ප්‍රවණතාවයම පිළිබිඹු කරයි.

කෙසේ වුවද, මුලින් සඳහන් කළ අරමුණු ඉටුකර ගැනීම සඳහා වඩාත් සුදුසු දර්ශකය වන්නේ නිවාස ඉදිකිරීම ආරම්භ කිරීම හා සම්බන්ධ දර්ශකයකි. ඊට හේතුව වන්නේ එමගින් සත්‍ය වශයෙන්ම නිවාස ඉදිකිරීම පිළිබඳව පිළිබිඹු කරනු ලබන බැවිනි. කෙසේ වුවද, එවැනි දර්ශකයක් සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පළාත් පාලන ආයතන හෝ වෙනත් ආයතනයකින් හෝ ලබා ගැනීම ඉතාමත් දුෂ්කරය. සමහර පළාත් පාලන ආයතන, විශේෂයෙන්ම මහ නගර සභා, නිවාස ඉදිකිරීමෙන් පසු සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන පදිංචියට සුදුසු බව සනාථ කෙරෙන සහතික නිකුත් කිරීම පිළිබඳ වාර්තා තබා ගනු ලැබේ. කෙසේ වුවද, මෙම සහතික නිකුත් කිරීම වුවද බොහෝවිට අඩුවෙන් වාර්තා කරනු ලබන බව නිරීක්ෂණය කොට ඇති අතර ඊට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සමහර පුද්ගලයින් නිවාස ඉදිකිරීම් නිම කළද, පදිංචි වීමේ සහතිකය ලබා නොගැනීමයි.

මේ අනුව, මහ කොළඹ නිවාස අනුමත කිරීමේ දර්ශකය, නිවාස ඉදිකිරීම් පිළිබඳව ආසන්න දර්ශකයක් ලෙස සැලකිය යුතුය. කෙසේ වුවද, මෙම දර්ශකය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව සකස් කර ප්‍රකාශයට පත් කරනු ඇත.

**සංඛ්‍යා සටහන 11**
**සියළුම ගොඩනැගිලි සඳහා මහ කොළඹ නිවාස අනුමත කිරීමේ දර්ශකය**

(1995-100)

| කාලච්ඡේදය | අනුමත සංඛ්‍යාව | දර්ශකය (1995-100) |
|---|---|---|
| 1995 | 13,379 | 100.0 |
| `1996 | 11,243 | 84.0 |
| 1997 | 11,173 | 83.5 |
| 1998 | 11,620 | 86.9 |
| 1998 කාර්තුව 1 | 2,747 | 85.4 |
| කාර්තුව 2 | 2,593 | 80.6 |
| කාර්තුව 3 | 3,278 | 101.9 |
| කාර්තුව 4 | 3,002 | 93.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසර තුළ සමාජ සුභසාධක වැඩසටහන යටතේ වැවිලි නිවාස හා සමාජ සුභසාධක භාරය මගින් වතු සේවකයින් සඳහා නිවාස ණය, ඉඩම් වෙන් කර දීම, ප්‍රවේශ මාර්ග ඉදි කිරීම, ජල සම්පාදනය හා සනීපාරක්ෂක පහසුකම් ආදී යටිතල පහසුකම් සැපයීම අඛණ්ඩව කරගෙන යනු ලැබිණ. මෙම වැඩසටහන යටතේ 1997 දී නිම කළ නව නිවාස ඒකක 298 ක් හා වැඩි දියුණු කරන ලද නිවාස ඒකක 420 ක් හා සසඳන කල 1998 වසර තුළ නව නිවාස ඒකක 794 ක් නිම කර ඇති අතර නිවාස ඒකක 1,075 ක් වැඩි දියුණු කර ඇත. තවද, 1998 වසර අවසානය වනවිට නව නිවාස ඒකක 1,135 ක් ඉදිවෙමින් පැවතුණි. මෙම වැඩසටහන යටතේ වසර තුළදී රුපියල් දශ ලක්ෂ 41 ක් වැය කරන ලදී. මේ අතර, ධීවර කර්මාන්තයේ නියුතු පුද්ගලයින්ට නිවාස ලබා දීමේ අරමුණින් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් 1997 දී හඳුන්වා දෙනු ලැබූ "දියවර ගම්මාන" නිවාස යෝජනා ක්‍රමය යටතේ 1998 වසර තුළදී නිවාස ඒකක 741 ක් තනා නිම කර ඇති අතර ඒ සඳහා රුපියල් දශ ලක්ෂ 107 ක් වැය විය. 1998 වසර තුළදී මහවැලි වැඩසටහන යටතේ නව නිවාස කිසිවක් ඉදි කර නොමැත. මේ අතර කොළඹ මහ නගර සභා සීමාව තුළ ජීවත් වන 60,000 ක් පමණ වන මුඩුක්කු සහ පැල්පත්වාසීන්ට නව නිවාස ලබා දීමේ අරමුණින් "පිවිතුරු ජනාවාස ව්‍යාපෘතිය" නමින් වැඩසටහනක් දැනටමත් ආරම්භ කර ඇත. රජයට හෝ ප්‍රතිලාභී ජනතාවට බරක් නොවන අයුරින්, නැවත පදිංචි කරවීම මගින් මුදා හරිනු ලබන ඉඩම් ඇප වශයෙන් තබාගෙන, මූල්‍ය උපකරණයක් හඳුන්වා දීම මගින් නිවාස පහසුකම් සැපයීම සඳහා අරමුදල් රැස් කිරීමට මෙම ව්‍යාපෘතිය යටතේ සැලසුම් කර ඇත.

1998 වසර තුළදී පුද්ගලික නිවාස ඉදි කිරීමෙහිද ප්‍රගතියක් දක්නට ලැබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කරන ලද මහ කොළඹ නිවාස අනුමත කිරීමේ දර්ශකයට අනුව, 1998 දී මහ කොළඹ ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන පලාත් පාලන ආයතන මගින් අනුමත කරන ලද නිවාස සංඛ්‍යාව සියයට 4 කින් වැඩි වී 11,620 ක් විය (කරුණාකර විශේෂ සටහන 6 බලන්න). වාණිජ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන මගින් 1998 වසර තුළදීද පුද්ගලයන් සඳහා නිවාස ණය සපයනු ලැබිණ. රාජ්‍ය බැංකු දෙක හැරුණුවිට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ සමහර පුද්ගලික වාණිජ බැංකු වැනි අනෙකුත් මූල්‍ය ආයතනද පුද්ගලික නිවාස ඉදි කිරීම සඳහා ණය පහසුකම් ලබා දී ඇත. මහජන බැංකුව විසින් " සියත " (ක්වේට්හි සේවය කර පැමිණි ශ්‍රී ලාංකිකයින් සඳහා), " විදේශිකා" (විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයින් සඳහා), "ශක්ති" (කළුතර ඇසෝසියේටඩ් මෝටර්වේස්හි සේවකයින් සඳහා), ශ්‍රී ලංකා පත්‍ර කලාවේදීන්ගේ සංගමයේ සාමාජිකයින් සඳහා සහ රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා නව නිවාස ණය යෝජනා ක්‍රම 5 ක් හඳුන්වා දී ඇත. මහජන බැංකුව මගින් කලින් හඳුන්වා දී තිබූ නිවාස ණය යෝජනා ක්‍රමද එලෙසම පවත්වාගෙන යන ලදී. 1998 සැප්තැම්බර් මස අවසානය වනවිට මහජන බැංකුව විසින් නිවාස ණය 16,359 ක් ප්‍රදානය කල අතර, මුදහල නිවාස ණය ප්‍රමාණය

රුපියල් දශ ලක්ෂ 904 ක් විය. මහජන බැංකු මූලාශ්‍රවලට අනුව සේවක අර්ථ සාධක අරමුදල් ශේෂයන්ට එරෙහිව ලබා දුන් නිවාස ණයවල ආපසු ගෙවීම 1998 වසරෙහිදීද ඉතාමත් අසතුටුදායක තත්ත්වයක පැවතුණි. 1998 දී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් ප්‍රදානය කරන ලද නිවාස ණය ප්‍රමාණයේ මුළු වටිනාකම සියයට 11 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 1,590 ක් වූ නමුත් ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය සියයට 6 කින් අඩු වී 8,913 ක් වී ඇත. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මගින් ප්‍රදානය කරනු ලබන සාමාන්‍ය නිවාස ණය පහසුකම්වලට අමතරව එතු අංශයේ සේවකයින් සඳහා ඔවුන්ගේ සේවක අර්ථ සාධක අරමුදල් ශේෂයන්ට එරෙහිව නිවාස ණය ලබා ගත හැකි වන පරිදි අළුතින් නිවාස ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඇත. මේ යටතේ රු. 25,000 ක ණය මුදලක් ප්‍රදානය කරනු ලබන අතර, 1998 අවසානය වනවිට 5,000 කට වැඩි ණය ප්‍රමාණයක් ප්‍රදානය කර තිබුණි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිවාස ණය ප්‍රතිපාදනය හා සම්බන්ධව මුහුණපාන ප්‍රධානතම ගැටළුව වනුයේ සිය කෙටිකාලීන සහ දිගුකාලීන වත්කම් සහ වගකීම් අතර ඇති නොගැලපීමයි.

අනෙකුත් නිවාස ණය සපයන ආයතනවලට සාපේක්ෂව බලනවිට, ප්‍රධාන වශයෙන් අඩු පොලී අනුපාතයක් (සියයට 14 - 15 අතර) සහ ශාඛා පද්ධතියේ ප්‍රසාරණය හේතුකොටගෙන, 1998 වසරේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව මගින් සපයනු ලැබූ නිවාස ණය සඳහා ඉහළ ඉල්ලුමක් පැවතුණි. 1998 වසරේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ණය මුදල් 1,851 ක් ප්‍රදානය කල අතර එය සියයට 93 ක වර්ධනයකි. මුදහල ණය ප්‍රමාණය දෙගුණයකින් වැඩි වී ඇති අතර එය රුපියල් දශ ලක්ෂ 711 ක් විය. මේ අතර, 1998 දී නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් ප්‍රදානය කරන ලද මුළු නිවාස ණය ප්‍රමාණයේ වටිනාකම රුපියල් දශ ලක්ෂ 530 කි. මෙය පසුගිය වසර හා සසඳන කල සියයට 11 ක වැඩි වීමකි. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව මගින් අය කරනු ලබන සාමාන්‍ය පොලී අනුපාතය සියයට 16 ක් වන අතර එය 1998 වසර තුළදී නොවෙනස්ව පැවතුණි. ඉහළ මට්ටමක ඇති අක්‍රිය නිවාස ණය මුදල් හා අඩු පිරිවැයක් සහිත අරමුදල් ලබා ගැනීමේ දුෂ්කරතා නිවාස මූල්‍ය වැඩසටහන් පුළුල් කිරීමේදී, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව මුහුණ දෙන ගැටළු අතර ප්‍රධාන වේ.

## නාගරික සංවර්ධනය

ඒකාබද්ධ නාගරික සැලසුම්කරණය පදනම් කොටගෙන, ශ්‍රී ලංකාවේ ප්‍රධාන නාගරික ප්‍රදේශ සංවර්ධනය කිරීමේ පරමාර්ථයෙන් 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය (නා.සං.අ.) ස්ථාපිත කරන ලදී. මේ අනුව නා.සං.අ.යේ අධීක්ෂණය යටතේ මහ නගර සභා 14 තුළද, තෝරා ගත් නගර සභා 34 ක හා ප්‍රාදේශීය සභා 68 ක් තුළද යටිතල පහසුකම් සංවර්ධනය සිදු කෙරේ. නා.සං.අ. යේ ප්‍රධාන අරමුණ වන්නේ තිරසාර, සෞඛ්‍ය සම්පන්න හා ගතික නාගරික පරිසරයක් බිහි කිරීමයි. මේ අනුව පරිපාලන හා වාණිජ සංකීර්ණ ඉදි කිරීම, නගර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති, කාර්මික සංකීර්ණ, ඒකාබද්ධ ව්‍යාපෘති සහ සමාජ සහ සංස්කෘතික ව්‍යාපෘති වැනි ව්‍යාපෘතීන් 1998 වසර තුළදී තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව ආසියානු සංවර්ධන බැංකුවෙහි මූල්‍ය පහසුකම් ලබන නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය සහ සේවා දයකයන් වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන්ද ක්‍රියාත්මක කරන ලදී. නා.සං.අ. මගින් ඉඩම් බැංකුව නඩත්තු කිරීමේ කටයුතුද කරගෙන යන ලදී. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 1998 දී රුපියල් දශ ලක්ෂ 778 ක් වැය කර ඇති අතර 1997 දී එය රුපියල් දශ ලක්ෂ 765 කි.

නා.සං.අ. යේ මුළු ආයෝජනයෙන් සියයට 77 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 602 ක් වෙනත් ආයතන වෙනුවෙන් භාර ගත් ව්‍යාපෘති සඳහා වැය කරන ලදී. මෙයින් සියයට 63 ක්ම (රුපියල් දශ ලක්ෂ 492) වැය කර ඇත්තේ ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍ය පහසුකම් සපයනු ලබන නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය සඳහාය. මෙම ව්‍යාපෘතිය දියත් කර ඇත්තේ කුඩා හා මධ්‍යම පරිමාණ නගර 17 ක යටිතල පහසුකම් සැපයීමේ අරමුණිනි. මෙම ව්‍යාපෘතිය යටතේ කරනු ලැබූ ඇතැම් කටයුතු වූයේ, අඩු වියදම් නිවාස සඳහා ජල සම්පාදනය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම, පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම, මාර්ග සහ පාලම් ඉදි කිරීම, ජල ප්‍රවාහන හා අපද්‍රව්‍ය ඉවත් කිරීමේ පද්ධති ඉදිකිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය සහ කාර්මික ජනපද ඉදිකිරීමයි. මේ අතර, නා.සං.අ. විසින් බත්තරමුල්ල සහ පැලවත්ත පරිපාලන සංකීර්ණයන්හි පහසුකම් තවදුරටත් වැඩි දියුණු කිරීමේ කටයුතු සඳහා වසර තුළදී රුපියල් දශ ලක්ෂ 53 ක් වැය කරන ලදී. රුපියල් දශ ලක්ෂ 15 ක වියදමින් අවිස්සාවේල්ල නාගරික ප්‍රදේශය හා දඹුල්ල නගරය තුළ සංවර්ධන කටයුතු කරන ලදී. අඩු වියදම් නිවාස, රජයේ සේවක නිවාස සහ මධ්‍යම පංතික නිවාස වැඩි දියුණු කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 20 ක් වැය කරන ලදී. තවද, නා.සං.අ. මගින් හෝමාගම සහ රත්මලාන ප්‍රදේශයන්හි කාර්මික සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්ම දියත් කරනු ලැබිණ. මේ අතර, ඒකාබද්ධ ව්‍යාපෘතීන් සඳහා රුපියල් දශ ලක්ෂ 82 ක්ද, ඉඩම් බැංකුව සඳහා ඉඩම් ලබා ගැනීමට රුපියල් දශ ලක්ෂ 22 ක්ද නා.සං.අ. විසින් වැය කර ඇත.

නා.සං.අ. විසින් 1998 වසර තුළදී මහ කොළඹ ප්‍රදේශය සඳහා වූ විස්තරාත්මක ප්‍රාදේශීය ව්‍යුහ සැලසුම පිළියෙල කිරීම නිම කරන ලදී. මෙම සැලසුමෙහි ප්‍රධාන අරමුණ වන්නේ කොළඹ නගරය තුළ හා අවට නගරයන්හි දනට සංකේන්ද්‍රනය වී ඇති ජනගහන පීඩනය ඉදිරි කාලය තුළදී අඩු කිරීමයි. මෙයට අමතරව සබරගමුව, ඌව, මධ්‍යම, වයඹ හා දකුණු පලාත් සඳහා පළාත්බද ව්‍යුහ සැලසුම් කෙටුම්පත් පිළියෙල කෙරෙමින් පවතී. තවද, නා.සං.අ. මගින් දිස්ත්‍රික් මට්ටමින් නාගරික සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමද ආරම්භ කර ඇත. මේ අනුව පලාත් 7 ක තෝරා

**විශේෂ සටහන 7**

## දේපල සංවර්ධනය සහ බැංකු මූල්‍යකරණය

ඉහළ යමින් පවතින ඉල්ලුමට සහ දේපල සංවර්ධන කටයුතු සඳහා පිරිනමන ලද රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම්වලට ප්‍රතිචාර වශයෙන් පසුගිය වසර කිහිපය තුළදී දේපල සංවර්ධන අංශය කැපී පෙනෙන ප්‍රසාරණයක් පෙන්විය. දේශීය මෙන්ම විදේශීය ව්‍යවසායකයින් දේපල සංවර්ධන අංශයෙහි කරනු ලබන ආයෝජන දිරිගැන්වීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් සිත් ඇදගන්නා සුළු සහන පිරිනමන ලදී. ඒ අනුව, 1997 අවසානය වනවිට ආයෝජන මණ්ඩලය විසින් රුපියල් බිලියන 99 ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 147 ක් අනුමත කර තිබුණි. කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල පිහිටා ඇති ප්‍රධාන දේපල සංවර්ධන ව්‍යාපෘති කිහිපයක වර්තමාන තත්ත්වය විමසා බැලීම සඳහා, පදිංචිවීමේ අනුපාතය හා මූල්‍යමය ශක්තිමත් භාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමීක්ෂණයක් කරන ලදී. කොළඹ නගරය සහ තදාසන්න ප්‍රදේශවල පිහිටා ඇති විශාල දේපල සංවර්ධන ව්‍යාපෘති 33 ක් මෙම සමීක්ෂණය මගින් ආවරණය කෙරිණි. මෙම සමීක්ෂණය 1998 ජුලි-අගෝස්තු මාස තුළදී සිදු කරන ලදී. නියැදිය තෝරා ගැනීම, ආයෝජන මණ්ඩලයෙන් සහ බැංකු කිහිපයකින් ලබාගන්නා ලද තොරතුරු මත පදනම් විය. ප්‍රධාන තෝරා ගැනීමේ නිර්ණායකය වූයේ ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා වන වියදමයි. රුපියල් දශ ලක්ෂ 200 ඉක්මවන පිරිවැයකින් යුත් නව ඉදිකිරීම් පිළිබඳ ව්‍යාපෘති මෙම සමීක්ෂණයට ඇතුලත් කර ඇත. සමීක්ෂණයේ ප්‍රතිඵල සමහරක් පහත සඳහන් වේ. සමීක්ෂණය කරන ලද ව්‍යාපෘති 33 න් 14 ක් පදිංචිය සඳහා නිවාස ඉදිකිරීම්ද 11 ක් කාර්යාල ගොඩනැගිලිද 3 ක් වාණිජ ගොඩනැගිලිද වූ අතර ඉතිරිය, පදිංචිය සඳහා වූ නිවාස/වාණිජ සහ/හෝ කාර්යාල යනාදියෙහි සංයෝජනයක් විය. සමස්තයක් වශයෙන් මෙම ව්‍යාපෘති 33 සතුව වර්ග අඩි දශ ලක්ෂ 2.8 ක මුළු කාර්යාල සහ වාණිජ ගෙබිම් ප්‍රදේශයක් සහ තට්ටු නිවාස ඒකක 2,230 ක් විය. සමීක්ෂණය කරන ලද ව්‍යාපෘති අතුරින් සියයට 73 ක අයිතිය ශ්‍රී ලාංකිකයින් සතුවූ අතර ඉතිරියෙහි අයිතිය විදේශීය ආයෝජකයින් සහ දේශීය හා විදේශීය හවුල් සමාගම් සතු විය. සමාගම් 2 ක් හැර අනිකුත් සියළුම සමාගම්වලට ආයෝජන මණ්ඩලය අනුමත කළ තත්ත්වය හිමිවී තිබේ. සියළුම ව්‍යාපෘති සඳහා වූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 31,000 ක් පමණ විය.

සමීක්ෂණයට භාජනය වූ ව්‍යාපෘති 33 න් සම්පූර්ණ වශයෙන්ම වාණිජ කටයුතුවල නියැලුනු ව්‍යාපෘති සංඛ්‍යාව වූයේ 23 ක් පමණි. වාණිජ/කාර්යාල ගෙබිම ඉඩ ප්‍රමාණයෙහි සාමාන්‍ය පදිංචිවීමේ අනුපාතය සියයට 70 ක් වූ අතර පදිංචිය සඳහා වූ නිවාස ඒකක සඳහා එය සියයට 64 ක් විය. ඉදිකරන ලද මුළු ගොඩනැගිලි සංඛ්‍යාවෙන් ගොඩනැගිලි 25 ක ඌණ පදිංචි අනුපාතයක් පැවතිනි. මින් ගොඩනැගිලි 17 ක් සම්බන්ධයෙන්, බදු ගැනීමට අපේක්ෂා කරන්නන් සමග දේපල විකිණීම, කුලියට දීම හෝ බදුදීම පිළිබඳව සාකච්ඡා පැවැත්වෙමින් තිබිණි. ඉතිරි ගොඩනැගිලි 8 සඳහා දැනටමත් ගැණුම්කරුවන් සමග ගිවිසුම්වලට එළඹී ඇත. ඒ අනුව, ගොඩනැගිලිවලින් සියයට 50 ක පමණ පූර්ණ පදිංචි අනුපාතයක් පදිංචි දක්නට ලැබිණි.

මූල්‍යමය ශක්තිමත් භාවය පරීක්ෂා කිරීම සඳහා අරමුදල් මූලයන්, ණය ආපසු ගෙවීමේ හැකියාව, ගෙවීමට ඉතිරිව ඇති ණය මුදල හා ණය ප්‍රතිලේඛණගත කිරීම පිළිබඳව සලකා බලන ලදී. සමීක්ෂණය කරන ලද ව්‍යාපෘතිවල ප්‍රධාන ප්‍රාග්ධන මූලයන් වූයේ කොටස් ප්‍රාග්ධනය, ස්වකීය ප්‍රාග්ධනය හා දිගුකාලීන ණයයි. සමාගම් දෙකක් විසින් ණයකර නිකුත් කර තිබූ අතර සමාගම් 8 ක් විසින් විදේශ ණය ලබාගෙන තිබුණි. සමීක්ෂණයට භාවිතය කරන ලද සියළුම සමාගම් විසින් ලබාගන්නා ලද මුළු දිගුකාලීන ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,554 ක් වූ අතර සමීක්ෂණය පවත්වන අවස්ථාව වනවිට ආපසු ගෙවීමට පැවති ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 6,006 ක් විය. ආපසු ගෙවීමට පැවති ණය ප්‍රමාණය අතුරින් සියයට 56 ක් පමණ පදිංචිය සඳහා වූ නිවාස දේපල සංවර්ධනයෙහි යෙදී සිටින්නන්ගෙන් අය වියයුතු වූ අතර, සියයට 21 ක් වාණිජ/කාර්යාල දේපල සංවර්ධනයෙහි යෙදී සිටින්නන්ගෙන් අයවීමට තිබිණි. සමීක්ෂණයට භාජනය වූ ව්‍යාපෘති සඳහා දිගුකාලීන ණය ලබාගත් ප්‍රධාන මූලයන් වූයේ වෙළෙඳ බැංකු (දේශීය බැංකු ඒකක හා විදේශ මුදල් බැංකු ඒකක) සහ සංවර්ධන මූල්‍ය ආයතනයන්ය. දේපල සංවර්ධනයෙහි යෙදී සිටින්නන් ගෙන් සියයට 50 කටත් වඩා ණය ලබාගෙන තිබුණේ වාණිජ බැංකු මගිනි. සමීක්ෂණය කරන ලද දේපල සංවර්ධන ව්‍යාපෘති සඳහා වාණිජ බැංකු මගින් සපයන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,834 ක් වූ අතර, ප්‍රධාන පෙළේ දිගුකාලීන ණය ලබාදෙන ආයතන දෙකක් විසින් රුපියල් දශ ලක්ෂ 1,680 ක් ලබා දී තිබුණි.

සමහර දේපල සංවර්ධන සමාගම් ණය ආපසු ගෙවීම් ආරම්භ කර නොතිබුණි. සමීක්ෂණය කරන ලද දේපල සංවර්ධනයෙහි යෙදී සිටින්නන්ගෙන් සියයට 21

**විශේෂ සටහන 7 (සම්බන්ධයි)**

ක් පමණ (ව්‍යාපෘති 7 ක්) ණය ප්‍රතිලේඛණගත කිරීම සඳහා අයදුම්කර තිබූ අතර, සියයට 45 කට පමණ ණය ආපසු ගෙවීම් පිළිබඳව කිසිදු අපහසුතාවයක් නොතිබිණි. ණය ප්‍රතිලේඛණගත කිරීම සඳහා අයදුම් කර ඇති සමාගම් වල ආපසු ගෙවීමට පැවති දේශීය ණය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,598 ක් විය. මෙම ඉල්ලීම් වලින් අඩක් පමණ නිවාස දේපල සංවර්ධනයෙහි යෙදී සිටින්නන්ගෙන් ලැබුණ ඒවාය.

මෙම සමීක්ෂණයට අනුව, වාණිජ/කාර්යාල ඉඩකඩ කුලියට දීමේ/බදු දීමේ සාමාන්‍ය මිල වර්ග අඩියකට රුපියල් 61.75 ක් වූ අතර, කොළඹ 4 ප්‍රදේශය තුළ පිහිටි දේපල සඳහා එය වර්ග අඩියකට රු. 87.50 ක් තරම් ඉහළ මිලක් විය. අවම මිල කොළඹ 3 ප්‍රදේශයෙන් වාර්තා විය.

වර්තමාන ආරක්ෂක තත්ත්වය සහ ආර්ථික පසුබෑසීම හේතුවෙන් සිදුවූ ඉල්ලුමෙහි මන්දගාමී වර්ධනය, පදිංචිවීමේ අනුපාතය පහළ මට්ටමක පැවතීමට බලපෑ ප්‍රධාන සාධක විය. ගොඩනැගිලි ද්‍රව්‍යවල පිරිවැය ඉහළයෑම, සංචාරකයින්ගේ පැමිණීම මන්දගාමීව යථා තත්වයට පත්වීමේ ස්වභාවය, සමහර නීතිමය බාධක (මහල් නිවාස පණත යටතේ විදේශිකයින් සඳහා නිවාස සංකීර්ණයක 6 වන මහලින් පහත කොටස බදුදීම/විකිණීම සීමා කරයි.) යනාදිය දේපල සංවර්ධනයෙහි යෙදී සිටින්නන් විසින් මුහුණ දුන් වෙනත් බාධාවන් විය. කාර්යාල සහ වාණිජ පරිශ්‍රයන් සඳහා වූ ඉල්ලුම කෙරෙහි විශේෂයෙන්ම ආරක්ෂක තත්ත්වය අහිතකර ලෙස බලපා ඇති අතර, පදිංචිය සඳහා වන නිවාස පරිශ්‍රයන් සඳහා වූ ඉල්ලුමට ආර්ථික පසුබෑම බලපා ඇත.

දේපල සංවර්ධනයෙහි යෙදී සිටින බොහෝ දෙනෙක් ඉහළ මට්ටමක පවතින පොලී අනුපාතයන් පිළිබඳව සිය ඉමහත් කණස්සල්ල ප්‍රකාශ කරන ලදී. වර්තමාන පොලී අනුපාත වලට අනුව, අඩුම වශයෙන් ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 75 ක් වත් කොටස් ප්‍රාග්ධනය මගින් ලබා නොගතහොත් දේපල සංවර්ධන ව්‍යාපෘති ලාභදායීව පවත්වාගෙන යා නොහැකි වනු ඇති බව ඔවුන්ගේ අදහස විය. දේපල සංවර්ධනයෙහි යෙදී සිටින සියලු දෙනාම පාහේ ඉදිකිරීම් පිරිවැය ඉහළ යෑමට හා අනවශ්‍ය ප්‍රමාදවීම් ඇතිවීමට හේතුවී ඇති සංකීර්ණ, පරිපාලන ක්‍රියාපිළිවෙත් හා නිලධාරි වාදය පිළිබඳවද සිය කණස්සල්ල ප්‍රකාශ කළහ. මේ අතර, සුළු හා මධ්‍යම ප්‍රමාණයේ නිවාස සඳහා අධි ඉල්ලුමක් පවතින බව දක්නට ලැබුණි. එහෙත් මේ පිළිබඳව දක්නට ලැබුනු ප්‍රධාන ප්‍රශ්ණයක් වන්නේ මහල් නිවාස උකසට තබාගෙන ණයදීමට බැංකුකරුවන් තුළ පවතින අකමැත්ත හේතුවෙන්, නිවාස හිමිකර ගැනීමට කැමති පුද්ගලයන් සඳහා බැංකු ණය ලබා ගැනීමේදී ඔවුන්ට මුහුණ දීමට සිදුවන දුෂ්කරතාව යයි. කොළඹ හා අවට ප්‍රදේශවල බොහෝ නිවාස, කාර්යාල හෝ වාණිජ ස්ථාන බවට පරිවර්තනය කර ඇති නිසා වාණිජ හා කාර්යාල සඳහාම ඉදිකළ පරිශ්‍රයන් සඳහා වූ ඉල්ලුම සීමාවී පවතී. මෙම පරිවර්තනය කිරීම් තුළින් ඇතිවන පාරිසරික හා සමාජ-ආර්ථික විපාක කෙරෙහි නිසි අවධානය යොමුකර නොමැති බැවින් මෙම තත්ත්වය වෙනත් විවිධ ප්‍රශ්නවලට හේතුවී ඇත. මෙවැනි අපහසුතා පැවැතියද, වර්තමාන ආර්ථික පසුබෑස්ම අවසන්වූ වහාම, නව ආයෝජන කටයුතුවල නියැලෙන බව, දේපල සංවර්ධනයෙහි යෙදී සිටින කිහිප දෙනෙකුම ප්‍රකාශ කළහ.

සමීක්ෂණ ප්‍රතිඵල තුළින් පුළුල් නිගමන කිහිපයකට එළඹිය හැකිය. වාණිජ/කාර්යාල සහ නිවාස පරිශ්‍රයන් සඳහා වූ පදිංචිවීමේ සාමාන්‍ය අනුපාතය පිළිවෙලින් සියයට 70 ක් සහ සියයට 64 කි. මෙවැනි පදිංචිවීමේ මට්ටමකදී, බොහෝ සමාගම්, ණය ආපසු ගෙවීම් හැර මෙහෙයුම් වියදම් පමණක් පියවා ගතහැකි තත්ත්වයක සිටී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමීක්ෂණයට භාජනය වූ සමාගම් අතුරින් සියයට 21 ක් පමණ ණය ප්‍රතිලේඛණගත කිරීම සඳහා දැනටමත් අයදුම්කර ඇත. පදිංචිවීම් අනුපාතය වැඩිකිරීම සඳහා සමහර සමාගම් විසින් බදුකුලී ගාස්තු අඩුකරනු ලැබ ඇති අතර, එය ඔවුන්ගේ ආදායම් තවදුරටත් අඩුකිරීමටද හේතු වී ඇත. සමාගම් කිහිපයක් විසින් අලාභ අවම කර ගැනීම සඳහා ඌණ වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇති ගොඩනැගිලි තුළ ඔවුනගේ අනුබද්ධ ආයතනවල කාර්යාලයන් පවත්වාගෙන යනු ලැබීය. සමාගම් කිහිපයක ණය ආපසු ගෙවීම් ද ඔවුනගේ මව් සමාගම්වල උපකාරය ඇතිව සිදු වේ. පදිංචි වීමේ අනුපාතය තවදුරටත් වර්ධනය නොවුනහොත් දේපල සංවර්ධන අංශයේ මූල්‍ය තත්ත්වය දුර්වල වනු ඇත.

සමීක්ෂණයට භාවිතා වූ දේපල සංවර්ධන සමාගම් ලබාගෙන ඇති දිගුකාලීන ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,554 ක් වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 3,854 ක් දේශීය වශයෙන් ලබාගත් ණය විය. දේශීය ණය අතුරින් ද, සියයට 59 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 2,284 ක් ලබාගෙන ඇත්තේ වාණිජ බැංකු වලිනි. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අත්තිකාරම් පිළිබඳ වූ ත්‍රෛමාසික සමීක්ෂණයට අනුව, 1998 සැප්තැම්බර් මාසය අවසානය වනවිට දේපල සංවර්ධනය හා ව්‍යාපාර පරිශ්‍රයන් ගොඩ නැගීම සඳහා දී තිබූ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,338 ක් (පෞද්ගලික අංශය වෙත දී ඇති ණය ප්‍රමාණයෙන් සියයට 3.2 ක් පමණ) වූ අතර, සමස්ත දේපල සංවර්ධන අංශය වෙත ලබාදෙන ලද ණය ප්‍රමාණය, පෞද්ගලික අංශය වෙත ලබාදෙන ලද ණය මුදල් ප්‍රමාණයෙන් සියයට 13 ක් පමණ විය. එමනිසා, දේපල සංවර්ධන අංශය තුළ වාණිජ බැංකු සහභාගිත්වය වර්තමානයේ දී එතරම් ඉහළ මට්ටමක පවතින බව නොපෙනුනද, මෙම අංශය වෙත තවදුරටත් ණය ලබාදීමේදී එහි ඇති අවදානම් සහගත භාවය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

ගත් නගර 22 ක් සඳහා නාගරික සැලසුම් පිළියෙල කෙරෙමින් පවතී. ඒකාබද්ධ සැලසුම්කරණය හා භෞතික සංවර්ධන වැඩසටහන යටතේ නා.සං.අ. මගින් ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ කටයුතු, මහනුවර පූජා භූමිය සංවර්ධන සැලසුම් නිම කිරීම, වරකාපොල නගර සංවර්ධන ව්‍යාපෘතිය, බලංගොඩ නගර ව්‍යාප්ත ව්‍යාපෘතිය සහ නුවරඑළිය ග්‍රෙගරි වැව සංවර්ධන ව්‍යාපෘතිය ආදියද ක්‍රියාත්මක කරන ලදී. දකුණු පළාත් සංවර්ධන අධිකාරිය මගින් හඳුනා ගන්නා ලද රුහුණුපුර ව්‍යාපෘතියෙහි සැලසුම්කරණය සහ සම්බන්ධීකරණ කටයුතුවල වගකීමද නා.සං.අ. වෙත පැවරී ඇත. මේ අතර අක්කර 168 ක විශාලත්වයකින් යුත් භූමි භාගයක කුඩා, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත 77 ක් ස්ථානගත කිරීම සඳහා පිහිටුවා ඇති සීතාවකපුර කර්මාන්ත උද්‍යාන ව්‍යාපෘතියෙහි ප්‍රධාන සම්බන්ධීකරණ ආයතනය ලෙසද නා.සං.අ. ක්‍රියා කරයි.

## ජල සම්පාදන හා සනීපාරක්ෂාව

ජනගහනයේ වර්ධනයත්, වාණිජ හා කාර්මික අංශයන්හි සීඝ්‍ර ප්‍රසාරණයත් නිසා, ක්‍රමවත් නල ජල සැපයුමක් සඳහා ඇති ඉල්ලුම සීඝ්‍රයෙන් වැඩි වේ. ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලයේ (ජා.ජ.ස.ජ.ම.) ජල නිෂ්පාදනය දනට වාර්ෂිකව සියයට 3 කින් පමණ වර්ධනය වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ 1996/97 පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව ජනගහනයෙන් සියයට 31 කට පමණ නල ජල පහසුකම් ඇත. නිවාස හා නාගරික සංවර්ධනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිකුත් කරන ලද වාර්තාවක සඳහන් පරිදි පිරිසිදු පානීය ජලය සඳහා වර්තමානයෙහි ඇති ඉල්ලුම සපුරාලීමට නම් ජල සම්පාදනය සඳහා කරනු ලබන වාර්ෂික ආයෝජනය තුන් ගුණයකින් පමණ වැඩි කළ යුතුය.

ජා.ජ.ස.ජ.ම. රට තුළ ජල සම්පාදන පහසුකම් සැලසුම් කිරීම, ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා වගකීම දරන ප්‍රධාන ආයතනය වේ. 1998 වසර තුළදී ජා.ජ.ස.ජ.ම. ජල සම්පාදන යෝජනා ක්‍රම 276 ක් නඩත්තු කළේය. 1998 දී ජා.ජ.ස.ජ.ම. විසින් සපයන ලද ජල ප්‍රමාණය ඝන මීටර් දශ ලක්ෂ 297 ක් වූ අතර එය පසුගිය වසර හා සසඳන විට සියයට 3 ක වැඩිවීමකි. විවරණයට ලක් වන වසර තුළදී ප්‍රධාන සහ සුළු ජල සම්පාදන යෝජනා ක්‍රම විශාල සංඛ්‍යාවක වැඩ නිම කල බැවින්, ජා.ජ.ස.ජ.ම. විසින් සපයනු ලැබූ ජල සම්බන්ධතා ප්‍රමාණය සියයට 11 කින් (47,694) වර්ධනය වී 438,384 ක් විය. මුළු නව ජල සම්බන්ධතා ප්‍රමාණයෙන් අඩක් පමණම ග්‍රාමීය අංශය වෙත සපයා ඇත.

වසර 2010 වනවිට සැමට පිරිසිදු පානීය ජලය සැපයීම රජයේ අරමුණ වී ඇත. 1998 අවසානය වනවිට මුළු ජනගහණයෙන් සියයට 66 කට පමණ පිරිසිදු පානීය ජල පහසුකම් (නල ජල පහසුකම්, නල ළිං, ආවරණය කල ළිං) ලබා ගත හැකිව තිබුණි. නාගරික ප්‍රදේශවල ජනගහණයෙන් සියයට 90 කට පමණ පිරිසිදු පානීය ජල පහසුකම් ඇති අතර ග්‍රාමීය ප්‍රදේශවල එය සියයට 57 ක් පමණ වේ. ග්‍රාමීය ජනතාවගේ සනීපාරක්ෂක තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ග්‍රාමීය අංශයේ ජල සම්පාදන පහසුකම් තවදුරටත් පුළුල් කළයුතු බව මින් අවධාරණය කරයි. නාගරික ජනගහනයේ වර්ධනය, ග්‍රාමීය අංශයේ ප්‍රමාණවත් නොවන ජල පහසුකම්, කාර්මික හා වාණිජමය ව්‍යාපාරයන් සීඝ්‍රයෙන් ප්‍රසාරණය වීම යන කරුණු රට තුළ ජල සම්පාදන පහසුකම් කඩිනමින් පුළුල් කිරීම සඳහා අදල බලධාරීන් වෙත බලපෑමක් ඇති කරයි. මෙම පරමාර්ථයෙන් ජා.ජ.ස.ජ.ම. විසින් 1998 වසර තුළදී ජල සම්පාදන කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 2,533 ක් ආයෝජනය කරනු ලැබිණ. මෙම ආයෝජන වලින් සියයට 58 ක් සහනදයී කොන්දේසි යටතේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය, ආසියානු සංවර්ධන බැංකුව (ආ.සං.බැ.) ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදල සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය වැනි විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබුණි. ජා.ජ.ස.ජ.ම. විසින් වසර තුළදී නිම කරන ලද ප්‍රධාන ජල සම්පාදන යෝජනා ක්‍රම වූයේ මාතර ජල සම්පාදන යෝජනා ක්‍රමය, නිලඹේ ජල සම්පාදන යෝජනා ක්‍රමය, කොළඹට නැගෙනහිරින් පිහිටි නගර සඳහා වන ජල සම්පාදන යෝජනා ක්‍රමය, උඩුනුවර/යටිනුවර ජල සම්පාදන යෝජනා ක්‍රමය, දුරණියගල ජල සම්පාදන යෝජනා ක්‍රමය, බලපිටිය - දෙමෝදර ජල සම්පාදන යෝජනා ක්‍රමය, උඩප්පුව ජල සම්පාදන යෝජනා ක්‍රමය සහ මරඳගහමුල ජල සම්පාදන යෝජනා ක්‍රමයයි. 1998 වසර තුළදී ආ.සං.බැ. මගින් මූල්‍ය ආධාර සපයන ලද දෙවන ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය මගින් බස්නාහිර හා මධ්‍යම පළාත්වල ජල සම්පාදන යෝජනා ක්‍රම 16 ක් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සිදු කරන ලදී. ග්‍රාමීය ප්‍රජාව සඳහා ජලය සැපයීමෙහිලා ස්වකීය ජල සම්පාදන යෝජනා ක්‍රම මෙහෙයවීම හා කළමනාකරණය කිරීමටද හැකි වන පරිදි පුද්ගලික අංශය, පළාත් පාලන ආයතන සහ ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීමේ අරමුණින් ආ.සං.බැ. විසින් මූල්‍ය ආධාර සපයන ලද තුන් වන ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියද ක්‍රියාත්මකව පැවතුණි. කළු ගඟෙන් ජලය ලබා ගැනීම මගින් කොළඹ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ජල සැපයුම් ධාරිතාව දිනකට ජල ඝන මීටර 6,000 කින් පමණ වැඩි කිරීම සඳහා වූ කළු ගඟ ව්‍යාපෘතියෙහි මූලික අධ්‍යයන කටයුතු කරගෙන යන ලදී. මේ අතර, ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් අරමුදල් සපයන ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය, උප ව්‍යාපෘති කිහිපයක් යටතේ එනම්, ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩසටහන, පාසැල් ජල සම්පාදන සහ සනීපාරක්ෂක වැඩසටහන, කුඩා නගර ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩසටහන 1998 වසර තුළදී ක්‍රියාත්මක විය. බදුල්ල, මාතර, රත්නපුර සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි ගම්මාන 2,800 ක හා කුඩා නගර 12 ක වෙසෙන 680,000 ක ජන කොටසකට ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

1998 දී ජා.ජ.ස.ජ.ම. යේ මුළු ආදායම සියයට 19 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 2,404 ක් විය. 1998 මාර්තු 01 දින සිට ජල ගාස්තු ප්‍රතිශෝධනය කිරීම මෙසේ ආදායම වැඩි වීමට ප්‍රධාන හේතුව විය. මෙම ගාස්තු ප්‍රතිශෝධනයේදී ගෘහස්ත පාරිභෝගිකයින් සඳහා වූ ජල ගාස්තු සියයට 20 - 39 දක්වා වූ ප්‍රමාණයකින් වැඩි විය. කාර්මික හා වාණිජ අංශ සඳහා වූ ජල ගාස්තු සියයට 9 ක් වැනි අඩු ප්‍රතිශතයකින් වැඩි වූ අතර සංචාරක/නිවාඩු නිකේතන අංශය සඳහා වූ ගාස්තු සියයට 10 කින් වැඩි විය. ජල ගාස්තු වැඩි කිරීමෙහි ප්‍රධාන අරමුණ වූයේ විදුලි බිල්පත් වැඩි වීම සහ සේවකයන්ගේ වැටුප් වැඩි වීම නිසා ඉහළ ගිය ජල නිෂ්පාදන වියදමෙහි කොටසක් පියවා ගැනීමයි. විවිධ අංශයන්හි ජල පාරිභෝගිකයින් අතර වූ හරස් සහනාධාර අඩු කිරීමද ජල ගාස්තු ප්‍රතිශෝධනයට හේතු විය. මෙයට අමතරව, ජනතාව ජලය පිරිමැසීම සඳහා පෙළඹවීම සහ ජලයට ආර්ථික වටිනාකමක් ලබා දීමෙන් ජල නාස්තිය අඩු කිරීමද ගාස්තු ප්‍රතිශෝධනයේ තවත් අදහසක් විය. ජල සම්පාදන අංශයේ අවධානයට ලක් විය යුතු තවත් විශේෂ කරුණක් වනුයේ, ප්‍රධාන වශයෙන් ජල කාන්දු වීම, නීති විරෝධී ජල පරිහරණය සහ පොදු ජල කරාම ආදී හේතූන් නිසා සියයට 42 ක් වැනි ඉහළ මට්ටමක පවතින ගිණුම් රහිත ජල පරිහරණයයි. බෙද හැරීමේ පද්ධතිය කාලීනව හා කාර්යක්ෂමව නඩත්තු කිරීම මගින් මෙම අපතේ යන ජල ප්‍රමාණය පිළිගත හැකි මට්ටමක් දක්වා අඩු කරගතහොත් ජා.ජ.ස.ජ.ම. යට සැළකිය යුතු ප්‍රතිලාභයක් ලබාගත හැකිය. නිශ්චිත වශයෙන් වෙන් කර දෙන ලද ප්‍රදේශයන්හි, විශේෂයෙන්ම ජලය බෙදා හැරීම, නඩත්තුව සහ ආදායම් එකතු කිරීම වැනි කටයුතු සඳහා පුද්ගලික අංශය යොදා ගැනීමෙන් මෙම අංශයේ කාර්යක්ෂමතාව වැඩි කරගත හැකිය.

1998 දී ජා.ජ.ස.ජ.ම. යේ මෙහෙයුම් හා නඩත්තු පිරිවැය සියයට 13 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 1,952 ක් විය. ඒ අනුව, ජා.ජ.ස.ජ.ම. යේ පොලී සහ බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය රුපියල් දශ ලක්ෂ 488 ක් වූ අතර එය 1997 දී රුපියල් දශ ලක්ෂ 316 ක් විය.

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල ලෙස මුදල් ආයෝජනය කරමින් දිස්ත්‍රික්ක සංවර්ධන වැඩසටහනක් වශයෙන් 1979 දී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (ඒ.ග්‍රා.ස.වැ) ආරම්භ කරන ලදී. මෙහි අරමුණ වූයේ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ ආර්ථික අවස්ථා පුළුල් කිරීම සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කරලීමයි. එමගින් දිස්ත්‍රික්ක අතර සහ දිස්ත්‍රික්කයන් තුළ පවතින විෂමතා අඩු කිරීම මගින් ප්‍රදේශ මූලික වූ සහ ප්‍රාදේශීය අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වන පරිදි සමබර වර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන ක්‍රමයෙන් සංවර්ධනය වූ අතර, 1989 සිට පෞද්ගලික අංශයේ සහභාගිත්වය සහ සහභාගිත්ව ප්‍රවේශය තවදුරටත් වැඩි දියුණු ලෙස පවත්වාගෙන යාමට අදහස් කරනු ලැබීය. 1997 පටන් ඒ.ග්‍රා.ස.වැ., සේවා නියුක්ති සහ ආදායම් උත්පාදන කටයුතු සඳහා වැඩි අවධානය යොමු කරමින් ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීමේ වැඩසටහනක් බවට නැඹුරු වීමක් පෙන්නුම් කළේය.

වර්තමානයේදී, ඒ.ග්‍රා.ස.වැ., දිස්ත්‍රික්ක 15 ක් ආවරණය වන පරිදි ව්‍යාපෘති 19 කින් සමන්විත වේ. මෙම වැඩසටහන යටතේ 1997 තුළදී රුපියල් දශ ලක්ෂ 1,375 ක් වූ මුළු වියදමට සාපේක්ෂව 1998 තුළදී එය රුපියල් දශ ලක්ෂ 1,508 ක් විය. ඌව පළාතේ සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ පුනරුත්ථාපන සංවර්ධනය සඳහා වන ප්‍රදේශ පාදක තුලිත වර්ධන වැඩසටහන 1998 දී ආරම්භ කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ අරමුදල් සපයන ලද මෙම වැඩසටහන වර්ෂ 5 ක් සඳහා ව්‍යාපෘති පිරිවැය රුපියල් දශ ලක්ෂ 328 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මෙම වැඩසටහන, ජාතික සහ පළාත් වශයෙන් වන උපාංග වලින් සමන්විත වේ. මෙම වැඩසටහන යටතේ, රුපියල් දශලක්ෂ 3 ක මුදලක් 1998 දී වියදම් කර ඇත. මඩකලපුව දිස්ත්‍රික්කයේ පුනරුත්ථාපන සහ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා නෝරාඩ් ආයතනය මගින් අරමුදල් සපයනු ලැබේ. වර්ෂ 6 ක කාලයක් පුරා මෙම වැඩසටහන යටතේ රුපියල් දශ ලක්ෂ 520 ක ආයෝජනයක් කිරීමට අපේක්ෂිතය. වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 53 ක මුදලක් මෙම වැඩසටහන යටතේ වියදම් කර ඇත.

දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය 1998 දී සිය ක්‍රියාත්මක වීමේ අටවන වර්ෂය සම්පූර්ණ කළේය. මෙම වැඩසටහන යටතේ රුපියල් දශ ලක්ෂ 531 ක් වර්ෂය තුළදී වියදම් කල අතර, එම මුදල වර්ෂය තුළදී ඒ.ග්‍රා.ස.වැ වැය කළ මුළු වියදමින් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් විය.

ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සපයන ලද උතුරුමැද පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දරන ලද මුළු වියදම රුපියල් දශ ලක්ෂ 238 ක් විය.

## සමෘද්ධි වැඩසටහන

නිදහස ලැබූ තැන් සිට ශ්‍රී ලංකාවේ කලින් කලට බලයට පත් වූ රජයන් විසින් දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ද්‍රව්‍යමය වශයෙන් හා මූල්‍යමය වශයෙන් ආධාර ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේ. 1995 දී සමෘද්ධි වැඩසටහන හඳුන්වා දෙනු ලැබුවේ අඩු වරප්‍රසාදලාභී පිරිසගේ ආර්ථික හා සාමාජික තත්ත්වය නගා සිටුවීම සඳහා මෙන්ම ඔවුන්ගේ රැකියා විරහිත භාවය පිළිබඳ ප්‍රශ්නවලට පිළියම් යෙදීම සඳහාත් වඩා අර්ථාන්විත ආකාරයෙන් ආධාර සැපයීම තුළින් ඔවුන්ගේ ප්‍රශ්න අවම කරලීම සඳහාත්ය. ඒ අනුව, මෙතෙක් වෙනත් වෙනත් ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද සමාජ ප්‍රතිලාභ යෝජනා ක්‍රම සියල්ලම පාහේ මෙම සමෘද්ධි වැඩසටහන යටතට ගෙන එන ලදී. 1998 අවසානය වනවිට, සමෘද්ධි වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලද මුළු පවුල් සංඛ්‍යාව 1,973,183 ක් වූ

අතර එය 1997 වර්ෂය සමඟ සසඳනවිට ආන්තික අඩු වීමක් පෙන්නුම් කරයි. මෙම අඩු වීම, 1998 දී ක්‍රියාත්මක කරන ලද නව ප්‍රවේශයන් සීමා කිරීම සහ හිමිකම් නොමැති පවුල් ඉවත් කිරීම තුළින් මුළු සමෘද්ධිලාභීන් සංඛ්‍යාව තාත්වික මට්ටමකට ගෙන ඒම සඳහා වූ ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් විය. මුළු පවුල් සංඛ්‍යාවෙන් අඩු ආදායම්ලාභී පවුල් සංඛ්‍යාව සියයට 30-40 ත් අතර විය යුතු බවට ඇස්තමේන්තු කර ඇති හෙයින් මෙම අඩු වීම තුළ වුවද සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව තවමත් සියයට 51 ක් වශයෙන් පවතී. මෙම තත්ත්වය, සත්‍ය වශයෙන්ම ප්‍රතිලාභ සඳහා සුදුසු පුද්ගල කණ්ඩායම් වඩා යහපත් ප්‍රතිලාභ ලැබීමට බාධකයක් වීම මගින් මුළු වැඩසටහනටම අහිතකර බලපෑම් ඇති වී තිබේ. මෙසේ හෙයින්, ප්‍රතිලාභ සඳහා සුදුස්සන් වඩාත් යහපත් ලෙස ඉලක්ක කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.

පසුගිය සිව් වසර ඇතුළතදී සමෘද්ධි වැඩසටහන පුළුල් කාර්යයන් පෙළක් ඉටු කරන දිළිඳුකම පිටු දැකීමේ අති විශාල වැඩසටහනක් ලෙස වර්ධනය වී ඇත. වර්තමානයේදී එය සරල ආදායම් සංක්‍රාම ක්‍රමයක සිට බැංකු කටයුතු, රක්ෂණය, ඉතිරි කිරීම්, පුහුණු කිරීම්, යටිතල පහසුකම් සංවර්ධනය හා ස්වයං රැකියා යනාදිය ඇතුළත් වඩාත් පෘථුල වැඩසටහනක් බවට පත් වී ඇත. සමෘද්ධි වැඩසටහනෙහි ආයතනමය ව්‍යුහය ද ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරීම, විමර්ශනය කිරීම හා ප්‍රතිචාරය මැන බැලීමට උපකාර වන පරිදි සකස් කර තිබේ. සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය, සමෘද්ධි වැඩසටහන පිළිබඳ වූ ප්‍රතිපත්ති සැකසීම කෙරෙහි මූලික වශයෙන් වගකීම දරයි. තවත් ආයතන තුනක් එනම් දිළිඳු සහන දෙපාර්තමේන්තුව (දි.ස.දෙ.), ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය (ශ්‍රී.ලං.ස.අ.) සහ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව (ස.කො.ජ.දෙ.) සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ සමෘද්ධි වැඩසටහන ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුළ ඇති දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ පවතින ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාල, සමෘද්ධි වැඩසටහනෙහි දෙවන හා තෙවන මට්ටමේ ශාඛා ලෙස ක්‍රියාත්මක වේ. සමෘද්ධි කලාප කළමනාකරුවන් යටතේ ක්‍රියාත්මක වන සමෘද්ධි කලාප කාර්යාල, සංවිධාන ව්‍යුහයෙහි හතර වන මට්ටම වේ. ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වන සමෘද්ධි බලකායන් පස් වන මට්ටම ලෙස ක්‍රියා කරයි.

දි.ස.දෙ. අඩු ආදායම්ලාභීන් හඳුනා ගැනීම හා සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, විශේෂ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අවතැන් වූ පවුල් සඳහා වියළි සළාක පත්‍රිකා බෙද දීම යනාදිය කෙරෙහි වගකීම උසුලයි. දි.ස.දෙ. විසින් උතුරු නැගෙනහිර පළාතෙහි වැඩසටහන ක්‍රියාත්මක වන එකම ප්‍රදේශය වන වවුනියා දකුණු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුළුව අනෙකුත් සියළුම දිස්ත්‍රික්කවල සමෘද්ධි සහනාධාර වැඩසටහන (ස.ස.වැ.) ක්‍රියාත්මක කරයි. 1998 දී ස.ස.වැ. හි මුළු පිරිවැය රුපියල් දශ ලක්ෂ 7963 ක් වූ අතර එය 1997 හා සසඳනවිට සියයට 3 පහත වැටීමකි. මෙම සහනාධාර වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබන්නාවූ ඉතා දිළිඳු පවුල් ලෙස සලකන සියයට එකක් පමණ වන සහනාධාර ලාභීන් සඳහා මසකට රු. 1,000/- ක දීමනාවක් පිරිනැමෙන අතර, සියයට 45 කට පමණ එනම් පවුල් 896,783 ක් සඳහා මසකට රු. 500/- බැගින් ලබා දෙන ලදී. මීට අමතරව, තවත් පවුල් 323,710 කට මසකට රු. 200/- බැගින්ද, පවුල් 216,445 කට මසකට රු. 100/- බැගින්ද පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව ලබා දෙන ලදී. මේ අතර, කලින් ජනසවිය හිමිකම් ලැබූවන්ද ඇතුළුව පවුල් 521,886 කට මසකට රු. 250/- ක දීමනාවක් පිරිනමනු ලැබීය. දි.ස.දෙ. අවතැන් වූ පවුල් සඳහා අඛණ්ඩව වියළි සලාක පත්‍රිකා බෙද හැරීම රුපියල් දශ ලක්ෂ 1265 ක වියදමකින් සිදු කළ අතර රුපියල් දශ ලක්ෂ 75 ක් වටිනා පෝෂණ පත්‍රිකා 78,430 ක්, පෝෂණ දීමනා වැඩසටහන යටතේ බෙද හරින ලදී.

ස.කො.ජ.දෙ. මානව සම්පත් සංවර්ධනය හා ආයතනික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් සමෘද්ධි වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමත් සඳහා මූලික වශයෙන් වගකීම දරයි. මීට අමතරව, සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම, පවුල් පදනම් කරගත් ආර්ථික, සමාජ හා සංස්කෘතික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම සමෘද්ධි වැඩසටහන සැළසුම් කිරීම, මෙහෙයුම හා ඇගයීම ආදියද ස.කො.ජ.දෙ. වගකීම් තුළට ඇතුළත් වේ. 1998 අවසාන වනවිට, ග්‍රාමීය මට්ටමින් සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාම නිලධාරී කොට්ඨාශ 13,560 ක් සඳහා සමෘද්ධි නියාමකයින් 21,257 ක් පත් කරනු ලැබ තිබිනි. මෙයට ස්ථිර සමෘද්ධි නියාමකයින් 6,667 දෙනෙක්ද, ස්ථිර ගොවි නියාමකයින් 841 දෙනෙක්ද ඇතුළත් වේ. ස.කො.ජ.දෙ. විසින් සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ක්‍රියාත්මක කිරීමේ කටයුතුද අඛණ්ඩව කරගෙන යන ලදී. මෙම අරමුදලෙහි අරමුණ වනුයේ සමෘද්ධිලාභීන්ට මුහුණ දීමට සිදු වන හදිසි සමාජයීය ප්‍රශ්න සඳහා වන වියදම් පියවා ගැනීමට උපකාර කිරීමයි. 1998 දී හිමිකම් පෑම් 80,675 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 212 ක මුදලක් ගෙවා ඇත. 1998 දී අළුතින් අරඹන ලද සමෘද්ධි ජනතා ව්‍යාපෘති වැඩසටහන යටතේ ව්‍යාපෘති 1,536 ක් අනුමත කර ඇති අතර 1998 අවසානය වනවිට මේ සඳහා වූ වියදම රුපියල් දශ ලක්ෂ 199 ක් විය. මෙම ව්‍යාපෘතියෙහි ඉලක්කය වනුයේ කෘෂි නිෂ්පාදනය හා දිළිඳු පුද්ගලයන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා අදළ ප්‍රදේශවල වාරිමාර්ග පහසුකම් වැඩි දියුණු කිරීම මගින් කෘෂිකාර්මික අංශයේ රැකියා අවස්ථා ජනිත කිරීමයි.

ශ්‍රී.ලං.ස.අ. හි කටයුතු අතරට ප්‍රධාන වශයෙන් සමාජ සංවිධාන කටයුතු හා මිනිස් සම්පත් සංවර්ධනය කිරීම ඇතුළත් වේ. මීට අනුරූපව, අනිවාර්ය ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමය හා ස්වේච්ඡා ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමය යන සමෘද්ධි සහනාධාරලාභීන් සඳහා වූ ඉතිරි කිරීමේ යෝජනා ක්‍රම දෙකෙහි කටයුතුද අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. රු. 1,000/- සහ රු. 500/- බැගින් මාසිකව ලබන ප්‍රතිලාභ හිමියන් පිළිවෙලින් මාසිකව රු. 200/- සහ රු. 100/- බැගින් අනිවාර්ය ඉතිරි කිරීමේ ක්‍රමය යටතේ ඉතිරි කළයුතුය.

1998 අවසාන වනවිට මෙම ක්‍රමය යටතේ මුළු ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,818 දක්වා සියයට 40 කින් වර්ධනය විය. අනෙක් අතට ඉතා පහළම මට්ටමින් කුඩා කණ්ඩායම් හරහා සමෘද්ධි සහනාධාරලාභීන් ඉතිරි කිරීම කෙරෙහි උනන්දු කරවීම ස්වේච්ඡා ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමයෙන් අපේක්ෂිතය. 1998 අවසානය වනවිට ස්වේච්ඡා ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 407 ක මුදලක් ඉතිරි කර තිබිණි.

ග්‍රාමීය ප්‍රජා ව්‍යාපෘති වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී කණ්ඩායම් සඳහා කුඩා පරිමාණයේ ග්‍රාමීය යටිතල පහසුකම් සැපයීම 1998 දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙම ක්‍රමය යටතේ 1998 දී ව්‍යාපෘති 6,045 ක් රුපියල් දශ ලක්ෂ 350 ක වියදමින් නිම කරන ලදී. මීට අමතරව 1998 දී හඳුන්වා දෙන ලද සුළු කර්මාන්ත සංවර්ධන වැඩසටහන (සු.ක.ස.වැ.) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 8 ක් දක්වා ව්‍යාප්ත කර ඇත. මෙම සු.ක.ස..වැ. යටතේ සමෘද්ධිලාභී පවුල්වල ආදායම් මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් කුඩා කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන අරමුදල් හා වෙළඳපල පහසුකම් සපයා දෙන ලදී. 1998 සැප්තැම්බර් අවසාන වනවිට පුද්ගලයින් 311 ක් පමණ මේ යටතේ සුළු කර්මාන්තවල නියැලී සිටි අතර රුපියල් දශ ලක්ෂ 8 ක මුදලක් ණය වශයෙන් සපයා දී තිබිණි.

සමෘද්ධි බැංකු සංගම් (ස.බැ.ස.) ශ්‍රී.ලං.ස.අ. යටතේ තවදුරටත් කටයුතු කරගෙන යන ලදී. මෙම ස.බැ.ස. වලින් බලාපොරොත්තු වන්නේ බැංකු කටයුතු පිළිබඳව දිළිඳු ජනතාව දැනුවත් කිරීම, ඔවුන් අතර ඉතිරි කිරීම් වැඩි දියුණු කිරීමට අනුබල දීම, ආයෝජන වර්ධනය කිරීම තුළින් ආදායම් මට්ටම ඉහළ නැංවීම හා අවශ්‍ය සහය සේවා ලබා දීම තුළින් නිෂ්පාදන ධාරිතාවය ශක්තිමත් කිරීමත්ය. 1998 අවසාන වනවිට ස.බැ.ස. 517 ක් පිහිටුවා තිබූ අතර සාමාජික සංඛ්‍යාව 639,106 ක් විය. 1998 අවසානයේදී තැන්පතු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 457 ක් විය. ස.බැ.ස. සාමාජිකයින් 68,300 ක් වෙත කෘෂිකාර්මික, ධීවර ආදී අංශවල ව්‍යාපෘති පවත්වාගෙන යෑම සඳහා රුපියල් දශ ලක්ෂ 237 ක් වන ණය පහසුකම් සපයා දෙන ලදී. තැන්පතු ඉහළ යෑම හා සමෘද්ධිලාභීන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය හේතුකොටගෙන ස.බැ.ස. ඉතා ආකර්ශනීය ලෙස වර්ධනය වී ඇත. මෙම සතුටුදායක ක්‍රියාකාරිත්වය උද කර ගැනීම සඳහා රජය විසින් විශේෂයෙන් යටිතල පහසුකම් ලබා දීම ආදිය මඟින් සපයන ලද ආධාරය විශාල වශයෙන් ඉවහල් විය. යම් හෙයකින් මෙම පහසුකම් ඉවත් කිරීමක් සිදු වුවහොත් මෙම වැඩසටහන බිඳ වැටීමකට භාජනය විය හැකි බැවින්, මෙම ස.බැ.ස. ශක්තිමත් කර ගැනීම සඳහා සමෘද්ධිලාභීන් තමන් විසින්ම මෙම පහසුකම් අත් කර ගැනීම අවශ්‍ය වන්නේය. මීට අමතරව, මූල්‍ය කළමනාකරණයෙහි අක්‍රමිකතා සිදු වීම වැළැක්වීම සඳහා ප්‍රමාණවත් විගණන, මෙහෙයුම් හා ඇගයීම් ක්‍රම ක්‍රියාත්මක කළ යුතුය.

මේ අතර, සමෘද්ධිලාභීන් හට නව ආදායම් මාර්ග ආරම්භ කිරීමෙන් හා දැනට පවත්නා ආදායම් ඉපයීමේ කටයුතු වර්ධනය කර ගැනීම සඳහාත් ආධාර කිරීමේ අරමුණින් සමෘද්ධි සංවර්ධන ණය යෝජනා ක්‍රමය (සසණ) ශ්‍රී.ලං.ස.අ. විසින් ක්‍රියාත්මක කරමින් පවතියි. 1998 සැප්තැම්බර් අවසානය වනවිට සමෘද්ධිලාභී පවුල්වල ණය ගැනුම්කරුවන් 76,270 දෙනෙකුට රුපියල් දශ ලක්ෂ 449 ක් සපයා ඇත. මෙම ණය මුදල් සියයට 10 ක සහනදායී පොලී අනුපාතයකින් යුක්ත වන අතර වසර 2 ක උපරිම ආපසු ගෙවීමේ කාලයකින් සමන්විත වේ. ලංකා බැංකුවේ හා මහජන බැංකුවේ සහභාගිත්වය ඇතිව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය (ස.ව්‍ය.ණ.) ක්‍රමයද ක්‍රියාත්මක කරන ලදී. මෙහි අරමුණ වනුයේ සමෘද්ධිලාභීන් වෙත ස්වයං රැකියා ව්‍යාපෘති ඇති කිරීම සඳහා සහ ව්‍යාපාර හැකියාව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට උපකාර කිරීමයි. මෙම වැඩසටහන යටතේ, 1998 අගෝස්තු මාසය අවසන් වනවිට ලංකා බැංකුව හා මහජන බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 6 ක ණය මුදල් සපයා දී තිබිණි. මෙම ස.ව්‍ය.ණ. ක්‍රමය යටතේ වන උපරිම ණය මුදල රු. 50,000 ක් වන අතර පොලී අනුපාතය සියයට 10 කි. උපයන ලද ආදායම් ප්‍රමාණය මත වසර තුනක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

1998 වර්ෂය තුළදී සමෘද්ධි සහනාධාර වැඩපිළිවෙල සඳහා වූ වියදම රුපියල් දශ ලක්ෂ 7,963 ක් විය. මීට අමතරව, රුපියල් දශ ලක්ෂ 420 ක් සමෘද්ධි නියාමකයින් වෙත වැටුප් ගෙවීම සඳහා වියදම් වූ අතර 1998 දී මෙම වැඩසටහනෙහි ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 780 ක් විය.

## 5.9 පරිසරය

ප්‍රතිපත්ති සම්පාදනයේදී සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, ආර්ථික වර්ධනය, සේවානියුක්තිය, මිල මට්ටම් වැනි සාර්ව ආර්ථික විචල්‍යයන් සහ පරිසරය අතර ඇති වැදගත් සම්බන්ධතාවය පිළිබඳව දක්වන සැලකිල්ල මෑතකාලීනව ඉහළ ගොස් ඇත. සාමාන්‍යයෙන්, අඩු ආදායම් මට්ටම්වලදී පුද්ගලයන් පරිසරයේ ගුණාත්මකභාවයට වඩා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය අගය කරනු ලබන තත්ත්වයක් දක්නට ලැබුණද, ශ්‍රී ලංකාව, සාපේක්ෂ වශයෙන් අඩු ආදායම් මට්ටමකදී පවා, සිය ස්වභාවික සම්පත් පදනම කළමනාකරණය කිරීම සහ පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ශක්තිමත් නීතිමය සහ ආයතනිකමය රාමුවක් ස්ථාපිත කිරීමට සමත් වී ඇත. 1980 දී ජාතික පරිසර පණත සම්මත කරනු ලැබූ අතර, ඉන්පසු 1981 දී පරිසරය කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවනු ලැබීය. තවද, ජාතික මට්ටමින් පාරිසරික කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ තිරසාර සංවර්ධනයක් ළඟාකර ගැනීම පිණිස ජාතික පාරිසරික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා පරිසර අමාත්‍යාංශයක්ද, 1990 දී පිහිටුවනු ලැබීය. මේ අනුව, පරිසර අමාත්‍යාංශය

විසින් ජාතික පරිසර ක්‍රියාත්මක සැලැස්මක් 1994 දී පිළියෙල කළ අතර, එමගින් ඉඩම් හා ජලය, වන හා ජෛවීය-විවිධත්වය, මුහුදු වෙරළ සහ සාගර සම්පත්, කර්මාන්ත හා නාගරික ඝන අපද්‍රව්‍ය සහ බලශක්තිය හා කැනීම් කටයුතු හා සම්බන්ධ පාරිසරික ගැටළු හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හඳුනාගැනීම අපේක්ෂා කෙරිණි. මෙම ක්‍රියාත්මක සැලැස්ම 1998 දී යාවත්කාලීන කරනු ලැබිණි. දැනට නාගරික ඝන අපද්‍රව්‍ය එකතු කිරීම සහ අපහරණය, නාගරික වායු දූෂණය, වන විනාශය සහ ජල දූෂණය බැරෑරුම් පාරිසරික ගැටළු වශයෙන් පවත්නා අතර ඒ සම්බන්ධව දැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍යව පවතී.

පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා 1998 දී වන සම්පත් සහ පරිසර අමාත්‍යංශය විසින් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. අමාත්‍යාංශය විසින් අදාළ පාර්ශවකරුවන්ගේ උපදෙස් සහිතව ජාතික පරිසර ක්‍රියාත්මක සැලැස්ම යාවත්කාලීන කරනු ලැබූ අතර, ඒ සමග නිර්දේශ ගණනාවක්ද ඉදිරිපත් කරන ලදී. විවිධ පාරිසරික ගැටළු විශ්ලේෂණය කිරීම සහ වඩාත් විශේෂිත වූ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන කිහිපයක් ද ආරම්භ කරනු ලැබීය. ජාතික පරිසර ක්‍රියාත්මක සැලැස්මෙන් සහ ප්‍රතිපත්ති අධ්‍යයන වලින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ තවදුරටත් විමර්ශනය කිරීම සඳහා පරිසරය සහ පරිසර ප්‍රතිපත්ති කළමනාකරණ කමිටු 8 ක් පිහිටුවනු ලැබීය. මෙම කමිටු, පරිසරය සහ සංවර්ධන ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීමේ කමිටුවට වාර්තා කළයුතුය. එමෙන්ම, ගෝලීයකරණය සහ වෙනත් ජාත්‍යන්තර සහ කලාපීය බැඳීම් හා ගිවිසුම් නිසා ඇතිවන පාරිසරික බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීමටද අමාත්‍යංශය පියවර ගෙන ඇත.

අදළ බලධාරීන්ගේ සහයෝගය ඇතිව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ජාතික ක්‍රමෝපායක් කෙටුම්පත් කිරීමටද අමාත්‍යාංශය පියවර ගෙන ඇත. ප්‍රාදේශීය මට්ටමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ක්‍රමෝපායක් සැලසුම් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් පළාත්පාලන ආයතනවලට සහාය වීමද අඛණ්ඩව සිදු කරන ලදී. එමෙන්ම, වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය මහරගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ජීව-වායු නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමටද මූලික පියවර ගනිමින් සිටියේය. මීට අමතරව, ජාත්‍යන්තර දේශ සීමා හරහා පීඩාකාරී අපද්‍රව්‍ය ප්‍රවාහනය හා අපහරණය පාලනය කිරීම සම්බන්ධව ඇතිකර ගෙන ඇති බැසල් සම්මුතිය සහ ඕසෝන් වායු ස්ථරය තුනීවීමට බලපාන රසායන ද්‍රව්‍ය, කර්මාන්ත සහ වෙළෙඳ අංශවල භාවිතා කිරීම වැළැක්වීමේ අරමුණින් ඇතිකර ගෙන ඇති මොන්ට්‍රියල් සන්ධානය ක්‍රියාත්මක කිරීමෙහිද අමාත්‍යාංශය නිරත විය.

මේ අතර, විමර්ශනයට ලක්වන වර්ෂය තුළදී, මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික බලපෑම පිළිබඳ තක්සේරු කිරීම් 32 ක් සිදුකළ අතර ඉන් 11 ක් අනුමත කරන ලදී. එමෙන්ම ආරම්භක පාරිසරික ඇගයීම් ද 32 ක් සිදුකළ අතර ඉන් 7 ක් අනුමත කරනු ලැබිණි. ආරම්භක පාරිසරික ඇගයීම් කඩිනම් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය ජාතික පරිසර පණත සඳහා සංශෝධන ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. මෙම සංශෝධනවලදී, ආරම්භක පරිසර ඇගයීම් වාර්තා පිළිබඳ මහජන අදහස් ලබාගැනීමට වෙන්කර ඇති දින 30 ක කාලසීමාව ඉවත් කිරීමට අපේක්ෂිතය. කෙසේ වුවද, මහජන අදහස් සඳහා ලබාදී ඇති කාලසීමාව සම්පූර්ණයෙන් ඉවත් කිරීම වෙනුවට, එය අඩුකිරීම වඩාත් උචිත වන අතර එමගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ විනිවිදභාවය තහවුරු කරනු ඇත. මේ අතර, මධ්‍යම පරිසර අධිකාරිය විසින් 1998 දී නව පරිසර සංරක්ෂණ බලපත්‍ර 194 ක් නිකුත් කළ අතර, බලපත්‍ර 370 ක් නැවත දීර්ඝ කරන ලදී. පසුගිය වර්ෂයේදී නව බලපත්‍ර 163 ක් නිකුත් කළ අතර බලපත්‍ර 309 ක් නැවත දීර්ඝ කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරිය කර්මාන්ත වලින් පිටවන අපද්‍රව්‍ය, ශබ්ද සහ වායු පිළිබඳ අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කළේය. 1997 දී විශ්ලේෂණය කළ කාර්මික අපද්‍රව්‍ය නියැදි 219 සමග සැසඳීමේදී, 1998 කාර්මික අපද්‍රව්‍ය නියැදි 354 ක් විශ්ලේෂණය කළේය. තවද, 1998 දී මධ්‍යම පරිසර අධිකාරිය විසින් සීතාවක කාර්මික ජනපදය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, කෙරවලපිටිය ප්‍රදේශයේ ඉදිකෙරෙන එල්.පී.ගෑස් ගබඩා සංකීර්ණය, කුකුලේගඟ ජලවිදුලි ව්‍යාපෘතිය සහ අළුපොත කසළ දමා ඉඩම් ගොඩ කිරීමේ ව්‍යාපෘතිය අධීක්ෂණය කරනු ලැබීය. අධිකාරිය විසින් වායු දූෂණය සහ රටේ ප්‍රධාන ජලාශ්‍ර පරීක්ෂා කිරීමේ කටයුතුද අඛණ්ඩව සිදු කරන ලදී. මේ අතර, 1998 දී මධ්‍යම පරිසර අධිකාරියට, පරිසරය හා සම්බන්ධ ගැටළු පිළිබඳ මහජන පැමිණිලි 1,221 ක් ලැබුණි. මෙයින් පැමිණිලි 461 ක් සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය විසින් අවශ්‍ය පියවර ගනු ලැබූ අතර ඉතිරි පැමිණිලි අදළ වෙනත් ආයතන සහ පළාත් පාලන ආයතනවලට යොමු කරනු ලැබිණි. තවද, මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර සංරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සහ කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා යෝග්‍ය ස්ථාන හඳුනාගැනීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවල නිලධාරීන් 100 ක් පමණ පුහුණු කරන ලදී. එමෙන්ම, විශේෂයෙන්ම පාසැල් ළමුන් අතර, පාරිසරික අවබෝධය වැඩිකිරීම, ආකල්ප වෙනස් කිරීම සහ පාරිසරික කුසලතාවයන් ඔප් නැංවීම සඳහාත්, මධ්‍යම පරිසර අධිකාරිය විවිධ වැඩසටහන් මෙහෙයවීය.